# සිංසෙදු

# රංග කලාව

## ඉගෙනුම් අත්පොත



# සිංසිදු
# රංග කලාව
## ඉගෙනුම් අත්පොත

ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍ය සංසදය (SDJF)

**විශේෂඥ සමාලෝචන කමිටුව**
වරුණ අලහකෝන්
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, සෞන්දර්ය අධ්‍යාපන ඒකකය, අධ්‍යාපන අමාත්‍යාංශය
ආචාර්ය සෞම්‍ය ලියනගේ
පීඨාධිපති, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
ආචාර්ය කේ. රදිදරන්
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ලලිත කලා අංශය, ශාස්ත්‍ර පීඨය, යාපනය විශ්වවිද්‍යාලය
මහාචාර්ය එම්.එස්.එම්. අනීස්
දර්ශන අංශය, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ආචාර්ය කේ. නවදර්ශනී
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ලලිත කලා අංශය, ශාස්ත්‍ර පීඨය, යාපනය විශ්වවිද්‍යාලය

**වැඩසටහන් අධීක්ෂණය**
මහාචාර්ය පද්මසිරි වනිගසුන්දර
සභාපති, ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍ය සංසදය
ආචාර්ය එස්. රගුරාම්
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍ය සංසදය

**කර්තෘ**
එම්.සී. රස්මින්
**සම කර්තෘ**
රම්සි සයිනුඩීන්

**හවුල්කරුවෝ**
ජාතික සහජීවන සංවාද සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය
උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය
උතුරුමැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය
මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය
නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය
උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
උතුරුමැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
නැගෙනහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
යාපනය විශ්වවිද්‍යාලය
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා කලා මණ්ඩලයː නාට්‍ය අනුමණ්ඩලය

**සහයෝගය**
එක්සත් ජනපද තානාපති කාර්යාලය - කොළඹ
දේශීය වැඩසටහන් සඳහා කැනඩා අරමුදල (CFLI)
නීලන් තිරුචෙල්වම් පදනම

**සිංහල පරිවර්තනයː** අජිත් පැරකුම් ජයසිංහ

**සංස්කරණ සහය**
මහාචාර්ය අභය බාලසූරිය
කෞෂල්‍යා ආරියරත්න
රුවන් බෝගමුව

**කවරය හා පිටු සැලසුමː** මොහොමඩ් අස්වර්
**ISBN9-789-557-765-10-5**
Copyrights: ©Sri Lanka Development Journalist Forum (SDJF), 2018

## ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍ය සංසදය (SDJF)

ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍ය සංසදය යනු සක්‍රිය ප්‍රජාතන්ත්‍රවාදයක් හා ප්‍රකාශනයේ නිදහසක් ඇති කිරීම වෙනුවෙන් පෙනී සිටින ජාතික මට්ටමේ සංවිධානයකි. එහිදි සමාජය විසින් ආන්තික කරන ලද ප්‍රජාවන්ගේ හඬට විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. ඒ වෙනුවෙන් යොදාගැනෙන මූලෝපායික ක්‍රමවේදය වන්නේ නව නිර්මාණාත්මක මාධ්‍ය මෙවලම් භාවිතයයි. එහිදී  ප්‍රජා මාධ්‍ය ශක්තිමත් කිරීම, සමාජය විසින් ආන්තික කරනු ලැබූවන්ගේ හඬ ඉස්මතු කර දීම, ආන්තික කරන ලද ප්‍රජාවන්ගේ හැකියා සංවර්ධනය, තොරතුරු වෙත ප්‍රවේශය සඳහා ඇති බාධා ඉවත් කිරීම සහ විවෘත භාවයේ සංස්කෘතිය ස්ථාපනය ප්‍රධාන ක්‍රමවේද ලෙස භාවිත වේ. **www.ldjf.org**

## වැදගත් මං සලකුණකි

ද්විතීයික පාසල් සිසුන්ට, විශ්වවිද්‍යාල සිසුන්ට, තරුණ සංසද කලාකරුවන්ට සහ සුබවාදී වෙනස්කම් ඇති කිරීම සඳහා සංසද රංග (Forum Theatre) කලාව යොදා ගැනීම සම්බන්ධයෙන් අනුරාගී සියලු දෙනාට වැදගත් ඉගෙනුම් අත්පොතක් සම්පාදනය කිරීම පිණිස ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍ය සංසදයේ කණ්ඩායම සහ එහි හවුල්කරුවන් සමග කටයුතු කිරීමට ලැබීම ඉමහත් සතුටකි. මෙම අත්පොත සම්පාදනය කිරීම කාලීන වශයෙන් වැදගත් කාර්යයකි. එමගින් ශ්‍රී ලංකාවේ දිගු කාලීන ඉගෙනුම් පරතරයක් පියැවේ.

සංසද රංගන සංකල්පය යනු ඉතා ආකර්ශනීය, නම්‍යශීලී හා ඉතා ජනප්‍රිය ක්‍රමවේදයකි. එබැවින් එය ශ්‍රී ලංකාවේ විවිධ තරුණ කණ්ඩායම් විසින් වැඩි වැඩියෙන් භාවිතා කරනු දැකිය හැකි ය.

එය තරුණ ප්‍රජාව වෙත රැගෙන යාම වෙනුවෙන් කටයුතු කරන පුද්ගලයන් හා සංවිධාන ගණනාවක ලාංකේය භූමිය තුළ හඳුනාගත හැකි ය. ජනකරළිය ජංගම රංගයේ නිර්මාතෘ පරාක්‍රම නිරිඇල්ල සංසද රංග කලාව ජනතාව අතරට ගෙන යාම සඳහා කැපී පෙනෙන භූමිකාවක් ඉටු කළ අයෙකු වන අතර Act4, British Council, Sri Lanka Unites, Care International, Family Rehabilitation Centre, Women in Need සහ තවත් සංවිධාන ගණනාවක්ම සංසද රංග කලාව සමග සහසම්බන්ධ ය. අවාසනාවකට මෙන්, සංසදරංග කලාව හැදෑරීමට කැමති අංකුර කලාකරුවන්ට හා ශිෂ්‍ය ප්‍රජාවට ප්‍රමාණවත් තරම් ඉගෙනුම් ආධාරක සහ සම්පත් සිංහල හා දෙමළ භාෂාවලින් නැත.

මෙම අත්පොත සලකුණු කරන්නේ එවැන්නක් සඳහා වන පළමු උත්සාහයයි. එබැවින්, එය තව දුරටත් සංවර්ධනය කිරීම සඳහා ඉඩක් තිබේ. මෙම ඉගෙනුම් අත්පොත විසින් තරුණ ජනයාට සංසද රංග කලා කුසලතා හැදෑරීමට පමණක් නොව, එය ක්‍රියාකාරී ලෙස භාවිතා කරන්නට ද, සක්‍රිය අවිහිංසා සංස්කෘතියක් ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීමට ද අවකාශය විවෘත කර දෙන බව මට විශ්වාස ය.

සංවාද ඇති කිරීමට කැමති හා බහුත්වවාදී වටිනාකම් ප්‍රවර්ධනය කිරීමට කැමති තරුණ ප්‍රජාවට මෙය අත්පොතක් ලෙස ගිනිය හැකි ය. මෙම අත්පොත පාසල් සිසුන්ට, නාට්‍ය විෂයක් ලෙස හදාරන සිසුන්ට, තරුණ සංසද රංගන ශිල්පීන්ට, නාට්‍ය කණ්ඩායම්වලට සහ නාට්‍ය ගුරුවරුන්ට වැදගත් ඉගෙනුම් මූලාශ්‍රයක් වනු ඇතැයි ද මම විශ්වාස කරමි.

*සමාජයේ සිදු වන වෙනස්කම් අනුව, තරුණ ජනයා බහුත්වවාදී හා ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් විවිධ ස්වරූපවල කලා හා සංස්කෘතික ක්‍රියාකාරකම් අත්හදා බලති. මෑත වකවානුවේදී තරුණ ජනයා අතර ජනප්‍රිය වෙමින් තිබෙන එවැනි එක් මෙවලමක් වන්නේ සංසද රංග කලාවයි.*

**වරුණ අලහකෝන්**
**සභාපති, සමාලෝචන කමිටුව**
**නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (නාට්‍ය හා රංග කලාව)**
**සෞන්දර්ය අධ්‍යාපන ඒකකය, අධ්‍යාපන අමාත්‍යාංශය**

## ප්‍රත්‍යවේක්ෂණයන්

"ශ්‍රී ලංකාවේ සංසද රංග වැඩසටහන" ආරම්භ වන්නේ 2013 වසරේ ය. ඒ නැගෙනහිර පළාතේ තරුණයන් සම්බන්ධ කර ගනිමින් එක් වරක් සඳහා පමණක් පැවැත්වුණු වැඩසටහනක් ලෙසයි. එමගින් ඔවුන්ට සිය හැකියාවන්, නිර්මාණාත්මක අදහස් ආදිය බහුත්වවාදී වටිනාකම් ගැන විචාරාත්මක සංවාදයක් ඇති කිරීමට යොදා ගැනීමේ හැකියාව ලැබිණි. විවිධත්වය සමග වැඩ කිරීම, වෙනස්කම්වලට ගරු කිරීම, නිරන්තර සංවාදය, සමානාත්මතාව, යුක්තිය සහ සක්‍රිය අවිහිංසාව එකී බහුත්වවාදී වටිනාකම්වලට අයත් ය.

එවක පැවති ජාතික ඒකාබද්ධතා සහ දේශීය භාෂා අමාත්‍යාංශයත්, නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයත්, නැගෙනහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවත්, නැගෙනහිර පළාතේ තරුණ සංසද කලාකරුවනුත් විසින් ලබා දෙන ලද දැවැන්ත සහයෝගය හේතුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍ය සංසදයට මෙම මුලපිරුම ඊළඟ සිව් වසරේදී තවත් පළාත් හතරක් කරා රැගෙන යෑමට දිරිය ලැබිණි.

මේ වන විට, උතුරු, මධ්‍යම, උතුරුමැද, බස්නාහිර, දකුණු සහ නැගෙනහිර පළාත්වල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල පූර්ණ සහයෝගය මත සංසද රංග වැඩසටහන් ක්‍රියාත්මක කර තිබේ.

විවිධ ජාතීන්ට හා ආගම්වලට අයත් 40,000 ක් පමණ වන සිසුන් ද, 5000 ක් පමණ වන තරුණ තරුණියන්ද, සිය ගණනක් ගුරුවරුන් ද මුණගැසී, සිය ගණනක් දුරබැහැර ගම්මාන වෙත ගමන් කරමින් 160 ක් පමණ තරුණ සංසද රංග කලාකරුවන් පුහුණු කිරීම යන සරුසාර වූත් දීර්ඝ වූත් ක්‍රියා සමුදාය තුළින් සාමකාමී ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීමෙහි ලා තරුණයන් සතු විභවය පිළිබඳ ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍ය සංසදයට පුළුල් අවබෝධයක් ලැබිණි. එවැනි ශ්‍රී ලංකාවක එකිනෙකාගේ වෙනස්කම්වලට ගරු කරනු ලබන අතර විවිධත්වය ශක්තියක් ලෙස සලකනු ලැබේ.

අපට වැටහී ගිය තවත් කරුණක් වන්නේ පාසල් දරුවන්ට ලෝකය පිළිබඳ අත්දැකීම් අවශ්‍ය බවයි. සෑම ළමයකු ම සිය නිර්මාණාත්මක හැකියාව නිසා සුවිශේෂ වේ. ඔවුන් දරන මත වැඩිහිටියන්ගේ ඒවාට වඩා බොහෝ සෙයින් තාර්කික ය. ඔවුන්ගේ කතා පුවත් වැඩිහිටියන්ගේ කතා පුවත්වලට වඩා සරුසාර ය. ඔවුන්ගේ ලෝක දැක්ම හා බහුවිධභාවය පිළිබඳ දැක්ම ඉතා ශක්තිමත් ය.

ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු තම සමාජ වටපිටාවේ අභියෝගයන්ට ලක්ව තිබුණි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට තමන් ඉගෙන ගනිමින් සිටි ක්‍රමය පිළිබඳ පිළිතුරු නොලැබුණු හා නොවිසඳන ලද ගැටලු තිබිණි. ඉහළ හැකියාවක් ඇති දායකයන් ලෙස, සැලසුම් සහගතව තරුණ සිසුන් සම්බන්ධ කර ගැනීමේ අවශ්‍යතාව මෙම නිරීක්ෂණ විසින් තහවුරු කෙරිණි.

මෙම අත්පොත විසින් සැපයෙනුයේ සංසද රංග කලාව පිළිබඳ මූලික අවබෝධයක් පමණි. අත්පොත සම්පාදනයේදී අප උත්සාහ කර තිබෙන්නේ සංසද රංගයේ මූලික සංකල්ප කිසියම් දුරකට දේශීය තත්වයන් තුළ යොදා ගැනීමටයි. එබැවින් එය වැඩිදියුණු කිරීම් හා වටිනාකම් එකතු කිරීම් අවශ්‍ය මූලික ප්‍රයත්නයක් ලෙස සැලකීම සුදුසු ය. මෙම අත්පොත සම්පාදනය කරනු ලැබුවේ ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍ය සංසදය විසින් වුවත්, එකී උත්සාහය පිටුපස ශ්‍රී ලංකාවේ සංසද රංග කලාව වෙනුවෙන් ඇපකැප වීමෙන් වැඩ කළ පුද්ගලයන් සහ සංවිධාන කිහිපයක ප්‍රයත්නයන් අනතර්ගතය.

එබැවින්, අපගේ සියලු හවුල්කරුවන්ට, ආධාරකරුවන්ට හා ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍ය සංසදයේ වැඩසටහන් කණ්ඩායමට මෙරට සංසද රංගන වැඩසටහන වෙනුවෙන් දෙන ලද විස්මිත සහයෝගය සම්බන්ධයෙන් ස්තූති කිරීමට මෙය අවස්ථාව කර ගනිමි. අධ්‍යාපන අමාත්‍යංශයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (නාට්‍ය හා රංග කලාව) වරුණ අලහකෝන් මහතා විසින් සභාපතිත්වය දරන ලද විශේෂඥ සමාලෝචන කමිටුවට ස්තූති කිරීමට ද මම මෙය අවස්ථාවක් කර ගනිමි. "ශ්‍රී ලංකාවේ සංසද රංග වැඩසටහන" ක්‍රියාත්මක කිරීමේ හැකියාව හා මෙම අත්පොත සම්පාදනය කිරීමේ හැකියාව ලැබුණේ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ සහයෝගයෙන් බව ද විශේෂයෙන් සඳහන් කළ යුතු ය. එයට සහයෝගය දුන් තානාපති කාර්යාලයේ සියලු දෙනාට මගේ ස්තූතිය හිමි වේ.

**මහාචාර්ය පද්මසිරි වනිගසුන්දර**

**සභාපති, ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍ය සංසදය**

# පටුන

01 සංසද රංග කලාවඃ කෙටි හැඳින්වීමක් / 02
02 ඔගස්ටෝ බොආල් / 04
03 පීඩිතයන්ගේ රංග කලාව වටහා ගැනීම / 06
04 සංසද රංග කලාව / 20
05 සංසද රංග කලාවේ ලක්ෂණ / 24
06 සංසද රංග කලාවේ ක්‍රමවේදය / 28
07 පහසුකාරකවරයාගේ භූමිකාව / 36
08 පෙර පුහුණු ක්‍රියාවලිය / 38
09 කතා සංවර්ධනය / 40
10 රංගනය හරහා චරිත තහවුරු කිරීම/ 44
11 සංසද රංග මුලපිරුමක් සැලසුම් කිරීම / 48
12 කාර්ය සම්පාදන අවශ්‍යතා / 54
13 කලා කළමනාකරණය / 56
14 අධීක්ෂණය හා ඇගයීම / 60




01 පින්තූරයඃ ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - සිව්වැනි අදියර / වවුනියාව දිස්ත්‍රික්කය / ඡායාරූපයඃ මොහොමදු අස්වර්

## Spect-Actor හෙවත් ප්‍රේක්ෂක නළුවා යනු කවුරු ද?

මෙම සංකල්පයෙන් කියැවෙන්නේ ප්‍රේක්ෂකයන්ගේ ද්විත්ව භූමිකාව ගැනයි. සංසද රංග කලාවේදී ප්‍රේක්ෂකයා නරඹන්නකු ලෙස මෙන් ම තම යථාර්ථයන් නාට්‍යයට ගෙන එන 'ප්‍රේක්ෂක නළුවකු' ද විය යුතුය.

# 01

# සංසද රංග කලාව: කෙටි හැඳින්වීමක්

සංසද රංග කලාව යනු බ්‍රසීල ජාතික විප්ලවීය කලාකරුවකු වන ඔගස්ටෝ බොආල් විසින් නිර්මාණය කරන ලද රංග විධි ක්‍රමයකි. “පීඩිතයන්ගේ රංග කලාව” (Theatre of the Oppressed) ලෙස ද හැඳින්වෙන මෙමගින් බලය නැති පිරිස් සවිබලගන්වනු ලැබේ. බලය නැති පිරිස්වලට බලය නැතිකම දෙස විචාරශීලීව බලන්නටත්, ප්‍රජා ප්‍රශ්නවලට ප්‍රායෝගික විසඳුම් සොයන්නටත්, එමගින් මහජනයාට අවස්ථාවක් ලබා දෙයි. එහි නම්‍යශීලී ස්වභාවය නිසා සංසද රංගය ලොව පුරා ම ගැටුම් පරිවර්තනය කිරීමේ හා නිර්මාණාත්මක ලෙස ප්‍රශ්න විසඳීමේ මෙවලමක් ලෙස භාවිතා කරනු ලැබේ. එහි කැපී පෙනෙන ලක්ෂණ කීපයක් ඇත. එයින් එකක් වන්නේ සංසද රංග දැක්වීම්වල දී ප්‍රේක්ෂකයන්ට මැදිහත් වීමට අවස්ථාවක් ලැබීමයි. රඟ දැක්වීම තුළ නිරූපණය කරන ලද අවස්ථාවට සක්‍රිය ලෙස සහභාගි වී එම තත්වයන් වෙනස් කිරීමට ඔවුන්ට අවස්ථාව ලැබේ. මෙම ද්විත්ව ලක්ෂණය නිසා සම්ප්‍රදායික ප්‍රේක්ෂකයා “ප්‍රේක්ෂක නළුවකු” (Spect-Actor) බවට පත් වේ. සංසද රංග රඟ දැක්වීම් යනු නිරන්තරයෙන් වෙනස් වන ඉදිරිපත් කිරීම් විශේෂයකි. එමගින් තෝරා ගත් ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට උත්සාහ දරනු ලැබේ. එහිදී නාට්‍ය රඟ දක්වන්නේ ක්ෂණික රඟ දැක්වීම් ලෙස හෝ රඟ දැක්වීම අතරතුර පරිණාමය වන පිටපත්වලින් යුතුව ය.

පසුගිය කාලය තුළදී සංසද රංගය ලොව පුරා විවිධාකාරවලින් පරිණාමය වී තිබේ. නොවිධිමත් අධ්‍යාපනයේ විවිධ සංදර්භයන්හිදී ද එය භාවිතා කළ හැකි ය. එමගින් ප්‍රේක්ෂකයන්ට අත්දැකීම් හරහා ඉගෙනීමට අවස්ථාව ලැබේ. එබැවින් එය අත්දැකීම් පාදක ඉගෙනීමේදී වටිනා මෙවලමක් වේ.



02 පිංතූරය: https://www.pinterest.com

*"පීඩිතයන්ගේ රංග කලාව එක්තරා අරුතකින් ගත් කල ලොව වඩාත් ම පැරණි රංගය වන්නේ එය භාවිතයේ දී සියලු මිනිසුන් නළු නිළියන් ද (ඔවුහු රඟති!), ප්‍රේක්ෂකයන් ද (ඔවුහු නරඹති!) වන බැවිනි."*

*"රංග කලාව යනු දැනුම් ස්වරූපයකි. එයට සමාජය වෙනස් කිරීමේ හැකියාව ඇති අතර, එය එසේ කළ යුතු ද වේ. අනාගතය නිර්මාණය වන තෙක් බලා නොසිට, රංග කලාවට අපගේ අනාගතය ගොඩනැගිය හැකි ය."*
*- ඔගස්ටෝ බෝආල්*

- ඔගස්ටෝ බොආල් යනු විවිධ ස්වරූපවල අන්තර් ක්‍රියාකාරී රංග ක්‍රමවේද ඉගැන්වූ විප්ලවීය නාට්‍යකරුවෙකි. ඒවායේ දී ප්‍රේක්ෂකයන් ප්‍රධාන දායකයන් ලෙස යොදා ගැනිණි.

- බ්‍රසීලය යනු එහි පැවති යුද පාලනය විසින් පීඩාවට පත් කරන ලද දේශයකි. පොදු ජනතාව මෙම පීඩනය හමුවේ නිහඬව සිටියහ. එබැවින්, ජනතාවට තමා විසින්ම ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඉවහල් වන පරිදි යථාර්ථය ඔවුන්ට පෙන්වා දීමේ වේදිකාවක් නිර්මාණය කිරීමට බෝආල්ට අවශ්‍ය විය.

- සංසද රංගය යනු තීරණ ගැනීමේ මෙවලමක් හෝ ප්‍රේක්ෂකයන් ගේ අදහස් ග්‍රහණය කර ගැනීමේ ක්‍රමවේදයක් හෝ නොවේ.

- 'ප්‍රේක්ෂක නළුවා' සංකල්පය හඳුන්වා දීමෙන් ඔහු ප්‍රේක්ෂකයා පරිවර්තනයකට ලක් කළේ, නළුවා හා ප්‍රේක්ෂකයා අතර අදෘෂ්‍යමාන බිත්තිය බිඳ දමමිනි. නාට්‍යයේ ප්‍රතිඵලය වෙනස් කිරීම සඳහා 'ප්‍රේක්ෂක නළුවා' වේදිකාව මැදට කැඳවන ලදී.

# 02

# ඔගස්ටෝ බොආල්

කීර්තිමත් බ්‍රසීලියානු රංගවේදියකු වූ ඔගස්ටෝ බොආල් උපත ලබන්නේ 1931 මාර්තු 16 වැනි දින රියෝ ද ජැනයිරෝ නගරයේදී යි. නිව්යෝක්හි කොලොම්බියා විශ්වවිද්‍යාලයේ උගත් රසායන ඉංජිනේරුවකු වූ ඔහු නාට්‍ය කලාවට පෙම් බැන්දා, තුරුණු වියේ සිටම නාට්‍ය නිෂ්පාදනයේ යෙදුණු ඔහු නිව්යෝක්හි සිට පැමිණීමෙන් පසු බ්‍රසීලයේ සාඕ පෝලෝහි ඇරීනා තියටරයට බැඳුණේ ය. 1970 ගණන්වල දී බෝආල් විසින් "පීඩිතයන්ගේ රංග කලාව" හඳුන්වා දුන්නේ ය. එමගින් රංග කලාව විප්ලවීය වෙනසකට බඳුන් කෙරුණු බොහෝ අන්තර් ක්‍රියාකාරී රංග ස්වරූපවලට මග පෑදුණි.

ත්‍රෛමාසික Ceasefire[1] සඟරාවෙහි දී රොබින්සන් (2016) සඳහන් කරන ආකාරයට බෝආල්ගේ රංග ප්‍රවේශයට එක් පැත්තකින් බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගෙන් අනුප්‍රාණය ලැබිණි. බ්‍රෙෂ්ට් යනු සමාජ යථාර්ථයන් හා එයින් දෙනු ලබන පණිවුඩය වැළඳ ගැනීමට ප්‍රේක්ෂකයන් පෙළඹවූ ජර්මන් ජාතික රංගධරයෙකි.

ලියනගේ (2016) නිරීක්ෂණය කරන ආකාරයට බ්‍රෙෂ්ට් පුළුල් ලෙස ප්‍රචලිත වන්නේ රංග කලාවේ "ප්‍රති-ඇරිස්ටෝටලියානු" ආකාරය හඳුන්වා දීම නිසායි. ඔහුගේ " දුරස්ථකරණ ආවරණය" (Alienation Effect) සංකල්පය යනු සමාජ-විචාරශීලී ප්‍රේක්ෂක ප්‍රතිචාරයක් උත්පාදනය පිණිස නව්‍ය රංග ක්‍රම ශිල්ප භාවිතය පිළිබඳ මූලධර්මයකි. බ්‍රෙෂ්ට් සම්ප්‍රදාය ප්‍රේක්ෂකයන් චරිත සමග භාවමය වශයෙන් නොබැඳීමට අමතරව, තත්වය පිළිබඳ ස්වයංව සිතා බැලීමටත්, වේදිකාවේ නිරූපිත රංගනය විචාරශීලීව නැරඹීමටත් පොළඹවයි.

මෙම දර්ශනය බොආල් ඇරීනා තියටර්හි කළ පර්යේෂණයට දොරටුව විය. එමගින් ප්‍රේක්ෂකයා හුදු බලා සිටින්නකු නොව, 'ප්‍රේක්ෂක නළුවකු' බවට පත් කරන ලදී. එයින් අදහස් වන්නේ ප්‍රේක්ෂකාගාරයේ සාමාජිකයකුට වේදිකාවට පැමිණෙන්නට හා නාට්‍යයේ නිරූපිත සමාජ ව්‍යසනයකට විසඳුම් ලබා දීමට හැකියාව සහ නිදහස ඇති බවයි.

වේදිකාව නිවැරදි මග පෙන්වීම සඳහා තැනකැයි බෝආල් සැලකුවේ නැත. එහෙත් සියලු මාර්ග නිරීක්ෂණය කිරීමට සහ ප්‍රේක්ෂකයන් බලසතු කිරීම හරහා සහභාගීත්වයෙහි ප්‍රතිඵලය ගවේෂණය කිරීමටත් යොමු කරයි.

ප්‍රේක්ෂකයන්ට වේදිකාවට පැමිණ ඔවුන්ගේ අදහස් එහිදී ඉදිරිපත් කිරීමට ඔහු අවස්ථාව දුන්නේ ය. ඔවුන් සිදු කිරීමට අදහස් කරන වෙනස භාවිතා කරන්නට එයින් අවස්ථාව ලැබිණි. වෙනත් ප්‍රේක්ෂකයන්ගේ යෝජනා ද සාමූහිකව සාකච්ඡා වීමත් සමග ම සමාජ ක්‍රියාමාර්ග මුලපිරීම දිරිගැන්විණි.

රංග කලාව එය විසින් ම විප්ලවීය නො වන බව ද, එය විප්ලවය සඳහා පෙර පුහුණුවක් බව ද ඔහු පැවසී ය. රියෝ ද ජැනයිරෝ නගර සභාව වෙත තේරී පත් වීමෙන් පසු බෝආල්ගේ විප්ලවීය කටයුතු තවත් ඉදිරියට ගියේ ය. එහිදී ඔහු මහජනතාව වෙත දේශපාලන වෙනස රැගෙන යාමට රංග කලාව භාවිතා කළේ ය. ඔහු සිය තනතුර හා සම්බන්ධ කාර්ය මණ්ඩලය ලෙස තම නාට්‍ය කණ්ඩායම බඳවාගෙන නගරයේ සියලුම ප්‍රජාව නියෝජනය කරන නාට්‍ය කණ්ඩායම් හැදීමට යෙදවූයේ ය. මෙම නවීන ක්‍රමවේදයේ ප්‍රතිඵලයක් ලෙස, පොදු නීති 13 ක් බ්‍රසීල ජනතාවගේ හිත සුව පිණිස හේතු වන පරිදි නැවත අර්ථකථනය කරන ලදී.

මුලදී බෝආල් ප්‍රතිබිම්බ රංග කලාව භාවිත කළේ ය. එහිදී අවාචික ප්‍රකාශනයක් හෝ රූපයක් හෝ භාවිතා කරන ලදී. ඉන් පසු ඔහු පීඩිතයන්ගේ රංග කලාවේ හරය ලෙස සැළකිය හැකි සංසද රංගය හඳුන්වා දුන්නේ ය. පසු කලෙක මෙම සංකල්පයේ විවිධ අරුත් ගැන්වීම් එළි දැක්වුණේ ඵලදායී ලෙස වෙනස පිළිබඳ උත්තේජනයක් ඇති කිරීම සඳහා ජනතාව වෙත ප්‍රවේශ වීමට ය.



03. පින්තූරයඃ ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - සිව්වැනි අදියර / මන්නාරම් දිස්ත්‍රික්කය / ඡායාරූපයඃ ඇලෙක්සැන්ඩර් කැමිලස්

## පීඩනය යනු කුමක් ද?

පීඩනය යනු, ප්‍රජාවේ බලවත් කණ්ඩායමක් විසින් සාපේක්ෂව අඩුවෙන් බලවත් කණ්ඩායමක් මත අඛණ්ඩව පවත්වන, අසාධාරණ හෝ අයුක්ති සහගත හෝ සැලකීමක් හෝ පාලනයකි. පීඩනය විවිධ ස්වරූපයෙන් දැකිය හැකි ය. ස්ත්‍රී පුරුෂභාවය, පංතිය, වයස, සමාජ තත්වයන්, ලිංගික, ආර්ථික, ආගමික, සංස්කෘතික, දේශපාලන ආදිය උදාහරණ ය. පීඩනය ශ්‍රී ලාංකිකයන්ට ආගන්තුක සංකල්පයක් නො වේ. බොහෝ සිංහල, දෙමළ සහ ඉස්ලාම් සාහිත්‍යයන්හි හා රංග ස්වරූප තුළ ලාංකික සංදර්භයේ පීඩනය පිළිබඳ විමසා තිබේ.

# 03
# පීඩිතයන්ගේ රංග කලාව වටහා ගැනීම

පීඩිතයන්ගේ රංග කලාවේ හරය වන්නේ ප්‍රජාවක් පීඩාවට පත් කරන සැබෑ ජීවිතයේ සමාජ ප්‍රශ්න උදෙසා උත්තේජනාත්මක ආකාරයේ නාට්‍යානුසාරී පෙර පුහුණුවකි . එය නිර්මාණය කර ගනු ලැබුවේ නිර්මාණාත්මක, ක්‍රමශිල්ප ක්‍රීඩා සහ භාවිතාවන් සමූහයකිනි. එමගින් ගුරුවරුන්ට, සිසුන්ට, නාට්‍යකරුවන්ට, උනන්දුවක් දක්වන පුද්ගලයන්ට හා ප්‍රජාවට සිය ක්‍රියාවන් සමකාලීන තත්වයන්ට අනුරූපීව පරිවර්තනය කර ගැනීමට මග සැලසිණි.

ඔගස්ටෝ බොආල් දේශපාලනික ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීමට පීඩිතයන්ගේ රංග කලාව භාවිතා කළ මුත්, එය දරිද්‍රතාව, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට, මත්ද්‍රව්‍ය අවභාවිතය, පරිසර දූෂණය වැනි වෙනත් සමාජ පීඩනයන් වෙනුවෙන් ද භාවිතා කළ හැකි ලෙස හුරුබුහුටි ය. එබැවින්, පුළුල්ව සලකා බැලූ කල එය ඕනෑ ම දෙයක් ඇමතිය හැකි නම්‍යශීලී මෙවලමකි. තව ද රංග කලා අධ්‍යාපනයේ මූලික ලක්ෂණයක් වන අධ්‍යාපන-විනෝදාස්වාදය ද පීඩිතයන්ගේ රංග කලාව තම භාවිතයට ගනී.

පීඩිතයන්ගේ රංග කලාව යනු දෙබස් ක්‍රීඩාව යි. එමගින් අපි රඟපාමින් ඉගෙන ගන්නෙමු. ඕනෑ ම ක්‍රීඩාවකට විනයක් එනම්, අනුගමනය කළ යුතු පැහැදිලි නීති තිබිය යුතු ය. ඒ අතරතුර ම, ක්‍රීඩාවලට සුවිසල් නිර්මාණශීලීත්වයක් හා නිදහසක් ද අවශ්‍ය ය. පීඩිතයන්ගේ රංග කලාව යනු එකිනෙකට ප්‍රතිවාදාත්මක වන විනය සහ නිදහස අතර පරිපූර්ණ සහවාදයක් හෙවත් පරම සංස්ලේෂණයකි. විනය නොමැතිව සමාජ ජීවිතයක් නැත. නිදහස නොමැතිව සමාජ ජීවිතයක් නැත. අපගේ ක්‍රීඩාවේ විනය යනු සෑම දෙනෙකුට ම ගෞරවනීය ලෙස එකට පැවතීම සඳහා තිබෙන අයිතිය ප්‍රතිස්ථාපනය කිරීම පිළිබඳ අපගේ විශ්වාසයයි. අප විශ්වාස කරන්නේ අප සියලු දෙනා ම අප සිතනවාට වඩා බෙහෙවින් යහපත් බවයි. අපි සහයෝගිතාව විශ්වාස කරන්නෙමු. අපගේ නිදහස වන්නේ මානව වර්ගයා මානුෂීය කිරීම සඳහා ක්‍රම සොයා ගැනීම පිණිස උපකාර කිරීමයි. ඒ සඳහා අධ්‍යාපනික, දේශපාලනික, කලාත්මක වැනි මිනිස් ක්‍රියා කාරිත්වයේ ඕනෑම ක්ෂේත්‍රයක් නිදහසේ ආක්‍රමණය කරනු ලැබේ.

*රංග කලාව යනු භාෂාවකි. එබැවින් එය මිනිස් හැඟීම් ගැන සාකච්ඡා කිරීමට යොදා ගත හැකි ය. එය රංගයට පමණක් සීමා නො විය යුතු ය. අපි විශ්වාස කරන්නේ සාමය ගැන මිස නිෂ්ක්‍රීයත්වය ගැන නො වේ*

පීඩිතයන්ගේ රංග කලාව සංවර්ධනය කරන අතරතුර ඔගස්ටෝ බෝආල් විවිධ ප්‍රජාවන් විවිධ ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීමට යෙදවී ය. එබැවින් ඔහුට බොහෝ තාක්ෂණික විධික්‍රම පාවිච්චි කිරීමට සිදු විය. මෙම තාක්ෂණයන් අවසානයේදී විවිධ රංගකලා ස්වරූපයන්ට යා විය. ඒ එක එකක් වෙනස් ප්‍රතිඵල ලබා ගැනීම සඳහා වෙනස් ක්‍රියාවලි භාවිතා කරයි. බෝආල් විසින් භාවිතා කරන ලද එවැනි තාක්ෂණික විධික්‍රම කිහිපයක් වෙත අපි දැන් අවධානය යොමු කරමු.

# පරිපීඩනය තේරුම් ගැනීම

පහත දැක්වෙන්නේ දේශීය පවුල් සංදර්භය තුළ පරිපීඩනය පිළිබඳ නිදසුනකි. පහත සඳහන් චරිත ඇතුළත් සාමාන්‍ය පවුලක් පිළිබඳ සිතා ගන්න.

පියා, මව, සහ දියණියක සිටින මෙම පවුලේ පියා ලිපිකරුවකු වන අතර ඔහුගේ වැටුප තරමක් පහළ මට්ටමක තිබේ. ඔහු නිතර නිවසට පැමිණෙන්නේ බීමත්ව ය.

නිවසට පැමිණෙන ඔහු සිය බිරියට කියන්නේ ඇය තමා කියන දෙයම කළ යුතු බවයි. අනතුරුව ඔහු කෑම ලෑස්ති කරන්නැයි ඇයට කියයි. අවාසනාවකට මෙන්, ගෙදර ඉවීමට දෙයක් නැත. බිරිය බලා සිටියේ ඉවීමට අවශ්‍ය කළමනා ගෙන එන තෙක් ය. කෝපයෙන් වියරු වැටෙන සැමියා බිරිය තල්ලු කරයි. ඇය බිම ඇද වැටේ. දියණිය ඇගේ උදව්වට පැමිණීමෙන් පියා තවත් කුපිත වන අතර ඇයට ද පහර දෙයි.

දර්ශනය අවසන් වන්නේ මවත්, දියණියත් ලේ ගලන සිරුරු සහිත එකිනෙකා වැළඳගෙන හඬමින් බිම වැටී සිටින දර්ශනයකිනි. ප්‍රේක්ෂකයන්ට මෙම කෙටි නාට්‍යයේ කතාව තුළට පිවිස බහුවිධ පීඩිතභාවයන් සමීපව නිරීක්ෂණය කළ හැකි ය. කතාව වටා පහත දැක්වෙන ප්‍රශ්න මතු කළ හැකි ය.

- මෙහි තිබෙන පීඩිතභාවය කුමක් ද?
- එය අපගේ ප්‍රජාවන් අතර සුලබ ප්‍රශ්නයක් ද?
- එය සිදු වන්නේ ඇයි?
- එහිදී වරද කාගේ ද?
- මවට පවත්නා තත්වය තුළ කුමක් කළ හැකි ද?
- මේ මවටත්, දියණියටත් උපකාර කළ හැකි කිසිවෙකු සිටිත් ද?
- ප්‍රජාව මෙයට සම්බන්ධ කර ගත හැක්කේ කෙසේ ද?

පීඩිතයන්ගේ රංග කලාව තහවුරු කර සිටින්නේ බල රහිත බව හෝ ප්‍රජා ප්‍රශ්න සඳහා විසඳුම්වල පදනම තීරණය වන්නේ, මතු කෙරුණු තීරණාත්මක ප්‍රශ්න මත බවය. ඔගස්ටෝ බෝආල් විශ්වාස කළ පරිදි හොඳ ප්‍රශ්න ඇසීම හොඳ පිළිතුරු ලැබීමට වඩා හොඳ ය.





**04: පින්තූරය ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - සිව්වැනි අදියර / යාපනය දිස්ත්‍රික්කය / ඡායාරූපය: ඇලෙක්සැන්ඩර් කැමිලස්**

# 3.1 ව්‍යවස්ථාදායක රංගය (LEGISLATIVE THEATER)

ව්‍යවස්ථාදායක රංගය යනු කොන් කෙරුණු පාර්ශවකරුවන්ගේ අයිතීන් පුළුල් කිරීම හා සුරැකීම පිණිස ප්‍රතිපත්ති හා නීති සම්පාදනයට සංසද රංග කලාව භාවිතා කරමින් බිම් මට්ටමේ ප්‍රජාව සම්බන්ධ කර ගැනීම මඟින් ප්‍රජාතාන්ත්‍රිකභාවය ඇති කිරීමේ උත්සාහයයි.

සංසද රංගයෙහි කැපී පෙනෙන වෙනසක් වන්නේ ප්‍රේක්ෂකයන් අතර සිටින නීතිඥවරයකු නාට්‍යය නරඹමින් තත්වයන් වෙනස් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සටහන් කර ගැනීමයි. එය පසුව නගර සභාවට. පළාත් සභාවට හෝ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ වාර්තාවක් බවට පත් කෙරේ එහි අරමුණ වන්නේ නීතිය තුළ යුක්තියුක්ත උනන්දු කිරීම් නිර්මාණය කිරීම සඳහා යොමු වන පරිදි පුරවැසි ප්‍රජාව පරිවර්තනය කිරීමයි.

බොආල්ගේ සමයේ රියෝ ද ජැනෙයිරෝවේදී ව්‍යවස්ථාදායක රංගය නව නීති හඳුන්වා දීම සඳහා යොදා ගැනීමට ඔහු සමත් විය. නිදසුනක් ලෙස 2384/95 නීතිය සැලකිය හැකි ය. එයින් කියවුණේ සියලු නාගරික රෝහල්වල වැඩිහිටි රෝග හා ගැටලු සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරුන් සිටිය යුතු බවයි. මෙය රියෝ ද ජැනෙයිරෝවේ ව්‍යවස්ථාදායක රංගය භාවිතා කරමින් සම්මත කරන ලද පළමු නීතියයි. ව්‍යවස්ථාදායක රංගය ඔස්සේ සම්පාදනය කරන ලද තවත් නීතියකින් තහවුරු වුණේ ලිංගික නැඹුරුව නො සලකා සියලු යුවලවලින් මොටෙල් හෙවත් මාර්ගස්ථ හෝටල්වලදී එක ම ගාස්තුව අය කරනු ලබන බවයි. මේ අන්දමින් වාර්තා රංගය දේශපාලන ක්‍රියාකාරිත්වය හා තීරණ ගැනීම සම්බන්ධ කාර්යක්ෂම මෙවලමක් බවට පත් විය.

*ව්‍යවස්ථාදායක රංගය යනු සංසද රංගන ස්වරූපයකි. එහෙත් එහි දැනට පවත්නා නීති වෙනස් කිරීමේ හෝ අලුත් නීති හඳුන්වා දීමේ උත්සාහයක් තිබේ. එහිදී නීතිඥයන්ට හා ප්‍රතිපත්ති සම්පාදකයන්ට ප්‍රේක්ෂකාගාරය වෙත ආරාධනා කරනු ලැබේ. ඔවුන්ගෙන් බලාපොරොත්තු වන්නේ රංගය නරඹා, ප්‍රජාවට සාධනීය බලපෑමක් සිදු කළ හැකි ආකාරයේ ප්‍රතිපත්ති සම්පාදනයට ඉවහල් වන තොරතුරු උකහා ගැනීමයි.*



05 පින්තූරයः ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන දෙවැනි අදියර / මහනුවර දිස්ත්‍රික්කය / ඡායාරූපයः මොහොමඩ් අස්වර්

## 3.2 විවාද රංගය (DEBATE THEATRE)

විවාද රංගය යනු සමකාලීන සමාජ ප්‍රශ්න වේදිකාවේ විවාද ස්වරූපයෙන් ඉදිරිපත් කරන නව නිර්මාණාත්මක මෙවලමකි. විවාද රංගය හා සංසද රංග කලාව අතර මූලික වෙනස සරල ය. විවාද රංගය සලකා බලන්නේ සාකච්ඡාවක් පමණි. නාට්‍යයෙන් පසුව මහජන මැදිහත් වීම් අත්‍යවශ්‍ය නැත. එබැවින් නාට්‍යයෙන් නිරූපිත කාරණා සාකච්ඡාවට පදනම වන අතර එම සාකච්ඡාව මඟින්, අත්දැකීම්, විශේෂඥභාවය හා පැහැදිලි කර ගැනීම් බෙදා හදා ගැනේ.

*විවාද රංගය සමාජ ප්‍රශ්න විවාද ස්වරූපයෙන් ඉදිරිපත් කරයි. එමගින් යෝජක හා ප්‍රතියෝජක පැති නිර්මාණය වේ. එය පවත්නා ප්‍රශ්නයක් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගැනීමට ප්‍රේක්ෂකයන්ට උපකාරී වේ. තමන්ගේ දෘෂ්ටිකෝණයෙන් පමණක් නොව, අන් අයගේ දෘෂ්ටිකෝණයෙන් ද ප්‍රශ්නය විමසීමට යොමු කෙරේ.*



# 3.3 ප්‍රතිබිම්බ රංගය (IMAGE THEATRE)

රූපමය රංගය යනු නළුවන් යොදාගෙන රූපමය ලෙස යථාර්ථය අනුකරණය කිරීමයි. මෙමගින් අදහස් වන්නේ නළුවන් විසින් ප්‍රජාවන් පීඩාවට පත් කරන ඇතැම් තත්වයන් අවබෝධ කරගෙන එය යම් ප්‍රකාශනයක් ලෙස ආපසු ජනයා වෙත ඉදිරිපත් කරනු ලබන බවයි.

සාමාන්‍යයෙන් ඉදිරිපත් කිරීමක් කරනු ලබන්නේ නළුවන් විසින් ප්‍රසිද්ධියේ ය. ඒ සඳහා එම ඉදිරිපත් කිරීම නැරඹීමට හැකි සෙනගක් සිටින තැනක් යොදා ගනු ලැබේ. නළුවන් විසින් නිශ්චල, ඝනීභූත රූපයක් නිර්මාණය කරනු ලැබේ. මෙම නිරූපණය පසුබිම් කරගෙන පහසුකාරකවරයකු විසින් එම රූපයෙහි දකින දෙය පිළිබඳ ජනතාවගෙන් විමසනු ලැබේ.

සංසද රංග කලාවට සමානව, පහසුකාරකවරයා විසින් ප්‍රේක්ෂකයන් සමග සාකච්ඡාවක් පුබුදුවා ගනු ලබන්නේ ඔවුන් මොහොතකට පෙර දුටු රූපය පිළිබඳ බහුවිධ අරුත් විවරණයන් ඉදිරිපත් කිරීමට පහසුකම් සැළසීම මගිනි. මෙම විවිධ අදහස් මහජනයා විසින් දෛනිකව අත්දකිනු ලබන කිසියම් නිශ්චිත සත්‍යයක මනෝමූලික අංග ලෙස නිගමනය කරනු ලැබේ.

*රූපමය රංගය විසින් පොදු සංසදයකදී නිශ්චල, ඝනීභූත ප්‍රකාශනයක් භාවිතා කරමින් යථාර්ථය අනුකරණය කරනු ලැබේ. පොදු ජනයා එහිදී තමන් දකින දේ සම්බන්ධයෙන් අර්ථකථනයක් සැපයීමට අවස්ථාව ලබා ගනිති. එමගින් එය, ඉස්මතු කෙරුණු ප්‍රශ්න පිළිබඳ සාකච්ඡාවක් සඳහා උත්තේජනය සපයයි.*




06 පින්තූරය: ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - දෙවැනි අදියර / මහනුවර දිස්ත්‍රික්කය / ඡායාරූපය: අස්ජේන් වහිඩ්

# 3.4 අදිසි රංගය / කඩාකප්පල්කාරී රංගය

## (INVISIBLE THEATRE / DISRUPTIVE THEATRE)

අදිසි රංගය හෙවත් කඩාකප්පල්කාරී රංගය නළු නිළියන් විසින් රඟ දක්වනු ලබන්නේ පොදු ස්ථානයකදී ය. එය බස් නැවතුම්පොළක්, දුම්රියපොළක්, වෙළඳපොළක් වැනි ස්ථානයක් විය හැකි ය. තමන් අතර නළුවන් ස්ථානගත කර ඇති බව ජනතාව නොදනී. වෙනත් වචනවලින් පවසන්නේ නම්, නළු නිළියන් වෙස්වලාගෙන සිටින අතර, ප්‍රජාවේ වෙනත් ඕනෑම සාමාජිකයකු ලෙස ඔවුහු හැසිරෙති.

නළු නිළියන් පොදු ජනයා සමග මුසු වීම සඳහා ඉතා හොඳින් පුහුණු කර තිබේ. ඔවුන් මහජනයා සමග සම්බන්ධ වන ආකාරයේ කිසිදු වෙනස්කමක් නැති තරම් සාමාන්‍ය ය. තත්ත්වය අවබෝධ කර ගැනීමටත්. සමාජ ප්‍රශ්නයක් පිළිබිඹු වන පරිදි නාට්‍යයේ රැඟුම් සැළකිල්ලක් නිමවා ගැනීමටත් හැකි වන අයුරෙන් මෙම ක්‍රියාවලිය පිළිබඳව නළු නිළියන් ඉතා හොඳින් දැනුම්වත් කර ඇත. නළුවන්ගේ කාර්යභාරය වන්නේ පොදු අවකාශයක මහජන අවධානය යොමු වන පරිදි සමාජ ප්‍රශ්නයක් මතු කිරීමයි. මේ අතරතුර ම, වෙනත් නළුවෝ ජනතාව ද සම්බන්ධ කරගෙන නාට්‍යයේ දර්ශනය ඉදිරියට රැගෙන යති.

නාට්‍යය අවසන් වන්නේ දර්ශනය නිර්මාණය කරනු ලැබුවේ මහජනයා ලෙස පෙනී සිටි නළුවන් විසින් බව මහජනයා නො දැන ය. එසේ නො වේ නම්, දර්ශනය අවසානයේදී පාත්‍ර වර්ගයා තමන් නළුවන් බව ද එය "සැබෑවක්" නොව, "රංගනයක්" බව ද හෙළිදරව් කිරීමේ හැකියාව ද තිබේ. නාට්‍යය අවසන් කිරීමෙන් පසු, සාකච්ඡා කරනු ලබන කාරණය අදාළ ද නැද්ද යන්න තේරුම් ගැනීමට කෙටි සාකච්ඡාවක් දිරි ගන්වනු ලැබේ. එහිදී ප්‍රශ්නය මහජන ඇසින් සාකච්ඡා කරනු ලැබේ.

*අදිස රංගය හෙවත් කඩාකප්පල්කාරී රංගය පෙන්වනු ලබන්නේ මහජන සංසදයක ය. සිදුවන්නේ නාට්‍යයක් පෙන්වීම බව ජනතාව දන්නේ නැත. නළුවෝ රඟපාන්නේ ජනතාව අතර ජනතාව ලෙස වෙස් වළාගෙන සිටිමිනි. නාට්‍යයෙන් නිරූපිත ප්‍රශ්නය සම්බන්ධයෙන් මැදිහත් වීම් සිදු වන්නේ ස්වාභාවික ප්‍රතිචාර ලෙස ය.*



## 3.5 පිළිවැයුම් රංගය (PLAYBACK THEATRE)

මෙම නව නිර්මාණාත්මක ක්‍රමය මගින් ප්‍රේක්ෂකයන්ට වේදිකාවට පැමිණ තම කතා හා පෞද්ගලික අත්දැකීම් බෙදා හදා ගැනීමට දිරි ගැන්වේ. මෙම කාලය තුළදී පහසුකාරකවරයා සහ නළුවෝ කතාවට අවධානයෙන් සවන් දී අවබෝධ කර ගනිති. අවසානයේදී සම්පූර්ණ කතාවක් උකහා ගත් බව තහවුරු කර ගැනීම පිණිස ප්‍රේක්ෂකයන් වෙත ප්‍රශ්න කීපයක් යොමු කරනු ලැබේ.

ඉන් පසු, නළු නිලියන් එක් වී ප්‍රේක්ෂකාගාරයේ සාමාජිකයා විසින් බෙදා හදා ගන්නා ලද අත්දැකීම පරාවර්තනය කරමින්, සංවාද, වැඩිදියුණු කරන ලද තාක්ෂණය, සංගීතය, ගීත සහ චලනයන් භාවිතා කරමින් එම කතාව රඟ දක්වනු ලැබේ. මෙය ප්‍රේක්ෂකයන්ට තමන්ගේ ජීවිත අත්දැකීම් මත පදනම් වූ තමන්ගේම අර්ථකථනය ආපසු රඟ දැක්වීමක් හෙවත් පිළිවැයුමක් බවට පත් වේ.

අවසානයේදී ප්‍රේක්ෂක සාමාජිකයාට සිය ප්‍රතිචාරය දැක්වීමට නැවත වේදිකාවට ආරාධනා කෙරේ. රඟ දක්වනලද කතාව ඔහු විසින් බෙදා හදා ගන්නා ලද අත්දැකීමට කෙතරම් යථාර්ථවාදී ලෙස සමීප වී ද යන්න විමසා බලනු ලැබේ.

*ප්‍රේක්ෂකයන් සිය ජීවන අත්දැකීම් බෙදා හදා ගන්නා අතර එම අත්දැකීම් මත පදනම්ව කතාවක් නිර්මාණය කරනු ලැබේ. එය නළු නිළියන් විසින් නාට්‍යමය ස්වරූපයෙන් නිරූපණය කරනු ලැබේ.*



**07 පින්තූරය: ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - තුන්වැනි අදියර / ගාල්ල දිස්ත්‍රික්කය / ඡායාරූපය: අස්ජේන් වහිඩ්**

## ඉදිරිපත් කළ හැකි ක්‍රියාකාරකමක් සලකා බලමු:

# රූප රංගය ප්‍රායෝගිකව

01. සහභාගිකයන් යුගලවලට බෙදන්න. එක් අයෙක් කලාකරුවා වන අතර අනෙකා මැටි පිඩ වේ.
02. පහසුකාරකවරයා විසින් දෙනු ලබන උපදෙස් අනුව, කලාකරුවා විසින් මැටි ගුලිය පීඩනය පිළිබඳ රූපයක් බවට පත් කරනු ලැබේ.
03. සියලු කලාකරුවෝ කාමරයේ එක් පැත්තකට පැමිණ, පීඩනයේ විවිධ රූපික ඉදිරිපත් කිරීම් නරඹති. ඉන් අනතුරුව, තමන් විසින් නිර්මානය කරන ලද රූපික ඉදිරිපත් කිරීම නො වන වෙනත් එකක් සමග එක් වී එහි පීඩකයාගේ රූපය තමා විසින් ම නිරූපණය කරති.
04. පහසුකාරකවරයාට මෙම රූප චලනයන්, ශබ්ද, වචන සහ දෙබස් භාවිතා කරමින් ක්‍රියාවට නැංවිය හැකි ය. එමගින් පීඩනයේ විවිධ ස්වරූප ගවේෂණය කරනු ලැබේ.

**ප්‍රධාන සංකල්ප**

| 01 | 02 | 03 | 04 |
|---|---|---|---|
| පීඩනය බහුත්ව සංකල්පයක් ලෙස තේරුම් ගත යුතු ය. එහි තේරුම 'දේශපාලනික පීඩිතභාවයේ' සීමාවෙන් ඔබ්බට විහිදේ. | පීඩිතයන්ගේ රංග කලාව යනු අසම්ප්‍රදායික රංග විලාසයකි. එය යොදා ගනු ලබන්නේ සංවාද ඇති කිරීමට සහ ප්‍රජා කේන්ද්‍රීයව ප්‍රශ්න විසඳීමට ය. එය සැලසුම් කර තිබෙන්නේ යමෙකු සමාජමය වශයෙන් සිටින වාතාවරණය පිළිබඳව සහ සම්ප්‍රදාය විසින් අප බැඳ දමා ඇත්තේ කෙසේද යන්න පිළිබඳව ඇති දනුම්වත්භාවය ප්‍රවර්ධනය කිරීමට ය. | ඔගස්ටෝ බෝආල් යනු පීඩිතයන්ගේ රංග කලාව හඳුන්වා දුන් ප්‍රමුඛයා ය. කෙසේ වෙතත්, දේශීය සංදර්භයන් තුළ තිබෙන ඒ හා සමාන රංග ස්වරූපයන් අප හඳුනා ගත යුතු ය. | පීඩිතයන්ගේ රංග කලාව විසින් ප්‍රේක්ෂකයන්ට නාට්‍යයෙන් නිරූපිත ප්‍රශ්න සම්බන්ධයෙන් සක්‍රියව සම්බන්ධ වීම සඳහා සහ විකල්ප විසඳුම් ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රමුඛ ස්ථානයක් ලබා දෙයි. |

# අරමුණු සහ විශ්වාස

පීඩිතයන්ගේ රංග කලාව පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය විසින් එම රංග කලාවේ මූලධර්ම ප්‍රකාශයට පත් කිරීමක් සිදු කරන ලදී. එය පීඩිතයන්ගේ රංග කලාවේ ප්‍රධාන අරමුණු සහ විශ්වාසයන් පිළිබඳ සංක්ෂිප්ත සාරාංශයක් සපයයි.

## 08

සියලු මානවයන් තම දෛනික ජීවිත තුළදී භාවිතා කරන්නේ නළුවන් වේදිකාව මත භාවිත කරන භාෂාව ම ය. ඔවුන්ගේ හඬ, සිරුරු, චලනයන් සහ ප්‍රකාශනයන් මගින් ඔවුහු සිය හැඟීම් හා ආශාවන් රංගමය භාෂාවට (Theatrical Language) පරිවර්තනය කරති.

## 07

මිනිසුන් රංගනය සඳහා තම ධාරිතාව හා අවශ්‍යතාව මොහොතකට අතහරිමින් යම් වස්තුවක්, පුද්ගලයෙක් හෝ අවකාශයක් නිරීක්ෂණය සඳහා තමන්ව සීමා කර ගන්නා විට, රංගනයෙහි ලා ඔහුගේ ශක්තිය හා ආශාව ඉහත අවකාශය, පුද්ගලයා හෝ වස්තුව කරා මාරු කෙරේ. ඒ අවකාශය ඇතුළත අවකාශයක්, එනම් සෞන්දර්යාත්මක අවකාශයක් බිහි කරමිනි. වෛෂයික රංගය (Objective Theatre) යනු මෙයයි.

## 06

ආවශ්‍යක රංගය (Essential Theatre) මූලිකාංග තුනකින් සමන්විත වේ. ආත්මීය රංගය (Subjective Theatre) වෛෂයික රංගය (Objective Theatre) සහ රංගමය භාෂාව (Theatrical Language) වශයෙනි.

## 05

සෑම මනුෂ්‍යයකුට ම රඟපෑමේ හැකියාව තිබේ. පැවැත්ම සඳහා අපට ක්‍රියාවන් උත්පාදනයටත්, එම ක්‍රියාවන් හා පරිසර කෙරෙහි ඒවායේ බලපෑම් නිරීක්ෂණය කිරීමටත් අවශ්‍යයෙන්ම සිදු වේ. මනුෂ්‍යත්වයට පත් වීමය. රංගය බවට පත් වීමය. එකම පුද්ගලයා තුළ නළුවාගේත් ප්‍රේක්ෂකයාගේත් සහ පැවැත්ම ය. මෙය ආත්මීය රංගයයි. (Subjective Theatre)

01

පීඩිතයන්ගේ රංග කලාව යනු ආවශ්‍යක රංගය (Essential Theatre) පිළිබඳ මූලධර්ම මත පදනම් වූ රංග අභ්‍යාස, ක්‍රීඩා සහ ක්‍රමශිල්ප පද්ධතියකි. එමගින් ගැහැණුන්ට හා මිනිසුන්ට තමන් තුළම දැනටමත් තිබෙන දේ සංවර්ධනය කර ගැනීමට උපකාර කෙරේ.

02

පීඩිතයන්ගේ රංග කලාවේ මූලික අරමුණ මනුෂ්‍යත්වය මානුෂීය කිරීමයි.

03

සෑම මානවයෙකු ම රංග ශිල්පියෙකි.

04

රංගය අර්ථකථනය කරනු ලබන්නේ නළුවන්ගේත් ප්‍රේක්ෂකයන්ගෙත් එකම අවකාශයේ පවත්නා සමගාමී පැවැත්මක් ලෙසයි. සෑම මානවයකුට ම තත්වය දැකීමට සහ තමන් එම තත්වය තුළ සිටින ආකාරය දැකීමට හැකියාව තිබේ.

## 16

ලොව ජාතීන් අතරින් අඩක් පමණ දැන් පීඩිතයන්ගේ රංග කලාව භාවිතා කරති. තමන් පිළිබඳ හා අනෙකා පිළිබඳ ගවේෂණය කිරීමටත්, අපගේ ආශාවන් පැහැදිලි කිරීමට හා ප්‍රකාශ කිරීමටත්, අසන්තෝෂය හා වේදනාව ඇති කරන තත්වයන් සාමය ඇති කරන තත්වයන් බවට වෙනස් කිරීමේ මෙවලමක් ලෙසත්, පුද්ගලයන් හා සමූහයන් අතර වෙනස්කම්වලට ගරු කිරීමටත්, සියලු දෙනා සංවාදයට ඇතුළත් කර ගැනීමටත් එය යොදා ගනු ලැබේ. අවසානයේදී එය සැබෑ ප්‍රජාතාන්ත්‍රික ක්‍රමයක පදනම වන ආර්ථික හා සමාජ යුක්තිය දිනා ගැනීමේ මෙවලමක් ද වේ. කෙටියෙන් කිවහොත්, පීඩිතයන්ගේ රංග කලාවේ සාමාන්‍ය අරමුණ වන්නේ අත්‍යවශ්‍ය මානව හිමිකම් සංවර්ධනය කිරීමයි.

## 15

පීඩිතයන්ගේ රංග කලාව යනු දෘෂ්ටිවාදයක් හෝ දේශපාලන පක්ෂයක් නොවන අතරම ආධානග්‍රාහීව වැළඳ ගත යුත්තක් හෝ බලහත්කාරයක් ද නො වේ. එය සියලු සංස්කෘතීන්ට ගරු කරයි. එය විශ්ලේෂණ ක්‍රමයකි. ප්‍රීතිමත් සමාජයන් ඇති කිරීමේ ක්‍රමයකි. එහි මානුෂීය සහ ප්‍රජාතාන්ත්‍රික ස්වභාවය නිසා, එය ලොව පුරා ම අධ්‍යාපනික, සංස්කෘතික, කලාත්මක, දේශපාලනික, සමාජමය, මනෝ ප්‍රතිකාරමය, සාක්ෂරතා හා සෞඛ්‍යමය වැඩසටහන්වලදී පුළුල් ලෙස යොදා ගනු ලැබේ.

## 14

පීඩිතයන්ගේ රංග කලාව එහි නමින් ම කියැවෙන ආකාරයට, මිනිසුන් මානුෂීය ව්‍යායාමයන් වෙනුවෙන් ක්‍රියාත්මක කරවන්නට උත්සාහ දරයි. එනම් පීඩිතයන් විසින් පීඩිතයින් උදෙසා වන රංගයයි. එය වනාහි ජනයාට රංගයේ ප්‍රබන්ධය තුළ නායක පාත්‍රයින් වන්නට හැකියාව ලබා දෙන ක්‍රමයකි. ඔවුන්ට තමන්ගේ ජීවිත තුළ ම රඟපෑමේ අවස්ථාව ලැබේ.

## 13

පීඩිතයන්ගේ රංග කලාව යනු ලෝක ව්‍යාප්ත අවිහිංසාවාදී සෞන්දර්ය ව්‍යාපාරයකි. එමගින් ඇති කිරීමට බලාපොරොත්තු වන්නේ සාමය මිස නිෂ්ක්‍රීයත්වය නොවේ.

පීඩිතයන්ගේ රංග කලාව විසින් සෑම කෙනෙකුට ම ඔවුන්ගේ වර්තමාන සංදර්භය තුළ තම අතීතය විශ්ලේෂණය කිරීම සඳහාත්. ඉන්පසු අනාගතය නිර්මාණය වන තුරු නො සිට එය අලුතෙන් නිර්මාණය කිරීම සඳහාත් සෞන්දර්යාත්මක ප්‍රවේශයක් ලබා දෙයි. පීඩිතයන්ගේ රංග කලාව මානවයන්ට තමන් සතුව දැනටමත් තිබෙන භාෂාවක් නැවත ගොඩනගා ගන්නට උපකාර වෙයි. රංගනයේ යෙදීමෙන් අපි සමාජයේ ජීවත් වන හැටි උගනිමු. හැඟීම් ඇති කර ගැනීමෙන් ම අපි හැඟිය යුතු ආකාරය උගනිමු. සිතීමෙන් සිතන ආකාරය උගනිමු. රඟපෑමෙන් රඟපාන හැටි උගනිමු. පීඩිතයන්ගේ රංග කලාව යනු යථාර්ථයට අභ්‍යාසයකි.

09

පීඩිතයන් යනු සමාජමය, සංස්කෘතිකමය, දේශපාලනිකව, ආර්ථිකව, ලිංගිකව හෝ වෙනත් ආකාරයකින් සංවාදයට ඇති තම අයිතිය අහිමි කරන ලද හෝ වෙනත් ආකාරයකින් එම හිමිකම් අභ්‍යාස කිරීම අඩපණ කෙරුණු පුද්ගලයන් හෝ පුද්ගල සමූහයන් ය.

10

සංවාදය අර්ථකථනය කර තිබෙන්නේ පුද්ගලයකු හෝ සමූහයක් ලෙස වෙනත් අය සමග කරනු ලබන නිදහස් හුවමාරුවක් ලෙසයි. එය සමානයකු ලෙස මානව සමාජයේ සහභාගි වන්නට ද, වෙනස්කම්වලට ගරු කරන්නට ද, ගෞරවයට ලක් වන්නට ද ඉවහල් වේ.

11

පීඩිතයන්ගේ රංග කලාව පදනම් වන්නේ සියලු මිනිස් සම්බන්ධතා සංවාද ස්වරූපයක තිබිය යුතු ය යන මූලධර්මය මත ය. එම සංවාදය මිනිසුන් හා ගැහැණුන් අතර, ජන වර්ග අතර, පවුල් අතර, කණ්ඩායම් හා ජාතීන් අතර පැවතිය යුතු දෙයකි. යථාර්ථයේදී සියලු සංවාදයන් ඒකල භාෂණ බවට පත් වීමේ ප්‍රවණතාව සහිත ය. එමගින් ඇති වන්නේ පීඩක-පීඩිත සම්බන්ධතාවයි. මෙම යථාර්ථය අවබෝධ කර ගැනීමෙන් පීඩිතයන්ගේ රංග කලාව විසින් අපේක්ෂා කරනු ලබන්නේ මිනිසුන් අතර සංවාදය නැවත ඇති කිරීමටයි.

12




08 පින්තූරයː ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - සිව්වැනි අදියර / වවුනියාව දිස්ත්‍රික්කය / ඡායාරූපයː ඇලෙක්සැන්ඩර් කැමිලස්

# 04

# සංසද රංග කලාව

සෑම මානවයකු ම නළුවා සහ ප්‍රේක්ෂකයා එකක්ම වන ස්වයංපූර්ණ රංගයකැයි ඔගස්ටෝ බෝආල් විශ්වාස කළේ ය. අපට අපගේ ක්‍රියාවන් විමර්ශනයට ලක් කිරීමේ හැකියාව ඇත. ලෝකයට වාසි වන ආකාරයට බලපෑම් සහගත ප්‍රතිඵලයක් ඇති කළ හැකි වන සේ අපට ඒවා වෙනස් කළ හැකි ය. එබැවින් සංසද රංග කලාව නිර්මාණය කර තිබෙන්නේ තමන් ක්‍රියාකාරී වන අතරතුර ම තමන්ව නිරීක්ෂණය කරමින් ක්‍රියාමාර්ග ගැනීමේ ලා සෑම මිනිසකු ම සතු සහජ ලක්ෂණය හඳුනා ගනිමිනි. ඔහුට අනුව රංග කලාව යනු දැනුම් ස්වරූපයකි. එයට සමාජය පරිවර්තනය කළ හැකි ය. එසේ කළ යුතු ය. අනාගතය ඉබේ ම නිර්මාණය වන තුරු සිටිනවා වෙනුවට, රංග කලාවට අපගේ අනාගතය ගොඩ නඟා ගැනීමට අපට උපකාර කළ හැකි ය.

*සාමාන්‍යයෙන් සංසද රංග කලාවේ මූලික තේමාව*
*වන්නේ ප්‍රේක්ෂකයන්ට සමීප අදාළත්වයක් ඇති දෙයකි.*
*එය බොහෝ විට බෙදා හදා ගත් ජීවන අත්දැකීමක් මත පදනම් වනු ඇත.*
*එය ඓතිහාසිකව පාවිච්චි වී ඇත්තේ පීඩනය, අසමානතාව,*
*අයුක්තිය හා ව්‍යසනය පිළිබඳ සාකච්ඡා කිරීම වෙනුවෙනි. ඉස්මතු වෙමින් පවතින නව ප්‍රවණතා අනුව,*
*සංසද රංග කලාව යනු ගැටුම් පරිවර්තනය සඳහා සහ බහුත්වවාදී හා ප්‍රජාතාන්ත්‍රික*
*වටිනාකම් උදෙසා ක්‍රියා දිශාභිමුඛ විවාදයක් වෙනුවෙන් හොඳ ම විකල්ප මාර්ග*
*ගවේෂණය කිරීම සඳහා විවිධ විශ්වාසයන්, වාර්ගික හා ආගමික පසුබිම් ඇති*
*පුද්ගලයන් යොමු කිරීම සඳහා භාවිතා කළ හැකි මෙවලමකි. එහි එක ම අරමුණ අනිවාර්යයෙන් ම*
*පරමාදර්ශී විසඳුම් සෙවීම විය යුතු නැත. එමගින් තත්වය විශ්ලේෂණය කිරීමට*
*ප්‍රේක්ෂකයන් යොමු කළ හැකි ය. මර්දනයට මුහුණ දීම සඳහා මූලෝපායන් අත්හදා බැලිය හැකි ය.*
*සමාජ ප්‍රශ්නවලට සාධනීය හා කල්පනාකාරී ප්‍රවේශයන් ගවේෂණය කළ හැකි ය.*

සරලව කියන්නේ නම්, සංසද රංග කලාව යනු නායක පාත්‍රයකු (Protagonist) වටා ගොඩනැගෙන නාට්‍යයකි. එම පාත්‍රයා විරුද්ධවාදියකුගේ හෝ විරුද්ධවාදීන්ගේ (Antagonist) මර්දනයට, බාධාවන්ට මුහුණ දෙයි. කතාවෙන් නිරූපණය වන ආකාරයට ඒවා නායක පාත්‍රයාගේ ජීවිතයට දැඩි බලපෑමක් ඇති කරයි. මෙම කෙටි කතාව විසින් ගවේශනය කරනු ලබන්නේ මෙම නායක පාත්‍රයාට මුහුණ දීමට සිදු වන දුෂ්කරතා සහ මර්දනයයි. නාට්‍යය විසින් නරක ම තත්වයන් නිරූපණය කරනු ලබන අතර, එහිදී ප්‍රේක්ෂකාගාරය හා ප්‍රධාන චරිතය අතර සම්බන්ධතාවක් ඇති කෙරේ. එමගින් එම චරිතයට උපකාර කිරීමේ උනන්දුවක් ප්‍රේක්ෂකයා තුළ ඇති කරනු ලැබේ. ගැටුම් පරිවර්තනය කිරීමේ සහ ප්‍රජාතාන්ත්‍රික සහ බහුත්වවාදී වටිනාකම් ග්‍රහණය කර ගැනීමේ විවාදවලදී ද පවා මූලික කතාව එසේ ම වේ.

මාතෘකාවෙන් ම නිරූපණය වන ආකාරයට, සංසද රංග කලාව යනු ස්වයං විස්තර සහිත කලාවකි. එහිදී රංගකලා මූලිකාංගවලට මූලධර්මවලට මෙන් ම සංසද සාකච්ඡාවට සහ විවාදයට ද සමාන අවධාරණයක් සිදු වේ. එමගින් සෘජු අන්තර් ක්‍රියාකාරිත්වයක් ඇති කර ගැනීමට සහ නාට්‍යය ගැන විවාද කිරීමට ප්‍රේක්ෂකයාට වේදිකාවක් සැපයේ. එය සමාජ මැදිහත් වීම උදෙසා වටිනාකම මිනිය නො හැකි තරම් වූ මෙවලමක් බවට පත් වේ.

ආරම්භයේදී නාට්‍යය වරක් රඟ දක්වනු ලබන්නේ ප්‍රේක්ෂකයන් වෙනුවෙනි. එහි ඇති ප්‍රශ්නය විසඳීම පිණිස ඇති කළ යුතු වෙනස්කම් සම්බන්ධයෙන් ඊළඟට සාකච්ඡාව ආරම්භ වේ.

ප්‍රේක්ෂකයන් හා වේදිකාවේ නළුවන් අතර මැදිහත් වීම පවත්වාගෙන යන්නේ ජෝකර් (Joker) ලෙස නම් කරන ලද චරිතයක් විසිනි. ප්‍රේක්ෂකාගාරයේ සාමාජිකයන්ට මැදිහත් විය හැකි ආකාරය ඔහු විසින් කළමනාකරණය කරනු ලැබේ. ජෝකර් චරිතයේ පරිණාමය වන ස්වරූපය සැලකිල්ලට ගත් විට, මෙම අත්පොතෙහිදී එම චරිතය 'පහසුකාරකවරයා' ලෙස හැඳින්වීම වඩා සුදුසු ය. ප්‍රේක්ෂක නළුවන් බවට පත් වීම සඳහා ප්‍රේක්ෂකාගාරයට උපදෙස් දී ඇති අතර මැදිහත් විය හැකි අවස්ථාවක් අත ඔසවා නවත්වන්නැයි කීමෙන් යෝජනා කළ හැකි ය.

මර්දනය යනු මානව ජීවිතයේ පොදු යථාර්ථයකි. එය සමාජයේ සෑම තැනක ම තිබේ. බොහෝ විට, මර්දනයට මුහුණ දෙන අය විෂමතාවන්ගේ, අයුක්තියේ, ගැටුම්වල සහ නිදහස් ප්‍රකාශනයට අවකාශය නැති වීමේ ගොදුරු වෙති. එවැනි තත්වයන්වලදී, හඬක් නැති හා බලය නැති ජනතාව ගොදුරු බවට පත් වෙති. වෙනස් කොට සැලකීම වැරදි බව වටහා ගැනීමට අවශ්‍ය සමාජ සවිඥානකත්වය ඔවුන්ට නැති වන්නට පුළුවන්. ගවේෂණය හා විවාදය හරහා, සංසද රංග ක්‍රියාවලියට ඔවුන්ට බලසතු වීම පිළිබඳ හැඟීමක් ඇති කළ හැකි ය. ඒ ඔස්සේ ඔවුන්ට අසමානතා, ප්‍රචණ්ඩත්වය හා හඬක් නැතිකමට මුහුණ දිය හැකි ය. එසේම, ඇතැම් සංසද රංගන අභ්‍යාසවලදී සහභාගිකයන් විසින් තමන්ගේ පෞරුෂය හා සම්බන්ධ සාධක ගවේෂණය කළ යුතු ය. සහභාගිකයන්ට හා සෙසු අය පිළිබඳ දැක්මත්, සමාජයේ තම ස්ථානයත් ගවේශනය කිරීම සඳහා අතීත අත්දැකීම් ද ඉවහල් විය හැකි ය.



09 පින්තූරයः ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - දෙවැනි අදියර / මහනුවර දිස්ත්‍රික්කය / ඡායාරූපයः මොහොමඩු අස්වර්

*නායක පාත්‍රයා (Protagonist) හෙවත් වීරයා යනු ලියන ලද හෝ රඟ දක්වන ලද කතාවේ මූලික චරිතයයි. කතාවේ මධ්‍යයේ සිටින එම චරිතය විසින් කතාව චලනය කිරීමට අදාළ වැදගත් තීරණ ගනු ලැබේ. එසේම, එම තීරණවල ප්‍රතිඵල ද වීරයා විසින් විඳ දරා ගනු ලැබේ.*

*එදිරිවාදියා යනු එක් චරිතයක් හෝ චරිත සමූහයක් විය හැකි ය. වීරයාට බාධා හා අභියෝග නිර්මාණය කරන්නේ එදිරිවාදියා විසිනි. බොහෝ විට, මෙම චරිතය කතාවේ දුෂ්ටයා ලෙස සැලකේ.*

**ක්‍රියා සංකල්ප**

| 01 | 02 | 03 | 04 |
|---|---|---|---|
| සංසද රංග කලාව යනු ප්‍රධාන චරිතයක් වටා ගොඩනැගෙන කෙටි නාට්‍ය වේ. සංසද රංගයේ කතාව මර්දනයක් හෝ සමාජ ගැටුමක් පිළිබඳ විය හැකි ය. | එමගින් නාට්‍යයේ වීරයා සිය බල රහිතභාවය නැති කර ගැනීමට හා අර්බුදය විසඳා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ සිතන්නට ප්‍රේක්ෂකයා යොමු කෙරේ. | නාට්‍යය පහසුකාරකවරයකු විසින් මෙහෙයවනු ලැබේ. නළුවන් හා ප්‍රේක්ෂකයන් අතර පාලම වන්නේ පහසුකාරකවරයා ය. සම්ප්‍රදායිකව පහසුකාරකවරයා හැඳින්වුණේ ජෝකර් ලෙස ය. | නරඹන නළුවන් විසින් නාට්‍යය නැවත රඟ දක්වනු ලැබේ. ප්‍රධාන චරිතය බලසතු වන්නට හා එම චරිතය මුහුණ දෙන බල රහිතබව නැති කර ගැනීම සඳහා යෝග්‍ය යයි ඔවුන් සිතන යථාර්ථවාදී විසඳුම් එහිදී රඟ දැක්වේ. |






10 පින්තූරයඃ ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - සිව්වැනි අදියර / වවුනියාව දිස්ත්‍රික්කය / ඡායාරූපයඃ ඇලෙක්සැන්ඩර් කැමිලස්

# 05

# සංසද රංග කලාවේ ලක්ෂණ

**කලින් ද දක්වන ලද ලෙස සංසද රංග කලාවෙහි සුවිශේෂ ලක්ෂණ තිබේ. එයින් සමහරක් මෙසේ යඃ**

## 5.1 ප්‍රකාශනයේ නිදහස දිරි ගැන්වීම

රඟපාන්නන්ගේ පමණක් නොව, ප්‍රේක්ෂකයන්ගේ ද ප්‍රකාශනයේ නිදහස දිරි ගැන්වීමේ සුවිශේෂ හැකියාවක් සංසද රංගයට තිබේ. වැදගත් ම කාරණය වන්නේ එය විසින් අයුක්තියට එරෙහි වීමේදී හා විකල්ප විසඳුම් සෙවීමේදී නිදහස් ප්‍රකාශනයේ වැදගත්කම අවබෝධ කර ගැනීමට ප්‍රේක්ෂකයා දිරි ගැන්වීමයි.

**හඬක් නැති අයගේ හඬ වීම:** සංසද රංගයෙහි මූලික තේමාව වන්නේ පීඩිතයන් බලසතු කිරීමයි. පීඩිතයන් පීඩනයෙන් මුදා ගැනීමයි. ප්‍රේක්ෂකයන්ට බල රහිත බව තේරුම් ගැනීමට වේදිකාවක් සපයනු ලබන අතර, ප්‍රේක්ෂකාගාරයේ සාමාජිකයන්ට ඉදිරියට පැමිණ ප්‍රතිඵලය වෙනස් කිරීම සඳහා ප්‍රායෝගික ක්‍රියාමාර්ග ගැනීමට ඔවුන් දිරි ගැන්වේ. නිවැරදි ප්‍රශ්නය ඇසීමට ප්‍රේක්ෂකයන්ට ඉඩ දීම නිවැරදි පිළිතුරු හැඩගස්වා ගැනීමෙහි අතිශයින්ම වැදගත් වේ.

**ස්වයං විවේචනය:** සංසද රංග රඟ දැක්වීම්වල දී ප්‍රේක්ෂකයන් විසින් නළුවන්ව විස්ථාපනය කරමින් ප්‍රේක්ෂක නළුවන් ලෙස තමන්ම වේදිකා ගත වන අතර, මෙකී ප්‍රේක්ෂක නළුවෝ විචාරශීලී ලෙස ගවේෂණය කරන ප්‍රශ්නය නම්, ''බලසතු වීමට අවශ්‍ය කාට ද? සාධනීය වෙනස්කම් ඇති කළ හැක්කේ කාට ද?'' යන්න ය. තම සංවේදනාවන් ගැඹුරින් භාවිතා කිරීම සඳහා සංසද රංගය ප්‍රේක්ෂකයා පොළඹවයි. සාමාන්‍ය සාකච්ඡාවලදී අවශ්‍ය වෙනවාට වඩා විචාරශීලී ආවර්ජනයක් සංසද රංගයේදී අවශ්‍ය වේ.

**ස්වකීයත්ව අනාවරණය:** සංසද රංගයේ තවත් ප්‍රධාන ලක්ෂණයක් වන්නේ එමගින් ප්‍රේක්ෂාගාරයට ස්ව-අනාවරණය සඳහා අවස්ථාව ලබා දීමයි. බල රහිතබව අවබෝධ කර ගැනීමට අමතරව, එයට හේතුත්, බල රහිතබව නැති කර ගැනීමේ නිර්මාණාත්මක විධිත් කෙරෙහි එහි දී අවධානය යොමු කෙරේ. තත්වයන් කෙරෙහි විචාරාත්මක වීමෙන් ප්‍රේක්ෂකයන්ට තමන් ම තේරුම් ගැනීමට උපකාර කරනු ලැබේ. එය පුද්ගල පරිවර්තනයේ පළමු පියවරයි.

## 5.2 අයුක්තිය ආමන්ත්‍රණය කිරීම

සංසද රංගය විසින් සාමාන්‍යයෙන් කරනු ලබන්නේ සැබෑ ජීවිතයේ පවතින සැබෑ මිනිසුන් විසින් මුහුණ දෙනු ලබන කිසියම් ප්‍රශ්නයක් හෝ ගැටලුවක් මතු කර දැක්වීමයි. එමෙන් ම, වැන්දඹුවන්, ළමයින්, ගෘහණියන්, ආබාධ සහිත ජනයා ආදී ඇතැම් ප්‍රජාවන් සමාජය විසින් මර්දනයට ලක් කරන හෝ කොන් කරන ආකාරය ද එමගින් නිරූපණය වේ.

## 5.3 විකල්ප ක්‍රියාමාර්ග සෙවීමට තිබෙන සාමූහික ආශාව කුළුගැන්වීම

සංසද රංගය ඉලක්ක කරන්නේ සමාජ ප්‍රශ්න හේතුවෙන් පීඩාවට පත්ව සිටින ප්‍රජාවන් ය. නාට්‍යයේ නිරූපණය වන සියලු චරිත ප්‍රජාවේ පිළිබිඹුවකි. එහිදී තමන්ගේ ම ප්‍රශ්නවලට විසඳුම් සොයා ගැනීම සඳහා ඇති සාමූහික ආශාවන් ප්‍රජාව තුළ ම අභිප්‍රේරණය කරනු ලැබේ. විකල්ප විසඳුම් සොයා ගැනීමට ප්‍රජාව දිරි ගනුවනු ලැබේ. එහිදී ප්‍රජාවේ සාමයට බාධා වන ප්‍රචණ්ඩත්වය හා ආක්‍රමණශීලිත්වය පිටු දකිනු ලැබේ. සමාජ ප්‍රශ්න අරභයා සාධනීය හා කල්පනාකාරී ලෙස තෝරා ගත් ප්‍රවේශයන්ට පහසුකාරකත්වය සපයනු ලබන්නේ මෙම අවකාශය විසිනි.

## 5.4 විසඳුම් දිරි ගැන්වීම

සංසද රංගයේ අරමුණ සැමවිට ම විසඳුම් සෙවීම ම නොවේ. අයුක්තිය සහ එයට හේතු ගැඹුරින් තේරුම් ගැනීම ද නිසි වැදගත්කම සහිතව අවධාරණය කරනු ලැබේ. මහජනයාගේ හැකියාවන නිර්මාණශීලී ලෙස සහ සම්බන්ධීකරණය සහ මිනිසුන්ට උපකාරී වීම සඳහා සවිචාරවත් සම්මුතිය බල මුළුගැන්වීම මඟින් අපේක්ෂා කරන්නේ එක් විසඳුමක් නොව විසඳුම් බොහොමයකි.

## 5.5 මහජනයා වෙත යළි බලය හුවමාරුව

සංසද රංග කලාවේදී එහි ව්‍යුහාත්මක විභවයන් හේතුවෙන් ප්‍රේක්ෂක නළුවන් ද සෙසු නළුවන් තරම් ම වැදගත් වේ. සංසද පසුබිම තුළ ඔවුන් ද සමානව බලවත්ය. සංසද රංග නිර්මාණ ක්‍රියාවලිය විසින් ඔවුන්ට ගැඹුරු අවබෝධයක් ඇති කර ගැනීමට බලය හා අවකාශය ලබා දෙයි. දැන් අපි ප්‍රේක්ෂක නළුවන් මෙම ක්‍රියාවලියෙහි හිමිකාරිත්වය හා පාලනය අත්පත් කර ගැනීමෙහි ස්වභාවයන් කීපයක් අධ්‍යයනය කරමු.

**පිටපත:** බොහෝ සංසද රංග ව්‍යාපෘතිවලදී, පිටපත නිර්මාණය වන්නේ ඉලක්ක ප්‍රේක්ෂකයන් සමග ගැඹුරින් සම්බන්ධ වීම හරහා කරනු ලබන පර්යේෂණයක ප්‍රතිඵලය ලෙසයි. ඇතැම් 'අවස්ථාවලදී පිටපත් ඉලක්ක ප්‍රජාවේ සාමාජිකයන්ට ලබා දී, කියවීමට සලස්වා වලංගුතාව පරීක්ෂා කර ගනු ලැබේ. එසේම සංසද රංගයේ රංගගත කිරීම අතරතුරදී ද ප්‍රේක්ෂකයන්ට කතාව තව දුරටත් වෙනස් කිරීමට අවස්ථාව ලැබේ.

**නළුවෝ:** සම්ප්‍රදායික රංග කලාවන්හිදී මෙන් නොව, නළුවන්ට වේදිකාවේ සම්පූර්ණ පාලන බලය නැත. එහෙත්, ප්‍රේක්ෂක නළුවන්ට එය ඇත. ඔවුහු සංවාදයට මග පෙන්වන, ක්‍රියාවන් වෙනස් කරන සහ සමස්ත නාට්‍යයේ ම ප්‍රතිඵලය වෙනස් කිරීමෙහි බලය ඇති නළුවන් බවට පත් වෙති.

**මැදිහත් වීමේ යාන්ත්‍රණ:** තමන් කැමති ඕනෑම අවස්ථාවකදී නාට්‍යය නැවැත්වීමේ හිමිකම තිබේ. ඔවුන්ට නාට්‍යය නවත්වා අදහස්, ප්‍රතිචාර දැක්වීමට, මැදිහත් වීමට හා තත්වයන් වෙනස් කිරීමට පුළුවන. මැදිහත් වන අදියරේදී නරඹන නළුවෝ ඇගයීම්කරුවන්ගේ භූමිකාව ගනිති. ඔවුහු කෙළින් ම සංසද රංග නිෂ්පාදනය ක්‍රියාත්මක කරන්නන්ව විමසීමේ හා ඇගයීමේ ක්‍රියාවලියට දායක වෙති.

**පසුබිම:** සංසද රංග රඟ දැක්වීමක් ජනයා ඒකරාශී කර ගත හැකි ඕනෑ ම පසුබිමක සිදු කළ හැකි ය. එය පාලනය කරන ලද පරිසරයක් වීම අත්‍යවශ්‍ය නැත. එය ආපන ශාලාවක, ක්‍රීඩා පිටියක, බස් නැවතුම්පොළක මෙන් ම වීදියක පවා සිදු විය හැකි ය. එහිදී නළු නිළියන් හෝ නිෂ්පාදක කණ්ඩායම නොව, පොදු ප්‍රේක්ෂකයා පරිසරය සමග පහසුවෙන් මුසු වේ.

## 5.6 මහජන සහභාගීත්වයෙන් පැවතීම

අදහස් හා පෞද්ගලික අත්දැකීම් මගින් ඇති කරනු ලබන තේරීම් විමර්ශනය කිරීමට රඟපාන්නන් සහ ප්‍රේක්ෂක නළුවන් සහභාගි වේ. සමාජ වෙනස්කම් ජනනය කිරීම සඳහා එක්වන ජනයා අතර සහයෝගිතා හැඟීමක් එයින් බෙදා හදා ගනු ලැබේ.

මෙම අත්පොත සම්පාදනය කරනු ලැබුවේ සමානාත්මතාව සහ වෙනස් කොට සැළකීම් හා සම්බන්ධ ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීම සඳහා සංසද රංග කලාව මෙවලමක් ලෙස යොදා ගැනීමට උපකාර පිණිස වුවද. මෙම ක්‍රියාවලිය බොහෝ විවිධාකාර පරිසරයන්හි භාවිතා කළ හැකි ය. ප්‍රජා මධ්‍යස්ථානවල සියලු වයස් කාණ්ඩවල ජනයා සමග, සේවා ස්ථානවල සහ පාසල්වල, නිවාස අහිමි, ආබාධ සහිත හෝ වෙනත් ඕනෑම ආකාරයක ජනයා සමග එය භාවිතා කළ හැකි ය. සංසද රංග කලාව විසින් ජනයා දිරිමත් කරනු ලබන්නේ හුදු වාචික විසඳුම්වලට නොව ක්‍රියාකාරීත්වය පෙරදැරි විසඳුම්වලට ය.

## 5.7 සුවිසල් ම වාසිය වන නම්‍යශීලිත්වය භාවිතය

සංසද රංග කලාව යොදා ගැනීමෙහි ඇති විශාලතම වාසිය වන්නේ සමාජ ප්‍රශ්නයක් නිරූපණය කරන ඕනෑම තත්වයක් තුළ නම්‍යශීලී ලෙස කටයුතු කිරීමෙහි ලා එය සතු ස්වාභාවික හැකියාවයි. ජනතාව වෙත ළඟා වීමෙහි ලා එයට කිසිදු නීතියක් හෝ බාධාවක් හෝ නැත. එබැවින් එය ජංගම වේදිකාවක් මත සිදු කෙරෙන වීදි නාට්‍ය රඟ දැක්වීමක් ලෙස මෙන් ම, සංවෘත ශාලාවක ස්ථාවර වේදිකාවක ද රඟ දැක්විය හැකි ය. එසේම,ප්‍රාසාංගික කලා ගැන සීමිත අවබෝධයකින් වුව ද සූදානම් කිරීම් කර ගත හැකි ය. එහෙත්, සංසද රංග කලාව ගැන මූලික දැනුමක් අවශ්‍ය ය. ලබා ගත යුතු අලුත් දැනුම නම් සංවාදයට භාජනය වන ප්‍රශ්නය සම්බන්ධ දැනුමයි.

බොහෝ විට, සංසද රංග රඟදැක්වීම් පොදු ජනයා වෙත ගෙන එන්නේ ප්‍රජාවෙන් ම තෝරා ගත් නළු නිළියන් විසිනි. එබැවින් ඔවුන් වෘත්තීය නළු නිළියන් ලෙස සැලකිය නොහැකි ය. එහෙත්, එමගින් කතා පෙළෙහි අව්‍යාජත්වය ඔසවා තබන බැවින් නාට්‍යයෙහි කාර්යක්ෂමතාව වඩා වැඩි ය. එයට හේතුව, එය ඉදිරිපත් කරනු ලබන්නේ ප්‍රේක්ෂකයන්ට හුරුපුරුදු මිනිසුන් විසින් වීමයි. ඒ හේතුවෙන් නළුවන් සහ ප්‍රේක්ෂකයන් අතර පරතරය තවත් අඩු වේ.

එසේම, සංසද රංගය විසින් දිරි ගන්වනු ලබන තවත් අංශයක් වන්නේ රංග භාණ්ඩ, ඇඳුම්, සංගීතය හා ගීතවල අවම භාවිතයයි. හේතුව, ඒවා නළුවන් හා ප්‍රේක්ෂකයන් අතර පරතරය වැඩි කිරීමට ඉවහල් විය හැකි දේ වීමයි. එබැවින් සංසද රංගයෙහි මූලික රීතිය වන්නේ සරලත්වය යි.

# ප්‍රධාන සංකල්ප

**01**

සංසද රංගය විසින් ප්‍රකාශනයේ නිදහස, සිතීමට නිදහස දීම, මත දැරීමේ අයිතිය, ඒවා ප්‍රකාශ කිරීම සහ ස්වකීයත්වය ගවේෂණය දිරි ගන්වනු ලැබේ. එසේ කරනු ලබන්නේ ප්‍රේක්ෂකයන්ට කරළිය අරා සිටීමට දිරි ගැන්වීමෙනි. එමගින් විවිධ මතවාදී කණ්ඩායම් අතර සහකම්පනයක් ඇති කරනු ලැබේ.

**02**

සම්ප්‍රදායික රංග කලාව මෙන් නොව, සංසද රංග කලාව මගින් බලය නැවත මහජනයා වෙත ලබා දෙනු ලැබේ. එය කරනුයේ නළුවන්, පිටපත, කතා වින්‍යාසය සහ පසුබිම වෙනස් කිරීමට ජනතාවට අවස්ථාව ලබා දීමෙනි. එහිදී ඔවුන්ට තමන් කැමති ප්‍රමුඛතා අනුව හා එය ඔවුන් දකින්නට කැමති ආකාරය අනුව එය සිදු කරනු ලැබේ.

**03**

සංසද රංග කලාව විසින් තම ජීවිත වඩා යහපත් කළ හැකි සාමූහික විසඳුමකට යොමු කිරීමටත්, ක්‍රියාවෙන් විසඳුම භාවිතා කිරීම සඳහා සුරක්ෂිත අවකාශයක් නිර්මාණය කිරීමටත් ඇති හැකියාව විමසා බලනු ලැබේ.

**04**

සංසද රංග කලාව සැලසුම් කර තිබෙන්නේ ප්‍රේක්ෂකයන්ට කතාවේ නායක පාත්‍රයාගේ ජීවිතය යහපත් කළ හැකි පරිදි ප්‍රතිඵලය වෙනස් කළ හැකි විසඳුම් පණගන්වන්නට ය. ඒ සඳහා ක්‍රමයක් සොයා ගත හැක්කේ පීඩිත හෝ අක්‍රිය චරිත වෙනස් කිරීමෙනි.

**05**

සංසද රංග නිෂ්පාදනය යනු මහජනයා සමග හෝ මහජනයා රැස් වන තැන්වල කරනු ලබන සරල රංගනයකි. එයට අවම රංගෝපකරණ, ඇඳුම් හා පසුතල ප්‍රමාණවත් අතර, එහි ඇති සුනම්‍යශීලීත්වය රඳා පවතින්නේ ද එම අවමත්වය මතය.

**06**

සංසද නාට්‍යය මුළුමනින් ම රඳා පවතින්නේ ප්‍රේක්ෂක නළුවන්ගේ මැදිහත් වීම මත ය. මැදිහත් වීම් ක්‍රියාත්මක කරන ප්‍රධාන උපාංගය එයයි.



11 පින්තූරය: ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - සිව්වැනි අදියර මන්නාරම් දිස්ත්‍රික්කය / ඡායාරූපය : මොහොමඩු අස්වර්



12 පින්තූරයඃ ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - සිව්වැනි අදියර / කිලිනොච්චි දිස්ත්‍රික්කය / ඡායාරූපයඃ මොහොමදු අස්වර්

# 06

# සංසද රංග කලාවේ ක්‍රමවේදය

*"ඉදිරිපත් කෙරෙන නාට්‍යයෙහි අත්‍යවශ්‍යයෙන් ම පීඩක තත්වයක් නිරූපණය විය යුතු ය. එහිදී එම පීඩනයට එරෙහිව සටන් කරන හැටි නොදන්නා නායක පාත්‍රයා (Protagonist) අසාර්ථකත්වයට පත් වේ.*
*මෙම නායක පාත්‍රයා වෙනුවට ප්‍රේක්ෂක නළුවාට නොහොත් පීඩිතයාට තමන්ට හැකියාව ඇති සියලු විසඳුම්, අදහස් හා මූලෝපායන් සහිතව ඇරයුම් කෙරෙන්නේ ප්‍රේක්ෂකාගාරයේ සිට නොව වේදිකාව මත දී මැදිහත් වීමටය. සෑම නව මැදිහත් වීමකට ම අනුව සෙසු නළුවෝ ඒවාට මුහුණ දෙන සිය චරිතවල ප්‍රතිචාර සැණෙන් නිමවති. මෙමඟින් කෙරෙන යෝජනාවන් සැබෑ ජීවිතයේ දී භාවිතයෙහි වන සැබෑ හැකියාවන් ගැන අව්‍යාජ විශ්ලේෂණයක් කරති. සියලු ප්‍රේක්ෂක නළුවන්ට මැදිහත් වීමට හා තමන්ගේ අදහස් රඟපෑමට සම අයිතියක් තිබේ."*
*(බෝආල් - පීඩිතයන්ගේ රංග කලාව)*

සංසද රංගයක් මැනැවින් එළදායී වීමට ප්‍රධාන අවධි තුනක් සපිරීම අවශ්‍ය ය. ඒ නාට්‍යය, සාකච්ඡාව සහ සංසදයයි. පළමුව, විනාඩි 15ක් පමණ කාලයක් තුළ චරිත හා එම චරිතවල අන්තර් ක්‍රියා ඔස්සේ පරිපීඩනයේ වාතාවරණය ඉදිරිපත් කරනු ලැබේ. සංසද රංගයේ චරිත ගොඩනගනු ලබන්නේ ප්‍රේක්ෂකයන් වහා ක්‍රියාත්මක වීම උත්තේජනය වන ආකාරයට ය. ඔවුන් නායක පාත්‍රයා සම්බන්ධයෙන් සංවේදී වේ. නාට්‍ය දර්ශනය අතරතුර පහත දැක්වෙන පියවර අනුගමනය කිරීමට සලකා බැලිය හැකි ය.

## ආරාධනය හා එකමුතුව

මෙය රංග ක්‍රීඩා, ගීත ගායනා, බෙර වාදන නැටුම් හෝ අන්තර් ක්‍රියාකාරික ක්‍රීඩා ආදිය ඔස්සේ ප්‍රේක්ෂකයන් සමග කළ හැකි ය. ඒ පිළිබඳ දැඩි නීති රීති නැත. කෙසේ වෙතත්, ප්‍රේක්ෂකයන් උණුසුම් අන්දමින් පිළිගෙන, දිරි ගන්වා, ගෞරවය ලබා දී, ඔවුන් නාට්‍යයේ ප්‍රධාන කොටස්කරුවන් බව ඒත්තු ගැන්වීම අතිශයින් වැදගත් ය.

**ඔබේ කණ්ඩායම හඳුන්වා දෙන්න:** නාට්‍යය ඉදිරිපත් කරන්නන් තමන් හඳුන්වා දීම හා ඔවුන් ප්‍රේක්ෂකයන් සමග සම්බන්ධ වීමට උත්සාහ කිරීම ඉතා වැදගත් ය.

**ප්‍රේක්ෂකයන් එකමුතු කරන්න:** ප්‍රේක්ෂකයන් නළුවන්ව විශ්වාස කිරීම, ඔවුන් නාට්‍යයට ඇලුම් කිරීම, ඔවුන් මනෝභාවිකව එකමුතු වීම, නළුවන් සහ රඟ දැක්වීම සමග නියැලීමට සූදානමින් සිටීම යන කරුණු සංසද නාට්‍ය කණ්ඩායම්වලට ඉතා වැදගත් ය. ප්‍රේක්ෂකාගාරය මානසික හා ශාරීරික වශයෙන් එකමුතු කිරීමට පහසුකාරකවරයාට ඔවුන් විවිධ ක්‍රීඩා සහ අභ්‍යාසවල යෙදවිය හැකි ය. එහෙත්, අභ්‍යාස හෝ ක්‍රීඩා කිරීම හේතුවෙන් නරක තත්වයට පත් විය හැකි තුවාලයක් හෝ රෝගී තත්වයක් හෝ ඇති කිසිවෙකු ඒ සඳහා යොදා නොගත යුතු ය. උදාහරණයක් ලෙස කොන්දේ අමාරුවක් සැලකිය හැකි ය. පීඩිතයන්ගේ රංග කලාවේදී තමන් අකැමැති කිසිවක් කිරීමට ප්‍රේක්ෂකයා පොළඹවන්නේ නැත.

01

02

## හැඳින්වීම

පහසුකාරකවරයා සංසද රංග රඟ දැක්වීමේ අරමුණ හා අපේක්ෂාව ඉදිරිපත් කරයි. ඉන් පසු පහසුකාරකවරයා පීඩිතයා සහ ප්‍රධාන චරිතයේ ඉලක්කය හඳුන්වා දෙයි. අවසානයේදී, ඔහු/ඇය පළමු වටයේ රංගනය ඉදිරිපත් කිරීම සඳහා නාට්‍ය පිරිවරට ආරාධනා කරයි.

03

## ප්‍රථම රඟ දැක්වීම

පළමුව නාට්‍යය විනාඩි 10 සිට 30 අතර කාලයක් සම්ප්‍රදායික නාට්‍යයක් ලෙස ඉදිරිපත් කෙරේ. පෙර පරිච්ඡේදවල ද විස්තර කරන ලද වීරයකු නැති නම්, නායක පාත්‍රයකු වටා පෙළ ගැසෙන දර්ශන පහකින් හයකින් නාට්‍යය ගොඩනැංවේ. පළමු දර්ශනයේදී ප්‍රශ්නය හඳුන්වා දෙන අතර, සැබෑ ජීවිතයේදී එහි ප්‍රතිඵලය ජනතාවට බලපාන හැටි, විශේෂයෙන්ම නායක පාත්‍රයාට බලපාන ආකාරය ඉදිරිපත් කරනු ලැබේ.නාට්‍යයේ ආමන්ත්‍රණය කරනු ලබන ගැටළුව හේතුවෙන් ප්‍රධාන චරිතයට මුහුණ දීමට සිදු වන, නරක ම අත්දැකීමක් සහිත කූඨප්‍රාප්තියකින් නාට්‍යය අවසන් කෙරේ.

04

## එම නාට්‍යය ම නැවත රඟ දැක්වීම

නාට්‍යයේ පළමු දර්ශනයෙන් පසු පහසුකාරකවරයා ආපසු වේදිකාවට පැමිණෙයි. නාට්‍යයෙන් නිරූපිත ශෝකජනක සිදුවීම ඇසුරෙන් ඔහු ප්‍රේක්ෂකයන්ගෙන් ඔවුන් නාට්‍යය ගැන සිතන දේ විමසයි. එය ඇත්තක් ද, නැතිනම්, කතාවක් පමණක් ද යන්න විමසයි. "සිදු වූ දෙය වෙනස් කිරීමට ඔබට අවස්ථාවක් ලැබුණොත්, ඔබ එය කරන්නේ කෙසේ ද? ඔබ වෙනස් කරන්නේ කාව ද?" ප්‍රේක්ෂක පිරිසෙන් යම් ප්‍රතිචාර ප්‍රමාණයක් ලබා ගැනීමෙන් අනතුරුව, පහසුකාරකවරයාට නාට්‍යය ඉදිරියට ගෙන යන ආකාරය ගැන උපදෙස් දිය හැකිය.

පහසුකාරකවරයා විසින් චරිත සහ නාට්‍යයේ නළුවන් දරන ස්ථාන අතර ඇති සම්බන්ධතා පිළිබඳ සාකච්ඡාවක් ආරම්භ කරයි. එනම්, පීඩකයා, පීඩිතයා, ඔවුන්ගේ හවුල්කරුවන්, නිෂ්ක්‍රීය චරිත යනාදී වශයෙන් තම තමන් අතර සාකච්ඡා කර පෙන්වන ලද දර්ශනය පිළිබඳ සිය අදහස් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රේක්ෂකයන්ට කාලයක් ලබා දෙයි.

සාකච්ඡාව අතරතුරදී පහසුකාරකවරයා නාට්‍යයේ සාරාංශයක් සපයන්නැයි ප්‍රේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටියි. එහිදී නළුවන් විසින් නිරූපණය කරන ලද ප්‍රශ්නය ගැන අවධානය යොමු කරමින්, සමාන අත්දැකීමකට මුහුණ දුන් කිසිවෙකු ප්‍රේක්ෂකයන් අතර සිටීදැයි විමසයි. එම සාමාජිකයා අපහසුවට පත් වන්නේ නැතිනම්, එය විස්තර කිරීමට අවස්ථාව ලබා දෙයි. පහසුකාරකවරයාට අවශ්‍ය වන්නේ ඔවුන් වෙත ඉදිරිපත් කෙරුණු වාතාවරණයට යථාර්ථවාදී විසඳුම් හෝ වැඩිදියුණු කිරීම් යෝජනා කරමින් එය තමන්ගේ ම අර්ථ නිරූපණ සමග වේදිකාව මත ඉදිරිපත් කිරීමට ප්‍රේක්ෂකයන් අභිප්‍රේරණය කරවීමටය.

අවසානයේදී නාට්‍යයේ දෙවන රඟදැක්වීමට පෙර, පහසුකාරකවරයා විසින් ප්‍රේක්ෂකයන්ටමැදිහත් විය හැකි ආකාරය පිළිබඳ පැහැදිලි උපදෙස් ලබා දෙන්නේ, රඟ දැක්වීම මුල සිට නැවත සිදු වන තෙක් සිටීම මගින් ප්‍රේක්ෂකාගාරයට එහි නිරත විය හැකි ආකාරය පිළිබඳව ය.

ප්‍රේක්ෂකයන්ට අත ඔසවා නවත්වන්නැයි ඉල්ලා සිටිය හැකි ය. එසේ කීමෙන් අදහස් වන්නේ ප්‍රේක්ෂක සාමාජිකයා විසින් මැදිහත් වී සිය අදහස් හා සිතුවිලි බෙදා හදා ගනිමින් ප්‍රශ්නයට විසඳුමක් යෝජනා කරන බවයි.

05

## මැදිහත්වීම්

පොදු ජනයාට සියලු චරිත තමන් සුදුසු යයි සිතන ආකාරයට එනම්, ප්‍රශ්නයට විසඳුම මේ යයි සිතන ආකාරයට වෙනස් කළ හැකිය.

උපදෙස් දෙන ලද ක්‍රමයට අනුව නැවත නාට්‍යය රඟ දක්වන අතරතුර සෑම ප්‍රේක්ෂක නළුවකුටම මැදිහත්විය හැකිය. නළුවෝ ගල්ගැසී නිශ්චලව වේදිකාව මත සිටින අතර තුර ප්‍රේක්ෂකයන් පැමිණ නාට්‍යයෙහි තමන් තෝරා ගත් නළුවා ඉවත් කොට තමන් එතැන ගනී.

ප්‍රේක්ෂකයන් චරිත වෙනුවට ආදේශ වීමෙන් ඉලක්ක කරන්නේ පීඩාවට ලක් වූ චරිතය සාධනීය ලෙස බලසතු කිරීමට හා පීඩනයට හෝ අයුක්තියට හෝ එරෙහිව නැගී සිටින්නට හෝ එම චරිතයට හැකි වන පරිදි කටයුතු නො කළ චරිත එසේ කිරීමට යොමු කිරීමයි.

ඒ අනුව, ප්‍රේක්ෂක නළුවන්ට නාට්‍යයේ සෑම දර්ශනයකදී ම, ඕනෑ ම අවස්ථාවකදී මැදිහත් වී, සියලු ප්‍රායෝගික විසඳුම් සොයා ගැනීමට ක්‍රියා කළ හැකි ය.

මෙම මැදිහත් වීම් අදියරේ දී ප්‍රේක්ෂක නළුවාට බොහෝ දේ කළ හැකි ය. පහත දැක්වෙන්නේ එයින් සමහරකි.

- අලුත් නළුවකු ලෙස පැමිණීම.
- බලා සිටින්නකුගේ චරිතයට තමන් ස්ථානගත වීම.
- නායක පාත්‍රයාට තමන් පෙනී සිටිමින් චරිතයේ දෘෂ්ටි කෝණයෙන් ම විසඳුම් යෝජනා කිරීම.

යථාර්ථය තුළ සාමාන්‍යයෙන් සිදු විය හැකි පරිදි, තරමක ප්‍රතිරෝධයකින් පසුව, ප්‍රේක්ෂක නළුවා විසින් ඉදිරිපත් කරනු ලබන විසඳුමෙහි බලවත්කම හා සාධනීය ස්වභාවය අනුව ප්‍රතිවාදී (Antagonist) පාර්ශ්වය සිය චර්යාව වෙනස් කරනු ඇත.

විසඳුම් තෝරා ගැනීමෙන් අනතුරුව, එදිනෙදා යථාර්ථය තුළ, එම ප්‍රශ්නවලට මුහුණ දෙන ප්‍රජාව අතර එය ක්‍රියාත්මක කළ හැකි ආකාරය පිළිබඳ සාකච්ඡා කරනු ලැබේ.

# මැදිහත්වීම් මාර්ගෝපදේශ

01. ප්‍රේක්ෂක නළුවා වේදිකාවට පැමිණ, ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට සාධනීය විසඳුමක් නිර්මාණය කළ හැකි යයි ඔවුන් විශ්වාස කරන චරිතයක ස්ථානය ගනියි.
02. ඔවුන් අනාගතයේදී වනු ඇතැයි සිතන කිසියම් පුද්ගලයකුගේ චරිතයට ආදේශ වනු ඇත. ප්‍රේක්ෂක නළුවා පීඩකයාගේ ස්ථානය නො ගත යුතු ය.
03. වේදිකාව මත සිටින මුල් නළුවෝ ප්‍රේක්ෂක නළුවා සමග එක්ව ඔවුන්ට අත්හදා බැලිය හැකි ඕනෑම උපායක් වෙනුවෙන් වැඩ කරති.
04. ශාරීරික බලපෑමක් සිදු වන්නේ නැත. ඔබගේ චරිතය විසින් කිසියම් ශාරීරිකව බලපාන දෙයක් කළ යුතු යයි සිතන්නේ නම් කරුණාකර නතර කිරීමක් ඉල්ලා එම ක්‍රියාවේ ප්‍රතිඵල කුමක් විය හැකිදැයි සාකච්ඡා කරන්න.
05. ප්‍රේක්ෂක සාමාජිකයා සිය මැදිහත්වීම අවසන් කළ පසු, පහසුකාරකවරයා එම ප්‍රේක්ෂක සාමාජිකයාට, නළුවාට සහ සෙසු ප්‍රේක්ෂකයන්ට තත්වය පැහැදිලි කිරීමක් කරයි.

## ප්‍රේක්ෂාගාරය මනෝභාවිකව එකමුතු කිරීමට සහ නාට්‍යයේ නිමග්න වීම සඳහා සූදානම් කිරීම සඳහා කළ හැකි පෙර සූදානම් ක්‍රීඩා කීපයක් පහත දැක්වේ.

**දිව පෙරළි** (Tongue Twisters)

මෙය නාට්‍ය දර්ශනයට පෙර ප්‍රේක්ෂකයන් හුරුපුරුදු බවට පත් කරවීම පිණිස ඔවුන් සමග කළ හැකි විනෝදාත්මක ක්‍රීඩාවකි දිව පෙරළි උසුරුවීම සඳහා ඔවුන් සැමට ඇරයුම් කළ හැකිය.

ඉංග්‍රීසි බසින්:

There's a chip shop in space, which sells space ship shaped chips

I like New York, unique New York, I like unique New York

Rubber baby buggy bouncers Floppy fluffy puppies, floppy fluffy puppies

The sixth sick sheik's sixth sheepis sick

සිංහල බසින්:
උදා: චූටි ටීචගෙ චූටි ටෝච් එක

**හඬ පත් ක්‍රීඩා**

ඔබට පරිස්සමෙන් සවන් දෙන්නැයි ප්‍රේක්ෂකයන්ට කියන්න. ඔබ කියන්නේ ශබ්දයෙන් සමාන, එහෙත්, සියුම් වෙනස්කම් සහිත වචන දෙකකි. ඉන් පසු, ඔබ කියන පිළිවෙල අනුව එම වචන නැවත කියන්නැයි ඔබ ප්‍රේක්ෂකයාට පවසන්න.

ටුමැටෝ පොටේටෝ වැනි වචන යුගල ඔබට ද නිර්මාණය කර ගත හැකි ය.

උදා: කරපිංචා - හා පැංචා

දෙමළෙන්:
සෝරු - සාම්බාල්




## වැදගත් කරුණු

| 01 | 02 | 03 | 04 | 05 |
|---|---|---|---|---|
| මූලෝපායන් සාකච්ඡා කරද්දී මැදිහත් වීම් යථාර්ථවාදී ද යන්න නො අසන්න. මෙවැනි ප්‍රශ්නයක් විසින් වෙනස යනු සිදු කළ නො හැකි දෙයක් ය යන මානසිකත්වය ඇති වේ. ඒ වෙනුවට එකී මැදිහත් වීම් ප්‍රායෝගික ද යන්න විමසන්න. | එයට අදාළ වන්නේ හා අදාළ නො වන්නේ මොනවා ද? මෙහිදී අදාළ කාරණය වන්නේ වෙනත් පුද්ගලයන් කළ යුත්තේ කුමක්දැයි අප සිතන ආකාරය නො වේ. මෙය උපදේශාත්මක රංගයක් නො වේ. අරමුණ වන්නේ අපට කළ හැකි දේ ගවේශනය කිරීමයි. | සංසද රංගය යනු තිරණ ගැනීමේ මෙවලමක් හෝ ප්‍රේක්ෂක දැක්ම ග්‍රහණය කර ගැනීමේ ක්‍රමවේදයක් නො වේ. | ප්‍රේක්ෂක නළුවන් විසින් අවබෝධ කළ හැකි පළමු දේ අතරින් එකක් වන්නේ, සැබෑ ජීවිතයේදී මෙන්, තමන් මැදිහත් නො වුවහොත් කිසිවක් වෙනස් නො වන බවයි. එබැවින් සංසද රංගය යනු නිශ්ක්‍රිය කතාවක්, අවවාදයක් සහ මත ගොඩනැගීමක් නො වේ. | ප්‍රේක්ෂක නළුවන් විසින් සොයා ගනු ලබන විළඟ දෙය වන්නේ 'කුමක් හෝ'දෙයක් කිරීම පමණක් ප්‍රමාණවත් නො වන බවයි. එය මූලෝපායික දෙයක් විය යුතු ය. එබැවින් ක්‍රියාව මූලෝපායික විය යුතු ය. |

# සංසද රංග ක්‍රීඩා සහ අභ්‍යාස

සංසද රංග කලාවේ සෑම ක්‍රියාවලියක ම ප්‍රායෝගික අභ්‍යාස රැසක් අඩංගු ය. කණ්ඩායමේ විභවයන් තහවුරු කර ගැනීමටත්, රංගනයේ තේමාව හඳුනා ගැනීමටත්, ශාරීරික බාධා බිඳ දැමීමටත්, පීඩාකාරී ප්‍රශ්න තේරුම් ගැනීමටත්, කතා හා චරිත සඳහාත්, සමස්ත රඟ දැක්වීම් ක්‍රියාවලිය සඳහාත් එය නළුවන්ට අවශ්‍ය වේ. පහත දැක්වෙන්නේ නිදසුන් කීපයකි.

## 01. ද්වන්ධ සටන්

**අරමුණ**

- සමූහයේ විභවයන් ශක්තිමත් කිරීම
- සංසද රංග කලාවේ මූලධර්ම සහ තේමා ගවේෂණය කිරීමට කණ්ඩායමට සමූහය සවිමත් කිරීම.

කණ්ඩායම යුගල වශයෙන් බෙදන්න. එම යුගලවලට එකිනෙකාට මුහුණ ලා සිටගෙන තම අත් තමන්ගේ දණහිස් මත තබා ගන්නැයි කියන්න. ඔවුන් සිය ප්‍රතිවාදියාගේ දුර්වලකම් පාවිච්චි කරමින් එම පුද්ගලයාගේ දණහිස ඇල්ලීමෙන් ලකුණු ලබා ගත යුතු ය. මේ සඳහා ඔවුන්ට තමන්ගේ අත් තමන්ගේ දණහිසින් ඉවතට ගැනීමට සිදු වේ. එහිදී තමන් ද ප්‍රහාර අවදානමට ලක් වේ. මෙම ද්වන්ධ සටන ඉදිරියට යන අතර, "පළමු ලකුණු තුන ලබා ගන්නා කෙනා දිනුම්", "ඊළඟ ලකුණ දිනුම් ලකුණයි " ආදී ප්‍රකාශයන්ගෙන් එහි උද්‍යෝගය හා තරඟකාරීත්වය වැඩි කළ හැකි ය.

**වෙනස්කම්**

කණ්ඩායම වෙනස් යුගලවලට බෙදන්න. එකිනෙක යුගලයට එකිනෙකාට මුහුණ දී සිටගෙන එක් අතක් අල්ල පිටුපසට හැරී සිටින සේ පිට මතින් තබාගෙන, අනෙක් අතේ දබරැඟිල්ල කඩුවක් සේ හරවමින් අනෙකාගේ දුර්වල ස්ථානය වන අනෙක් අතේ අල්ල ස්පර්ශ කරන්නැයි කියන්න. මෙම ද්වන්ධ සටන ඉදිරියට යන විට පෙර පරිදි ම උද්‍යෝගය වැඩි කළ හැකි ය.

**ප්‍රතිපෝෂණය සඳහා වැදගත් ප්‍රශ්න**

- දිනුම හා පැරදුම ඔබට දැනුණේ කෙසේ ද?
- ඔබගේ ප්‍රතිවාදියා ඔබ බලයෙන් යටපත් කළා ද?
- තරඟකාරීත්වය නිසා ඔබ නො මග ගියා ද?
- ඔබ ජයග්‍රහණය සැමරුවේ කෙසේ ද?

## 2. මුහුණ ගවේෂණය කිරීම

**අරමුණ**

- ශාරීරික බාධක බිඳීමට උදව් කිරීම
- ඉන්ද්‍රිය සංවේද්‍ය කටයුතු ගවේෂණය කරගෙන යාම

කාමරය තුළ තමන්ට ම අවකාශයක් සොයා ගන්නැයි සහභාගිකයන්ට කියන්න. ඇස් වසාගෙන සම්පූර්ණයෙන් ම නිශ්ශබ්දව ඉන්නැයි කියන්න. ඒ අතර එකින් එක, සහභාගිකයන් මෘදු ලෙස අවකාශය හරහා ගෙන යමින් අහඹු යුගල තනන්න. සෑම අයෙකු ම එකිනෙකාට මුහුණ දෙන සේ සිටුවා ඇස් වසාගෙන අල්ල ස්පර්ශ කරන්නැයි කියන්න. ඒ අන්දමින් ම අත දිගේ උරහිස, බෙල්ල හා මුහුණ ස්පර්ශ කරන්නැයි කියන්න. මුහුණ සහ හිස ගවේශනය කරමින් සහභාගිකයන්ට කාලයක් ගත හැකි ය. මේ අතර, තමන්ගේ හවුල්කරුවාගේ මුහුණ සම්බන්ධයෙන් පිංතූරයක් සිතේ මවා ගත යුතු ය. දෙදෙනා ම මෙය කිරීමෙන් අනතුරුව ඔවුන්ට ඇස් ඇරිය හැකි ය.

## 3. වෘත්තය කැඩීම

**අරමුණ**

- ප්‍රධාන චරිතයේ අරගලය ගවේෂණය කිරීම
- පරාජයේ තේමාව ගවේෂණය කිරීම
- පීඩනය හා වෙනස් අන්දමින් සැලකීම සම්බන්ධයෙන් උපායික ප්‍රවේශයක් ගවේෂණය කිරීම

කණ්ඩායමට වෘත්තයක් ලෙස සිටගෙන සිටින්නැයි කියා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන අයෙකුට මැද සිට ගන්නැයි කියන්න. මැද සිටින්නාගේ අරමුණ විය යුත්තේ වෘත්තය බිඳීමයි. වෘත්තයේ සිටින අය අතිනත අල්ලාගෙන මැද සිටින්නාගේ එම ප්‍රයත්නය වැළැක්විය යුතු ය. පළා යාමට විකල්ප මාර්ග සොයන්නට මැද සිටින්නා දිරි ගන්වන්න. සමූහයෙන් ප්‍රතිපෝෂණය ලබා ගන්න. විවිධ පුද්ගලයන් ඔවුන්ගේ කැමැත්ත අනුව මැද සිටින්නට යොදවන්න.

# 4. නායකයා අනුමාන කිරීම

**අරමුණ**

- විය හැකි පීඩාවන් පිළිබඳ ප්‍රශ්න විමසා බැලීම ආරම්භ කිරීම
  (උදා: පුද්ගලයකුට එරෙහිව සමූහයක බලය, කල්ලි මානසිකත්වය, දැනුමේ බලය, වෙනස් කොට සැළකීමට ලක් වූ සුළුතරයේ අරගලය, ප්‍රධාන චරිතයේ අරගලය)

සමූහයට වෘත්තයක සිට ගන්නැයි කියන්න. සිය කැමැත්තෙන් එක් අයෙකුට ඉදිරියට එන්නැයි කියන්න. එම පුද්ගලයාට මොහොතකට කාමරයෙන් පිටතට යන්නැයි කියන්න. දෙවැන්නෙකුට ද සිය කැමැත්තෙන් ඉදිරියට එන්නැයි කියන්න. මෙම පුද්ගලයා නායකයා බව කණ්ඩායමට පැහැදිලි කරන්න. නායකයා අඛණ්ඩ චලනයක් ආරම්භ කළ යුතු ය. එය කණ්ඩායමේ සෙසු පුද්ගලයන් විසින් අනුකරණය කළ යුතු ය. නායකයාට එම චලනය නිරන්තරයෙන් වෙනස් කරන්නැයි කියන්න.

පිටත සිටින පුද්ගලයා ඇතුළට පැමිණ, එහි සිටින විවිධ චලන දක්වන සමූහයේ නායකයා අනුමාන කළ යුතු බව කණ්ඩායමට දන්වන්න. මෙහි දී පිටත සිටින්නන්ට තමන් කළ යුත්ත පැහැදිලි කොට ඇතුළට කැඳවා අනෙක් අය සිටින කවයට ඇතුළත් කළ යුතුය. නායකත්වය දරන්නේ කවුරුන්ද යන්න සැඟවීමට හැකි තරම් කටයුතු කළ යුතු ය. එහෙත්, හැම විට ම චලනයන්ට නායකත්වය දිය යුත්තේ නායකයා ය.

මෙම ක්‍රියාකාරකම විවිධ සහභාගිකයන් යොදා ගනිමින් නැවත නැවත කරන්න.

# 5. බෝම්බ සහ පලිහ

**අරමුණ**

- අනතුර පිළිබඳ තේමාව ගවේෂණය කිරීම
- උපායික චින්තනය ගවේෂණය කිරීම

සහභාගිකයන්ට අවකාශය තුළ ඇවිදින්නැයි කියන්න. ඔවුන් ඇවිදින අතර, සෑම සහභාගිකයකුට ම වෙනත් පුද්ගලයන් දෙදෙනෙකු සළකුණු කර තෝරා ගන්නැයි කියන්න. ඔවුන් මෙම තෝරා ගැනීම තමන්ගේ සිත්හි තබා ගත යුතු අතර හෙළි නො කළ යුතු ය. එක් පුද්ගලයකු බෝම්බය වන අතර, අනෙකා පලිහ ය. අභ්‍යාසයේ අරමුණ තමන්ගේ පලිහ තමන් සහ බෝම්බය අතර තබා ගැනීම බව පැහැදිලි කර දෙන්න.

මොහොතකට පසු සහභාගිකයන්ට තමන් සිටින තැනම නිශ්චල වන්නැයි කියන්න. ඉන් පසු, ඔවුන් කෙසේ ක්‍රියාත්මක වී ඇද්දැයි බලන්න. ඔබට බෝම්බය පිපිරීම තෙක් පිපිරීමෙන් ආපස්සට කාල ගණනයක් කළ හැකි අතර, එහි දී කවුරු ආරක්ෂිත තත්වයක සිටිදැයි බලන්න.

**ප්‍රතිපෝෂණයට වැදගත් ප්‍රශ්න**

- ඔබ බියපත් වී ද?
- ඔබ උපායන් පාවිච්චි කළේ ද?
- ඒ උපායන් මොනවා ද?




13 පින්තූරය: ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - සිව්වැනි අදියර /මන්නාරම දිස්ත්‍රික්කය / ඡායාරූපය: මොහොමදු අස්වර්

# 07
# පහසුකාරකවරයාගේ භූමිකාව

පහසුකාරකවරයා සම්ප්‍රදායිකව හැඳින්වෙන්නේ ජෝකර් (Joker) ලෙසයි. එම පුද්ගලයා ප්‍රේක්ෂකයා සහ නළුවන් අතර පාලමයි. ඔහු හෝ ඇය කිසිදු පුද්ගල පාර්ශ්වයක් නියෝජනය නො කරයි. ඔහු/ඇය විසින් නාට්‍ය දර්ශනයේ ඉදිරිපත් කර තිබෙන දෙය හා ප්‍රේක්ෂකයන්ගේ යථාර්ථය අතර සබඳතාවක් ඇති කරයි. පරමාදර්ශී පහසුකාරකවරයකු සංසද රංගය සාර්ථක නිෂ්පාදනයක් බවට පත් කිරීම පිණිස පහත කරුණු ඉටු කිරීමට පරිශ්‍රම දරයි. ඔහු/ඇය රංගය විසින් එහි අරමුණ සාක්ෂාත් කරන බවට වග බලා ගන්නා බැවින් ඔහුට/ඇයට ඉලක්කගත සමාජ ප්‍රශ්නය පිළිබඳ ගැඹුරු අවබෝධයක් තිබිය යුතු ය. ප්‍රජාවේ පසුබිම පිළිබඳව ද, නාට්‍යය විසින් නිරූපණය කරනු ලබන ප්‍රශ්නයෙහි නීතිමය තත්වය පිළිබඳව ද පහසුකාරකවරයාට අවබෝධයක් තිබිය යුතු ය. මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදය, දේශපාලනය, ප්‍රජා බල ව්‍යූහයන් සහ සෞඛ්‍යය ගැන දැනුම වැදගත් ය. කරුණු ඉදිරිපත් කළ යුත්තේ ප්‍රේක්ෂකයාට එම දැනුම එදිනෙදා ජීවිතයට වැදගත් වන ආකාරයට ග්‍රහණය කර ගත හැකි භාෂාවකිනි.

**01**
ඔහු / ඇය ක්ෂණික වෙනස්කම් ඇති කරන්නකු නො වේ. එබැවින් පහසුකාරකවරයාගේ කාර්යය වන්නේ පුද්ගලයන්ට අවවාද දීම නො ව, විචාරශීලීව සහ තාර්කිකව සිතීමට ඔවුන් දිරි ගැන්වීමයි.

**02**
නාට්‍යයේ බල විභවයන් පැහැදිලි කරන්න. නළුවන්ට සහාය වෙමින් ඔවුන් දිරි ගන්වන්න. තම හැඟීම් පාලනය කර ගන්න. ජනයාට හැම විටම ඉගැන්වීමට යාමට තැත් නො කරන්න.

**03**
ප්‍රේක්ෂක සහභාගිත්වය දිරි ගන්වනු පිණිස, විවෘත, අදාළ, කුතුහල දනවන ප්‍රශ්න අසන්න. ප්‍රබල එහෙත් ප්‍රශ්න කිපයක් පමණක් ඇසීම හොඳ ය.
එය ප්‍රේක්ෂකයන් කතා කිරීමට පොළඹවයි.

**04**
ආතතිය දුරලීම සඳහා මෙවලමක් ලෙස හාස්‍යය පාවිච්චි කරන්න. හොඳ, පැහැදිලි සන්නිවේදනයක් භාවිතා කරන්න. එමගින් හැම විට ම ප්‍රේක්ෂකයන්ගේ විශ්වාසය සහ අවධානය දිනා ගත හැකි අතර, ඔවුන් සැහැල්ලු කරයි.

**05**
ප්‍රේක්ෂකයන් විසින් පළ කරන ලද හැඟීම් නිරීක්ෂණය කරන්න. සහකම්පනයට සංවේදී වන්න. ප්‍රේක්ෂකයා සහ රංගගත කිරීම අතර සංවාදය කළමනාකරණය කරමින් සාධනීය අදහස් ජනනයට උපකාර කරන්න.

**06**
නාට්‍යයට පෙර, එය අතරතුර හා එයට පසු ප්‍රේක්ෂකයන්ට ඉදිරිපත් කරන ලද අභියෝග හඳුනාගෙන ඒවාට ප්‍රතිචාර දක්වන්න. නාට්‍යය අතරතුර පිළිවෙල, විනය සහ එකිනෙකාට ගරුත්වය පවත්වා ගනු වස් තැන්පත්ව සිටින්න.

**07**
පහසුකාරකවරයා රාජ්‍ය තාන්ත්‍රිකයකු බඳු විය යුතු ය. වෙනත් අයෙකුගේ මැදිහත් වීමක් සම්බන්ධයෙන් ප්‍රේක්ෂක සාමාජිකයකු එකඟ නො වන අවස්ථා තිබිය හැකි ය. එවැනි අවස්ථා ඉක්මණින් හා සංවේදී ලෙස කළමනාකරණය කර ගත යුතු ය.

**08**
විවාදය ඉදිරියට ගෙන යාම පහසුකාරකගේ භූමිකාවයි. සැබෑ ප්‍රශ්නවලට සම්බන්ධ වී සාකච්ඡාව එක තැන කැරකෙමින් සුළු කාරණාවල ගිලී යාම වළක්වා ගන්න.

**09**
අවශ්‍ය නම්, පොදු කැමැත්ත බලමුළුගැන්වීම සඳහා ක්ෂණික ඡන්දයක් පවත්වන්න. නිහඬතාව සමග ගනුදෙනු කිරීමේ දී නිහඬතාවේ සංස්කෘතිය හැඩගැස්වීමට උත්සාහ කරන්න.

**10**
විවාදයට මතවාදයෙන් බලපෑම් නො කරමින් හා එය සමතලා කර නො දමමින්, නැවත ප්‍රධාන ප්‍රශ්න වෙත සංවාදය යොමු කරන්න.

**11**
ප්‍රේක්ෂකයන් විසින් දරනු ලබන සෑම ප්‍රයත්නයක් ම අගය කිරීම අවශ්‍ය ය. කිසිවකුට පරාජිත හැඟීමෙන් වෙනස හැර යාමට ඉඩ නො තැබිය යුතු ය.

**12**
ප්‍රශ්න විශ්ලේෂණය කිරීමටත්, ඇතැම් තත්වයන් සාරාංශ කිරීමටත් ක්ෂණික වන්න. මතු කරන ලද ප්‍රශ්නවලට ක්ෂණික සවිස්තර පිළිතුරු සපයන්න.




13 පින්තූරය: ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - තුන්වැනි අදියර / කලුතර දිස්ත්‍රික්කය / ඡායාරූපය: මොහොමඩු අස්වර්

# 08

# පෙර පුහුණු ක්‍රියාවලිය

සංසද රංග වැඩසටහනක් සාර්ථක කර ගැනීමෙහි ලා ඉතාමත් ප්‍රවේශම් සහගත අවධානයක් ඉල්ලා සිටිනු ලබන අතිමූලික පියවරයන්ගෙන් එකක් වන්නේ පෙර පුහුණුවයි. පෙර පුහුණු ක්‍රියාවලිය කාර්යක්ෂම කර ගැනීම සඳහා ඉවහල් කර ගත හැකි පියවර පහත දැක්වේ.

01. සිරුර උණුසුම් කිරීමේ ක්‍රියාකාරකමකින් ආරම්භ කරන්න. එමගින් කණ්ඩායම් හැඟීම වර්ධනය වේ. මෙමගින් නළුවන්ට සිය හඬ සහ ශරීරය රංගගත කිරීම වෙනුවෙන් සකසා ගැනීමට උපකාර කෙරේ.

02. ප්‍රධාන ගැටුම ගැන කෙටියෙන් විස්තර කරන්න. ප්‍රධාන ගැටුම / ප්‍රශ්නය හෝ අවධානය යොමු විය යුතු කාරණය ගැන ප්‍රේක්ෂකයන්ට කෙටියෙන් විස්තර කරන්න. එය තනි, සුවිශේෂී හා සරල වැකියක් විය යුතු ය.

03. තනි, නිශ්චිත හා සරල එක් වාක්‍යයකින් නාට්‍යයේ මූලික ප්‍රශ්නය/ගැටුම ගැන නළුවන්ට විස්තර කරන්න. එය හොඳම ක්‍රමයයි.

04. සියලු ප්‍රධාන චරිත එක වර විස්තර කරන්න. එමගින් ඔවුන්ට නාට්‍යයේ චරිත තේරුම් ගැනීමට පහසු වේ.

05. සියලු චරිතවල ජීව ස්වරූපය පැහැදිලිව විස්තර කරන්න. එයට ශාරීරික ස්වරූපය, හැඟීම්, චර්යා, තුවාල, සිහින සහ අභියෝග අඩංගු වේ.

06. ප්‍රතිවාදියා (Antagonist) නායක පාත්‍රයා (Protagonist) නිශ්ක්‍රීය චරිත (Neutralit) ආදිය ද ඒවායේ චරිත ලක්ෂණ, අරමුණු සමග පැහැදිලි කරන්න.

07. කතාව ප්‍රධාන චරිතය පිළිබඳ බව කණ්ඩායමට දන්වන්න. සමස්ත කතාව ම මුලින් පැහැදිලි කරන්න. එය කණ්ඩායමට සංවිධානය වීමට උපකාර වේ.

08. ප්‍රධාන මැදිහත් වීමේ ස්ථාන පැහැදිලි කරන්න. කෙසේ වෙතත්, අවසානයේදී මේවා තීරණය කරන්නේ ප්‍රේක්ෂකයා විසිනි. නළුවන්ට කතාව හා එහි එකිනෙක චරිත ගැන අවබෝධයක් තිබේ දැයි දැන ගැනීමට ප්‍රශ්න අසන්න.

09. ක්‍රියාවෙන් ක්‍රියාවට පුහුණු වන්න. අවධානය යොමු විය යුතු සියලු ප්‍රධාන මූලිකාංග පැහැදිලි කරන්න. වේදිකා තුලනය, ඇස් සම්බන්ධය, කටහඬ, ස්ථානය ආදිය එයට ඇතුළත් ය. චරිතය අවශ්‍ය ගති ලක්ෂණ පෙන්වනවා ද, වෙනත් සාමාජිකයන් සාකච්ඡාවට යොමු කර ගන්නවා ද යන්න බලන්න.

10. ජවනිකාවෙන් ජවනිකාවට පැහැදිලි කරන්න. පෙර පුහුණු සඳහා කාලසටහනක් සකසන්න. පූර්ණ පෙර පුහුණුවක් කරන්න අනාගත අවස්ථාවල සංවිධාන කටයුතු විස්තර කරන්න.

**ඉඟි:**

| 01 | 02 |
| --- | --- |
| සෑම කෙනෙකු ම සමාන අන්දමින් සහභාගි වෙමින් ප්‍රේක්ෂකයාට චරිත තේරුම් ගැනීමට උපකාර කළ යුතු ය. | චරිතවල ජීව ස්වරූප පිළිබඳ වැදගත් තොරතුරු ලබා දෙන්න. ප්‍රශ්න අසන්නට අවස්ථාව දෙන්න. |



14 පින්තූරය: ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - දෙවැනි අදියර / පුහුණු වැඩමුළුව / ඡායාරූපය: මොහොමදු අස්වර්

# 09
# කතා සංවර්ධනය

සංසද රංගය ආශ්‍රිතව සැලකීමේ දී කතාවක් නොමැතිව ගැටුමක් හෝ කේන්ද්‍රීය ප්‍රශ්නයක් නොමැති අතර, එහෙයින් සංසදයක් ද නැත. ප්‍රේක්ෂකයා ග්‍රහණය කර ගන්නට ද, විනෝදාස්වාදය හා පරිකල්පනය පවත්වා ගන්නට ද ගැටුමක් හෝ කේන්ද්‍රීය ප්‍රශ්නයක් අවශ්‍ය ය. ගැටුමක් හෝ කේන්ද්‍රීය ප්‍රශ්නයක් සොයා ගත් පසු එය නාට්‍යයේ චරිත හා සම්බන්ධ නාට්‍යමය ක්‍රියා හරහා විසඳීම හා පරිවර්තනය සිදු කළ යුතු ය. සංසද රංග රඟදැක්මක් සාර්ථක වීමට නම් එක් වරකට එක් ප්‍රධාන ගැටුමක් හෝ කේන්ද්‍රීය ප්‍රශ්නයක් කෙරෙහි අවධානය යොමු කිරීම වඩාත් හොඳ ය.

## 1. ගැටුම හා පරිපීඩනය

ගැටුම හා පරිපීඩනය යනු එකිනෙකට වෙනස් සංකල්ප දෙකකි. ගැටුම පරිපීඩනයට හේතුකාරක වේ. තවද ගැටුමේ බලපෑමට පත් වන පුද්ගලයා පීඩිතයා විය හැකි ය. ඇතැම් අවස්ථාවලදී පීඩිතයා ගැටුමේ බලපෑමට පත් වන පුද්ගලයාට සමීප අයෙකු විය හැකි ය.

## 2. ප්‍රබල චරිත ගොඩ නගන්න

සරලව කිවහොත්, චරිතය යනු කතාව ඉදිරියට ගෙන යන වාහනයයි. සංසද රංගන සංදර්භය තුළ, චරිත යනු බොහෝ විට එදිනෙදා ජීවිතයේ හමු වන මිනිසුන් ය. හොඳ චරිතවල ඇති වටිනාකම්වල, සිරිත් විරිත්වල, ශාරීරික ලක්ෂණවල, භාවමය ලක්ෂණවල, අත්දැකීම්වල, කැමැත්තෙහි සමානකම් ප්‍රේක්ෂකයාට දැක ගැනීමට ලැබෙනු ඇත. සංසද රංග කලාවෙහිදී, චරිත ප්‍රේක්ෂකයාට ආකර්ෂණීය විය යුතු ය. ඒවා පිළිබඳ සමීපත්වයක් දැනිය යුතු ය. ඔහු / ඇය ප්‍රජාවේ අයකු ලෙස පෙනිය යුතු ය. සෑම චරිතයක් ම පහත ආකාරයේ විය යුතු බව ද මතක තබා ගන්න. එය,

- ස්වභාවයෙන් අද්විතීය ය
- වෙනස් ශාරීරික ස්වභාවයන් ඇත
- සුවිශේෂ චර්යා ස්වභාවයන් ඇත
- සුවිශේෂ භාවමය අවශ්‍යතාවන් විසින් ක්‍රියාත්මක වේ
- සිත් වේදනාවක් තිබේ
- සිහිනයක් තිබේ
- අභ්‍යන්තර ගැටුමක් ඇත
- කතාවේ අවශ්‍යතාව අනුව ක්‍රියාත්මක වේ

## 03. ප්‍රබල චරිතයක් ගොඩනැඟිය හැක්කේ කෙසේද?

**මනෝභාවිකව ප්‍රබල චරිත ගොඩනැංවීමෙහි ලා විවිධ ක්‍රමවිධීන් භාවිතා කෙරේ. පහතින් දැක්වෙන්නේ ඉන් සමහරකි.**

01. හඳුනා ගන්නා ලද ගැටුමක් හෝ ප්‍රශ්නයක් හෝ ඔබ අත ඇති බව මතක තබා ගන්න.
02. ඔබ ගැටුමක් හෝ ප්‍රශ්නයක් හඳුනාගෙන නැතිනම්, ඔබ මුලින් ම කළ යුත්තේ එයයි.
03. චරිත සංවර්ධනය ආරම්භ කරන්නට පෙර එය පිළිබඳ බුද්ධි කලම්බනයක් කරන්න.
04. ඔබගේ සහභාගිකයන් සමාන සංඛ්‍යා සහිත කණ්ඩායම්වලට බෙදන්න.
05. අවම කණ්ඩායම් ගණන හතරක්, පහක් වීම ඉතා සුදුසු ය.
06. සෑම කණ්ඩායමකට ම සාකච්ඡා කර තමන්ගේ හදවතට වඩාත් සමීප පුද්ගලයකු හා සම්බන්ධ ගැටුම / ප්‍රශ්නය සෑම කණ්ඩායමකටම සාකච්ඡා කර ඉදිරිපත් කරන මෙන් පවසන්න.
07. මෙම පුද්ගලයා ඔවුන්ගේ පසුබිම තුළ ජීවත් විය යුතු බව කියන්න. එම පුද්ගලයා ඔවුන්ට හුරු පුරුදු අයෙකු හා ගැටුමට අදාළ අයෙකු විය යුතු ය.
08. ඔවුන්ට සටහන් ගැනීමට කඩදාසි සපයන්න.
09. සෑම කණ්ඩායමකට ම අවම වශයෙන් එක් චරිතයක් සංවර්ධනය කරන්නැයි කියන්න.
10. ඔවුන් සිතාමතා ම නායක පාත්‍රයා, ප්‍රතිනායකයා හෝ නිශ්ක්‍රීය යනාදී වශයෙන් චරිත සංවර්ධනය කළ යුතු නැත. ඔවුන් අවධානය යොමු කළ යුතු වන්නේ එක් බලවත් චරිතයක් ස්ථාපිත කිරීමට ය.

**පහත සඳහන් ප්‍රශ්න තම කණ්ඩායමෙන් අසන්නට ඔවුන් යොමු කරන්න.**

- තෝරා ගත් චරිතයේ පවුල් පසුබිම කුමක් ද?
- එම චරිතයේ සුවිශේෂ ශාරීරික ලක්ෂණ ඔබ විස්තර කරන්නේ කෙසේ ද?
- ඔබගේ චරිතයේ සුවිශේෂ චර්යාවන් මොනවා ද?
- ඔබගේ චරිතයේ සුවිශේෂ හැඟීම් මොනවා ද?
- ඔබගේ චරිතයේ අවශ්‍යතා මොනවා ද?
- ඔබගේ චරිතයේ සිත් වේදනාව කුමක් ද?
- සිහිනය කුමක් ද?
- ඔබේ චරිතයේ අභ්‍යන්තර ඝට්ටනයන් මොනවා ද?
- ප්‍රජාවේ සෙසු අය ඔබගේ චරිතය විස්තර කරනු ඇත්තේ කෙසේ ද?
- ඔබගේ ප්‍රජාව තුළ මෙම චරිතය සුවිශේෂ වන්නේ කෙසේදැයි කියන්න.

**කතාවේ වීරයා කවුරුන් ද යන්න වෙන් කොට හඳුනා ගැනීම ඇතැම් විට ඉතා දුෂ්කරය. බොහෝ කතාවල එක්කෝ භූමිකාවන් නියත හැඩයකින් තොරය; නැතහොත් නාට්‍යය මුළුල්ලේම වෙනස් වීමට හැකිය. ඇතැම් නාට්‍යයක නායක පාත්‍රයින් හෝ ප්‍රතිනායකයින් රැසක් සිටී. නායක පාත්‍රයා, ප්‍රතිනායකයා වචන ගැන කිව හැක්කේ කුමක්ද? ඒවායින් කුමක් අදහස් වේද? ඒවායින් ඇඟවෙන්නේ කතාවේ කිනම් චරිතද?**



### ප්‍රතිනායකයා (Antagonist)

**ප්‍රතිනායකයා යනු සාමාන්‍යයෙන් දුෂ්ටයා ය. එහෙත්, නායක පාත්‍රයාගේ හෙවත් වීරයාගේ ප්‍රතිවාදියා ලෙස සැලකීම වඩාත් යෝග්‍ය ය. එදිරිවාදියා හඳුනා ගැනීමට තිබෙන හොඳම ආකාරය වන්නේ කතාවෙහි අරමුණ හරහා ගන්නේ කවුරු ද යන්න විමසා බැලීමයි.**

## 04. චරිත ඉදිරිපත් කිරීම

**චරිත ඉදිරිපත් කිරීම යනු කණ්ඩායමේ සාමාජිකයින් විසින් තමන් ගොඩ නඟන ලද චරිතයේ පූර්ණ ජීව රූපය ඉදිරිපත් කිරීමේ, නැතහොත්, පැහැදිළි කිරීමේ වෑයමකි. සෑම කණ්ඩායමක්ම තම තමන්ගේ චරිත ඉදිරිපත් කළ පසු ඒවා පුවරුවක හෝ බිත්තියක එකට අලවන්න.**

01. අවසානයේදී එකිනෙක චරිත අතර හොඳම යෝග්‍ය සම්බන්ධතාව පරිකල්පනය කර ගැනීමට උත්සාහ කරන්න.
02. හොඳම සම්බන්ධතාව පහසුවෙන් ම ඔබ බලවත් කතාවක් වෙත යොමු කරනු ඇත. කෙසේ වෙතත්, මෙම අදියරේදී කතාවක් ගොඩනැගීමට උත්සාහ නො කරන්න.
03. මේ වන විට, සෑම චරිතයක් ම අද්විතීය බවට අවබෝධයක් ඇති විය යුතු ය.
04. සෑම චරිතයක් ම පැහැදිලිව ම සුවිශේෂ අරමුණක් නියෝජනය කරයි.
05. කතාවේ නායක පාත්‍රයා හෙවත් වීරයා කවුරු ද යන්න හා ප්‍රතිවාදියා හෙවත් දුෂ්ටයා කවුරු ද යන්න සොයා ගැනීමට ඔබට හැකි වනු ඇත.
06. ඔබ කතාව ගොඩනගන්නට යන්නේ කේන්ද්‍රීය චරිත වටා පමණක් බව මතක තබා ගන්න. එහෙත්, වෙනත් අයට ද තමන්ගේ වූ ප්‍රබල කතාවක් තිබේ.

## 05. කතා පෙළ


**සංසද රංග සන්දර්භයේ දී කතා පෙළ යනු මතු වය හැකි බාධාවන්ට, ප්‍රතිවාදියා විසින් ඇති කළ අභියෝගයන්ට මුහුණ දෙමින් තම අරමුණු කරා ළඟා වීමේ දී කේන්ද්‍රීය චරිතය ගන්නා ක්‍රියා පිළිවෙලයි. යම් ලක්ෂයක දී යම් ක්‍රියාවන් විසින් කේන්ද්‍රීය චරිතය අතිශයින්ම පරිපීඩිත ද ප්‍රතිවාදියා චරිතය අතිශයින් ප්‍රබල වූ ද ස්ථානයක පිහිටුවිය හැකිය. කතා පෙළෙහි තාර්කික පෙළගැස්මක් නිර්මාණය කිරීමේ දී පහත පිළිවෙල වැදගත් ය.**

01. කතා පෙළ දිගේ කියවන්න.
02. ඔබේ කතාවෙහි කතා පෙළෙහි පිළිවෙල වෙනස් කිරීමේ හැකියාවක් තිබේ ද යන්න උත්සාහකර බලන්න.
03. එය ජවනිකාවලට වෙන් කරන්න.
04. උපරිම ජවනිකා සංඛ්‍යාව තුනක් හෝ හතරක් විය හැකි ය.
05. සෑම ජවනිකාවකම අවසානයේදී බලවත් පරිපීඩනයක් ඇති බව තහවුරු කරන්න.
06. අවසන් ජවනිකාවෙන් පසු දැඩි පරිපීඩනයක් තිබිය යුතු ය.
07. මෙම කතා පෙළ රඟ පා බලන්න. ඔබගේ කතාවේ ශක්තිය කලින් පරීක්ෂා කරන්න.
08. ඔබගේ කතාව තවත් බලවත් කිරීමට ඉඩ ඇතැයි සිතේ නම් අවශ්‍ය වෙනස්කම් කරන්න.
09. ඔබ රඟ දක්වන්නට යන්නේ එසේ සකසා ගත් කතාවයි.



### නායක පාත්‍රයා හෙවත් වීරයා (Protagonis)

**මේ වනාහි කේන්ද්‍රීය චරිතයයි; පීඩාවට පත් වන්නා ය. නැතිනම්, මෙය කාගේ කතාවක් ද යන ප්‍රශ්නය ඇසූ කල ඔබගේ මතකයට එන නම හිමි පුද්ගලයා ය. සංසද කතාවක සිටිය යුත්තේ එක් නායක පාත්‍රයෙකි එහෙත්, නවකතාවක එකකට වඩා ප්‍රධාන චරිත තිබිය හැකි ය.**



### අසළ සිටින්නන් (Bystanders)

**සෙසු චරිත යනු මෙම මර්දනය / පීඩාව සිදු වන ආකාරය දකින අය වන අතර, ඔවුන්ට එය වැළැක්වීමේ හැකියාවක් තිබේ.**



15 පින්තූරය: ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - සිව්වැනි අදියර / කිලිනොච්චිය දිස්ත්‍රික්කය / ඡායාරූපය: ඇලෙක්සැන්ඩර් කැමිලස්

# 10
# රංගනය හරහා චරිත තහවුරු කිරීම

සංසද රංග කලා සංදර්භය තුළ, භාවමය වශයෙන් ප්‍රබල චරිත ගොඩනැගීම පමණක්ම ප්‍රමාණවත් නැත. චරිත / භූමිකා තේරුම් ගැනීම්, ඒවා අභ්‍යන්තරීකරණය කර ගැනීමේ සහ රංගනයේදී ඒවා නියෝජනය කිරීමේ විශාල වගකීමක් නළුවන් / රංගධරයන් සතුව තිබේ.

## සහභාගි වන්නන්ගෙන් මෙම ප්‍රශ්න අසන්න:

අපගේ දෛනික ජීවිතයේදී අප කෙතරම් භූමිකා සංඛ්‍යාවක් රඟපානවා ද?
මෙම වෙනස් භූමිකාවන් තුළට අපව ප්‍රක්ෂේපණය කර ගන්නේ කෙසේ ද?
ඇතැම් විට අප අන් අයගේ චරිත රඟ නොපාන්නේද?
අප යථාර්ථවාදී වන්නේ කුමන චරිතය රඟපාද්දී ද?
ඇතැම් විට අපි සෑම තැනකදීම රංගය හා ජනයා නොදකිමුද?
පුද්ගලයන්ට සිය සැබෑ ජීවිතයේදී ස්වාභාවිකව රඟපෑම මෙතරම් පහසු ඇයි?

**සැබෑ ජීවිතයේදී ද අපි චරිත බවට පත් වන්නෙමු. එබැවින්, සංසද රංගයේ නළුවන් රංගනය තුළදී පහත සඳහන් ප්‍රශ්න තේරුම් ගැනීම ඉතා වැදගත් ය.**

# නළුවන්ට වැදගත් ප්‍රධාන ප්‍රශ්න

### 1. මම කවුරු ද?

නළුවකු / චරිතයක් සතුව තමන් කවුද, තමන්ගේ ශාරීරික ස්වභාවය කුමක් ද, හැඟීම්, මතකයන්, සමාජ ජීවිතය, පවුල, සිත් වේදනාවන්, අභියෝග, අභිලාෂ ආදිය මොනවා ද යන ප්‍රශ්නයට නිශ්චිත පිළිතුරක් තිබිය යුතු ය. නළුවන්ට මෙම ප්‍රශ්නවලට පිළිතුරු තිබේ ද යන්න පහසුකාරකවරයාට හැම විට ම හැම විටම ඇසිය හැකි ය.

### 3. එය කවදා ද?

ඔබගේ කාලය හා පවතින පසුබිම පිළිබඳ ඔබ දැනුවත් විය යුතු ය. විශේෂයෙන් ම එය කුමන සෘතුව ද, කුමන කාලය ද, දවසේ කුමන වෙලාවක් ද ආදිය ඔබ දැන සිටිය යුතු ය. විවිධ පසුබිම් තුළදී හා විවිධ කාල වකවානුවලදී. නළුවන්ට මෙම ප්‍රශ්නවලට පිළිතුරු තිබේ ද යන්න පහසුකාරකවරයාට හැම විට ම ඇසිය හැකි ය.

### 2. මා සිටින්නේ කොහි ද?

ඔබ පැවත එන්නේ කොහෙන්දැයි ඔබ දැන සිටිය යුතු ය. අප සාමාන්‍යයෙන් හැසිරෙන්නේ වෙනස් අන්දමිනි. ඒ අපගේ පරිසරයට අනුකූලව ය. ඔබ විසින් ඔබගේ පරිසරය සහ එම පරිසරයේ වෙසෙන ජනයා සමග ඔබගේ සම්බන්ධය තහවුරු කර ගත යුතු ය. මෙය ඔබ ඔබව ම නියෝජනය කරන ආකාරයට බලපායි. නළුවන්ට මෙම ප්‍රශ්නවලට පිළිතුරු තිබේ ද යන්න පහසුකාරකවරයාට හැම විට ම ඇසිය හැකි ය.


### 4. මා මේ දැන් ආවේ කොහි සිට ද?


ඔබ නිකම් ම වේදිකාව පිටුපසින් එයට ගොඩවන්නකු නො වන බව ඔබ දනියි. කලින් ජවනිකාවේ මොහො තකට කලින් සිදු වූයේ කුමක්දැයි ඔබට පැහැදිලි දැනුමක් තිබේ. ඔබ මේ දැන් වාදයකට පැටලුණා ද? ඔබ මේ දැන් යෝජනාවකට මුහුණ දුන්නා ද? සැබෑ ජීවිතය ගැන සිතන්න. ඔබ ඔබගේ නිවසට රාත්‍රී කාලයේදී ඇතුළු වන්නේ ද මේ ආකාරයට ම ද? නැත. ඔබ පැමිණෙන්නේ කොහි සිට ද යන්න විසින් ඔබගේ මනෝභාවය හැඩ ගස්වා ඇත.

## ඵලදායී රංගනය

සංසද රංග දැක්වීමේ ප්‍රේක්ෂකයන් ආකර්ෂනය කර ගැනීමෙහි ලා රඟපෑම් ඉතා වැදගත් ය. සංසද රංගයට වෘත්තීය මට්ටමේ රංගනයක් අනවශ්‍ය බවට ඇතැමෙක් තර්ක කරති. රඟපෑමේදී අපගේ හඬ, සිරුර, මනස, එහි නිර්මාණශීලිත්වය සහ හැඟීම් පාලනය කර ගැනීම වැදගත් ය. නළුවකුට සාමාන්‍ය පුද්ගලයකුට වඩා තම ප්‍රේක්ෂකයන් සමග සන්නිවේදනය කිරීමේ හැකියාවක් නළුවකුට තිබිය යුතු ය.

## නිර්දේශ










**හැඟීම පමණක් නො වේ**

හැඟීම් ප්‍රකාශ කෙරෙන්නේ තර්කානුකූලව ය. එබැවින්, ඔබ රඟපාන විට හැම විට ම ඒවා ප්‍රකාශ නො කරන්න. එය ඔබගේ භාවමය චාරිකාවේ කොටසකි.

**මනෝභාවයන් පමණක් නො වේ**

මිනිසුන් සිය හැඟීම් ප්‍රදර්ශනය කරන්නේ ජීවිතයේ තත්වයට හෝ අදාළ අරමුණට අනුකූලව ය. එබැවින් අරමුණු රඟ දැක්වීම අපේක්ෂිත මනෝභාවයන්ට භාවයන්ට මග පෙන්විය හැකි ය. එහෙත්, මනෝභාවයන් පමණක් රඟ දැක්වීම රංගයේ දී දුෂ්කර ය.

**අධි රංගන එපා**

බහුතරයක් ජනයා සිය සැබෑ ජීවිතයේදී අධි රංගනයන් නොකරති. බොහෝ දෙනා අවස්ථාවන්ට මුහුණ දෙන්නේ ස්වාභාවික ප්‍රතිචාරවලිනි. ඔවුන් එම අවස්ථාවලට මුහුණ දුන් විට ඉස්මතු වන්නේ ඔවුන්ගේ ස්වාභාවික පෞරුෂ ලක්ෂණයි. වේදිකාවේදී අව්‍යාජ වන්නට උත්සාහ කරන්න.

**ආත්මාර්ථකාමී නොවන්න**

ඔබ ප්‍රධාන නළුවා වුණත්, සංසද රංග කලාව තනිකර ම ඔබ අරභයා නො වේ. එය තනිකර ම වෙනත් පුද්ගලයකු අරභයා ද නො වේ. රඟ දැක්වීම සැමට අයත් ය. නාට්‍යය තුළ සිය අවස්ථාව රඟ දැක්වීමට හැම කෙනෙකු ම සුදුසු ය.

## 5. මට අවැසි කුමක් ද?

මෙය වැදගත් ප්‍රශ්නයකි. ඔබගේ සිහිනය කුමක් ද යන්න ගැන ඔබ දැන සිටිය යුතු ය. නාට්‍යයෙන් ඔබට අත්පත් කර ගන්නට අවශ්‍ය කුමක් ද යන්න ඔබ දැන සිටිය යුතු ය. ඔබ අරගල කරමින් සිටින්නේ කුමක් වෙනුවෙන් ද යන්න දැන සිටීම ඉතා වැදගත් ය. ඔබ ඔබේ අභිප්‍රාය, ඔබගේ පෙළඹවීම සහ ඔබගේ ක්‍රියාව පිළිබඳ ඔබ දැන සිටිය යුතු ය. හුදෙක් නාට්‍ය ජවනිකාවේ රඟපෑමට පමණක් ඔබ වේදිකාවට නො පැමිණිය යුතු ය. ඔබට දර්ශනය තුළ සිටීම සඳහා හේතුවක් තිබිය යුතු ය.

## 7. මට එය දැන් නො ලැබුණොත් කුමක් වනු ඇද්ද?

ඔබට අවශ්‍ය දෙය නොලැබීමේ ප්‍රතිඵලය ඔබට හැම විට ම වැදගත් ය. ඔබට නාට්‍යයේ තිබෙන අධික අවදානම් පිළිබඳ ඔබට පැහැදිලි නැතිනම්, ඔබ ඒවා සොයා ගත යුතු ය. නොඑසේ නම් එහි විපාකයන් පිළිබඳ ඔබ කරදර නොවී සිටියේදීම ඒවා පැන නගිනු ඇත.

## 6. මට එය දැන් ම අවැසි ඇයි?

ඔබ දැන් කරන්නට යන්නේ කුමක් ද යන්න ඔබ හරියට ම දැන සිටිය යුතු ය. මෙය රංගනයේදී ද, සංසද රංග කලාවේදී ද වැදගත් ය. කලින් හෝ පසුව නොව, මේ දැන් ඔබගේ පෙළඹවීම කුමක් විය යුතුදැයි ඔබට පැහැදිලි දැනුමක් තිබිය යුතු ය.

## 8. මවිසින් අභිභවනය කළ යුත්තේ කුමක් ද?

සංසද රඟ දැක්වීමේ සෑම නළුවෙක් ම අභ්‍යන්තර හා බාහිර බාධාවක් රැගෙන යයි. අභ්‍යන්තර බාධකය ඔබ තුළින් සිදු වන්නකි. බාහිර බාධකය සාමාන්‍යයෙන් වෙනත් චරිතයකින් ඔබේ ක්‍රියාවට එරෙහිව නිර්මාණය වන ප්‍රතිරෝධයකි. ඒ අනුව ඔබ විසින් ජය ගැනීමට උත්සාහ දරන ප්‍රශ්නයක් එහි හැම විටම තිබිය යුතු ය.

# අනවශ්‍ය ඉංගිතීන් (Gestures) පාලනය කර ගැනීම

ශරීරයේ කිසිදු චලනයකින් තොරව, වචන පමණක් කතා කරන්නැයි ඔබගේ නළුවන්ට කියන්න. එසේ කරන්නේ අප අනවශ්‍ය අංග චලනයන් පාලනය කර ගත යුතු බව අවබෝධ කර දෙන්නට ය.

01. නැවතත් කිසියම් දෙයක් සන්නිවේදනය කිරීමට වචන නොව ශාරීරික අංග චලනයන් පමණක් භාවිතා කරන්නැයි නළුවන්ට පවසන්න.
02. ඉරියව් (Posture), අංග චලන හෙවත් ඉංගිතීන් (Gestures), හැඟීම්, චලන සහ හඬ පිළිබඳ ඔවුන්ට සරලව පැහැදිලි කරන්න.
03. එක් වචනයකට විවිධ අරුත් තිබිය හැකි ය.
04. ඔබ අත්, පා, හිස, තොල් සහ අන් ශරීර කොටස් සන්නිවේදනයට යොදා ගන්නා හැටි බලන්න. එබැවින්, වචන සහ හැඟීම් සමග සිය ශරීර සමග ක්‍රියාත්මක වන හැටි අවබෝධ කර ගැනීම නළුවන්ට වැදගත් ය.

- ඔබ මුලින් ම කතා පෙළ කියවා අවබෝධ කර ගත යුතු ය. එය සමස්ත කතාවේ ඔබ රඟපාන්නට යන භූමිකාව පහසුවෙන් තේරුම් ගැනීමට එය ඉවහල් වේ.
- චරිත පිහිටා සිටින පසුබිම දැනගන්න. එමගින් ඔබට නාට්‍යයේ ඔබගේ ස්ථානය සහ වේලාව පිළිබඳ අවබෝධයක් ලැබේ.
- සෑම චරිතයක් සමග ම සම්බන්ධය තේරුම් ගන්න. එවිට ඔබට ඔවුන් සමග නාට්‍යය තුළ කරන්නට තිබෙන්නේ කුමක්දැයි තේරුම් ගැනීම පහසු ය.
- සංවාද තේරුම් ගන්න. ඉහත දක්වන ලද කටයුතු සම්පූර්ණ කළ විට දෙබස් තේරුම් ගැනීම පහසු වේ.
- ඔබගේ ප්‍රජාව තුළ ඔබ රඟන චරිතය කෙතරම් සුවිශේෂදැයි ඔබගේ කණ්ඩායම සමග සාකච්ඡා කරන්න.
- නැවත නැවත රඟපාන්න. එය මතක තබා ගැනීමට වඩා වැදගත් ය.
- වේදිකාවේ මතක සිටින අවස්ථාවක් නිර්මාණය වන පරිදි ඔබගේ චරිතය රසවත් හා ඵලදායී ලෙස ඉදිරිපත් කිරීමේ ක්‍රම ගවේශණය කරන්න.
- ප්‍රේක්ෂකයන්ට සවන් දීමට කාලය යොදවන්න. මන්ද ඔවුන්ගේ මනසේ තිබෙන දෙය ඔබගේ පිටපතේ නො තිබිය හැකි ය. එසේම, ඔබගේ පිටපතේ තිබෙන දෙය ඔවුන්ගේ මනසේ නො තිබීමට ද හැකි බැවිනි.



16 පින්තූරයඃ ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - සිව්වැනි අදියර / වවුනියාව දිස්ත්‍රික්කය / ඡායාරූපයඃ මොහොමදු අස්වර්

# 11

# සංසද රංග මුලපිරුමක් සැලසුම් කිරීම

මෙම කොටසෙහි අප විමසා බලන්නේ සංසද රංග මුලපිරුම්වල සැලසුම් පාර්ශවයයි. ඒ ශ්‍රී ලංකාවේ සහ වෙනත් තැන්වල සාර්ථක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහිදී සාධනීය ලෙස දායක වී ඇති සුභාවිතයන් වෙත අවධානය යොමු කරමිනි. පහත දැක්වෙන්නේ ප්‍රධාන පියවර කීපයකි:

## 1. අවශ්‍යතා තක්සේරුව



අවශ්‍යතා තක්සේරුවක් යනු ව්‍යාපෘති කණ්ඩායමක් විසින් ප්‍රජාවක අවශ්‍යතා පිළිබිඹු කරන නිවැරදි තොරතුරු එකතු කර ගැනීමයි. අවශ්‍යතා තක්සේරුවේදී එකතු කර ගනු ලබන දත්ත, මූලිකව ම ප්‍රශ්න, සිද්ධි හා ප්‍රතිඵල හඳුනා ගැනීමටත්, අරමුණු සකසා ගැනීමටත්, අපේක්ෂිත ව්‍යාපෘති වෙනුවෙන් අභිමතාර්ථ අර්ථකථනය කර ගැනීමටත්, දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති හඳුනා ගැනීමටත්, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නන්ට උපකාරී වනු ඇත.

අවශ්‍යතා තක්සේරුවේ ප්‍රතිඵලයක් ලෙස, ඔබගේ ඉලක්ක ප්‍රජාවේ ජන විකාසය, පසුබිම, ඉතිහාසය, සංස්කෘතික විවිධත්වය, සමාජ හා ආර්ථික තත්වය, ආගමික විශ්වාස ආදිය ගැන ව්‍යාපෘති කණ්ඩායමට පැහැදිලි අවබෝධයක් ලැබේ. ඉලක්ක ප්‍රේක්ෂක ප්‍රජාවේ දැනුම, කුසලතා සහ අභියෝග්‍යතා මට්ටම නිර්ණය කර ගැනීමට අවශ්‍යතා තක්සේරුව ඉවහල් වේ.

පදනම් සමීක්ෂණ, ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා, ලේඛන විමර්ශන, පුද්ගල සම්මුඛ සාකච්ඡා, සෘජු නිරීක්ෂණ, (SWOT ) විශ්ලේෂණ ශක්තිය, දුර්වලතා, අවස්ථා සහ තර්ජන විශ්ලේෂණය (Strengths, Weaknesses, Opportunities, Threats) අවශ්‍යතා නිර්ණය කිරීම සඳහා අවශ්‍ය ය.



**17 පින්තූරය: ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - දෙවැනි අදියර / පුහුණු වැඩමුළුව / ඡායාරූපය: මොහොමදු අස්වර්**

## තොරතුරු රැස් කිරීම

පහත දැක්වෙන්නේ ක්ෂේත්‍රයෙන් තොරතුරු රැස් කර ගැනීම පිළිබඳ වැදගත් කාරණා කිහිපයකි.

ඔබගේ ප්‍රවේශය විනීත හා ගෞරවනීය කර ගන්න. පර්යේෂණයේ අරමුණ පැහැදිලි කරන්න. විශ්වාසය ගොඩනගාගන්න. ඔබගේ ප්‍රජාවේ ගෞරවය දිනා ගන්න. ඔබගේ ව්‍යාපෘතිය විනෝදාත්මක මෙන් ම වැදගත් බව ද ඉදිරිපත් කරන්න.

සක්‍රිය සවන් දීම පුහුණු වන්න. කතා කරන්නා වෙත ඔබගේ අවධානය යොමු කරන්න. ඔබගේ කරුණු රාමුව මත රැඳා සිටීම වෙනුවට ඔබ ඔවුන්ගෙන් ඇසූ දේ නැවත ඔවුන්ට ම වචනගත කර යොමු කිරීම ප්‍රයෝජනවත් ය. ඔවුන්ගේ වචන හෝ කතාව හෝ පමණක් නොව, ඔවුන්ගෙන් ප්‍රකටවන වෙන හැඟීම් ද ඇතුළත් කරන්න.

ඔබගේ ඉරියව් විවෘත විය යුතු අතර ඔවුන් වෙත සහකම්පනීය විය යුතු ය. තීන්දුවක් දීමෙන් හැම විටම වළකින්න. ඔබගේ කාර්යය වන්නේ තොරතුරු එක්රැස් කර ගැනීම මිස ඒවා තක්සේරු කිරීම නො වන බව මතක තබා ගන්න.

ඔවුන් ඔබට ලබා දුන් තොරතුරුවල ගුණය තක්සේරු කිරීම වැදගත් ය. ඔවුන් යම් නරක තත්ත්වයකට සුදු හුණු ගානවාද?

සරල, විවෘත ප්‍රශ්න අසන්න. ඒවායේ පිළිතුරු පැහැදිලි ඔව් හෝ නෑ හෝ යනුවෙන් නො විය යුතු ය. කවුරු ද, කුමක් ද, කෙසේ ද, කොහේ ද, කවදා ද, ඇයි යන ප්‍රශ්න අසන්න. ඇයිදැයි විමසීම හොඳ පසු විපරම් ප්‍රශ්නයකි. ඔබ සෑම දෙයක් ම වැදගත් මන්ද යන්න දන්නේ යයි සිතන්නට එපා. වැදගත්කම විමසීම සඳහා විවෘත මනසක් තිබීම වැදගත් ය.

සටහන් තබා ගන්න. සියලු වැදගත් තොරතුරු සටහන් කර ගන්න. එහෙත්, සටහන් පොතක් නිසා මිනිසුන් අපහසුවට පත් විය හැකි බව ද මතක තබා ගන්න. එබැවින්, සටහන් ගැනීමට ඔවුන්ගේ අවසරය ගන්න. එය හුදෙක් තොරතුරු අරමුණු වෙනුවෙන් පමණක් බව මතක් කරන්න.

ප්‍රදේශබද ජනගහණයේ හරස්කඩක් වෙත ළඟා වෙන්න. ඔබට පාර්ශ්වකරුවන්ගේ විවිධත්වයෙන් යුත් පරාසයක් ග්‍රහණය කර ගැනීමට සිදු වේ. එයට වයස, ස්ත්‍රී පුරුෂ භාවය, රැකියාව, අධ්‍යාපන මට්ටම, සමාජ තත්වය, විශ්වාස ආදිය අයත් වේ.

## 2. තොරතුරු ගොණු කිරීම



මේ වනාහි විවිධ මූලාශ්‍ර ඇසුරෙන් ලබා ගත් තොරතුරු එක් අර්ථවත් ලේඛනයකට ගොණු කර ගැනීමයි. මෙම අදියරේදී පර්යේෂණ ක්‍රියාවලියේ සක්‍රිය ලෙස නිමග්න වූ පිරිස සමග කණ්ඩායම තොරතුරු හුවමාරු කර ගනිමින් සිටිය හැකි ය. දත්ත ගොණු කර ගැනීම සඳහා ඔබට උපකාර විය හැකි **MS excel, SPSS** වැනි විවිධ පරිගණක වැඩසටහන් තිබේ.



**18 පින්තූරයඃ ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - සිව්වැනි අදියර / මන්නාරම් දිස්ත්‍රික්කය / ඡායාරූපයඃ ඇලෙක්සැන්ඩර් කැමිලස්**

## 3. අරමුණු (Objectives) සකස් කර ගැනීම




සංක්ෂිප්ත අරමුණක් සකස් කර ගැනීම ව්‍යාපෘතියේ අභිමතාර්ථය දැන ගැනීමට, මූලෝපායන් නිර්ණය කර ගැනීමට, ක්‍රියාකාරකම්වලට, කාලානුරූපීබවට සහ අවශ්‍ය මූලාශ්‍රවලට ඉතා වැදගත් ය. පරමාර්ථ **(Goals)** මෙන් නොව, අරමුණු වඩා නිශ්චිත වන අතර පහසුවෙන් මිණිය හැකි ය.

**පරමාර්ථ සහ අරමුණු අතර වෙනස:** පරමාර්ථ සහ අරමුණු අතර ප්‍රධාන වෙනස වන්නේ පරමාර්ථය විසින් ගමනාන්තයක් විස්තර කිරීම හා අරමුණ යනු එම ගමනාන්තය වෙත යාමට ළඟා කර ගත යුතු ප්‍රගතිය මිනිය හැකි මෙවලමක් වීමයි. පරමාර්ථය වඩා පුළුල් පර්යායකින් යුක්ත වන අතර දීර්ඝ කාලීන හා ප්‍රතිඵල පාදක වේ. එහෙත් අරමුණ පටු ය. එමගින් අවධානය යොමු වන්නේ කෙටි කාලීන ජයග්‍රහණ වෙතයි.

**පරමාර්ථය #1**
වතු ප්‍රජාව තුළ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ විචාරාත්මක ජනතාවක් නිර්මාණය කිරීම (තීරණාත්මක ජන සංඛ්‍යාවක්)

**අරමුණ #1.1**
වතු ප්‍රජාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ බලපෑම ආමන්ත්‍රණය කළ හැකි මෙවලමක් ලෙස සංසද රංග කලාව භාවිතා කිරීම පිළිබඳ මධ්‍යම පළාතේ තරුණ කලාකරුවන් 25ක් තුළ ධාරිතා ගොඩනැගීම.

**අරමුණ #1.2**
මධ්‍යම පළාතේ වතු ප්‍රජාව අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ බලපෑම ඉස්මතු කරමින් මාස තුනක් ඇතුළත සංසද රංගන දර්ශන 10ක් ඉදිරිපත් කිරීමට තරුණ කලාකරුවන් සූදානම් කිරීම.

**අරමුණ #1.3**
වතු ක්ෂේත්‍රයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ බලපෑම පිළිබඳ සංසද රංග සහ ඒ පිළිබඳ කතිකාවන් 20ක් මාස 12ක් තුළ පැවැත්වීම.

**ශක්තිමත් අරමුණු හැමවිට ම තීරණය කරනුලබන්නේ පහත සඳහන් කරනු ලබන සුවිශේෂ චරිත ලක්ෂණ විසිනි.**

නිශ්චිතභාවය **(Specific)** සංසද රංග වැඩසටහනේ අපේක්ෂිත ප්‍රතිඵලය **(Outcome)** නියම කර ගැනීමේ දී අරමුණු සංයුක්ත, සවිස්තර, ඉලක්කගත හා පැහැදිලිව අර්ථකථනය කරන ලද ඒවා විය යුතු ය.

මිණිය හැකි බව **(Measurable)** ප්‍රමාණාත්මක හා ගුණාත්මක අකාරයන්ගෙන් ප්‍රතිඵල සහ ඒවා සාක්ෂාත් වීම කරා ප්‍රගතිය මැන බැලිය හැකි බවින් මෙම අරමුණු සමන්විත විය යුතුය.

සාක්ෂාත් කළ හැකි බව **(Attainable)** එම අරමුණු, පවතින සම්පත් සහ සාධාරණ ප්‍රමාණයක ප්‍රයත්නයක් මගින් සාක්ෂාත් කළ හැකි විය යුතුය.

අදාලත්වය **(Relevant)** අරමුණු, ප්‍රාදේශීය සන්දර්භයට අදාළ විය යුතුය.


කාලානුබද්ධ බව **(Time-Bound)** සාක්ෂාත් කළ යුත්ත සම්බන්ධයෙන් ආරම්භක සහ අවසාන දිනයක් මෙම අරමුණු විසින් පෙන්විය යුතුය.

## 4. සහභාගිකයන් තෝරා ගැනීම:

අරමුණුවලට අනුකූලව සහභාගිකයන් තෝරා ගැනීම හා පුහුණුකරුවන් ලබා ගැනීම වෙනුවෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පුහුණුව සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගන්න. අවසන් රංගනය ද එහිදී සිදු කළ හැකි ය. වැඩසටහන සඳහා නියම සහභාගිකයන් කැඳවා ගැනීම සඳහා කාර්යක්ෂම හා වියදම් අවම ක්‍රම තිබේ.



**සමාජ මාධ්‍ය භාවිත කරන්න:** මේ සඳහා ෆේස්බුක්, ට්විටර්, ඉන්ස්ටග්‍රෑම්, යූටියුබ් සහ වෙනත් සමාජ මාධ්‍ය ජාල භාවිතා කරමින් ජනයා වෙත කාර්යක්ෂමව ළඟා විය හැකි ය. ඔබට ඔබගේ හවුල්කාර සංවිධානවල සමාජ මාධ්‍ය ජාල හරහා ද එය කර ගත හැකි ය. මේ ගැන උනන්දුවක් දක්වන නිශ්චිත ප්‍රජාවක් වෙත ළඟා වීමට සහ තොරතුරු පෙරහන් කිරීමට ඔබට හැෂ්ටැගයක් (# Hashtag) භාවිතා කළ හැකි ය.



**ඔබගේ ම ජාලයන් භාවිතා කරන්න:** ඔබ සතුව ඔබගේ ම ජාලයන් සහ පසුගිය වැඩසටහන්වලට සහභාගි වූ තරුණයන්ගේ ලැයිස්තු තිබිය හැකි ය. අයදුම්පත් කැඳවීම පිළිබඳ ඔවුන්ට දැනුම් දෙන්න. සංසද රංග කලාව පිළිබඳ උනන්දුවක් දක්වන වෙනත් සංවිධාන සහ ජාලයන් වෙත ළඟා වීමට එය උපකාරී වේ. අවශ්‍ය සහයෝගය ලබා ගැනීමට විධිමත් සන්නිවේදනය උපකාර වනු ඇත.



**ප්‍රාදේශීය බලධාරීන් සම්බන්ධ කර ගන්න:** දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන්, කලා හා සංස්කෘතික දෙපාර්තමේන්තු හා නිලධාරීන්ගෙන් ප්‍රාදේශීය මට්ටමේ සංස්කෘතික නිලධාරීන්ගෙන්, සමෘද්ධි නිලධාරීන්ගෙන්, විදුහල්පතිවරුන්ගෙන් සහ ගුරුවරුන්ගෙන් ඔබට මෙම වැඩසටහන සඳහා නිර්දේශ පුද්ගලයන්ගේ නම් ලබා ගත හැකි ය.




**පුවත්පත් දැන්වීම් සහ ලිපි පල කරන්න:** වැඩසටහන් පිළිබඳව අදාළ පාර්ශව කරුවන් අතර අමතර දැනුවත් කිරීම සඳහා මුද්‍රිත මාධ්‍ය භාවිතා කරමින් ලිපිහෝ දැන්වීම් පළකළ හැකිය.

### තෝරා ගැනීමේ ක්‍රියාවලිය

- සහභාගිකයන් තෝරා ගැනීම සඳහා නිර්ණායකයක් ඔබ සතු විය යුතු ය. ඔබගේ අරමුණ අනුව, ඔබට වයස, ජනවර්ගය, ආගම, අදාළත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය වැනි කාරණා අවශ්‍ය නම් සැලකිල්ලට ගත හැකි ය.
- කිසියම් විශේෂ ප්‍රජාවක් වෙත ළඟා වීම වැදගත්දැයි ඔබ තේරුම් ගත යුතු ය. උදා: ආබාධ සහිත ජනයා, යුද වැන්දඹුවන් සහ වියපත් ප්‍රජාව ව්‍යාපෘතියේ කාල පරාසය තුළ, අවශ්‍ය පරිදි, පුහුණුව, සහ අවශ්‍ය ඕනෑම විටක රඟ දැක්වීම සඳහා සහභාගිකයන්ට එක් කර ගැනීමේ හැකියාව පිළිබඳව ඔබ තේරුම් ගත යුතු ය.
- සහභාගිකයන්ගේ පසුගිය ක්‍රියාකාරිත්වයන් සැලකිල්ලට ගත යුතු ය. ඔවුන් ප්‍රායෝගිකව පවරනු ලබන කාර්යයන් හැසිරවීමේ හැකියාවෙන් යුක්ත ද, ඔප්පු කරන ලද අතීත කාර්යක්ෂමතාවක් තිබේ ද යන්න සැලකිල්ලට ගත හැකි ය.
- තෝරා ගත් සහභාගිකයන් කණ්ඩායම් ලෙස ක්‍රියා කරන්නන් ද යන්න සහ ඔවුන් එකිනෙකා අතර දැනුම බෙදා හදා ගනිමින් වර්ධනය වන්නට කැමති ද යන්න සලකා බැලීම අවශ්‍ය ය.

### ඊළඟ පියවර මොනවා ද?

- ඔබට සහභාගිකයන් පුද්ගලයන් වශයෙන් සම්මුඛ සාකච්ඡාවකට කැඳවිය හැකි ය.
- සහභාගිකයන්ගේ නිපුණතා මට්ටම හඳුනා ගැනීම සඳහා ඔබට කුසලතා පිරික්සුමක් හෝ නිරූපණයක් පැවැත්විය හැකි ය.
- ඔබට අවශ්‍ය සහභාගිකයන් තෝරා ගැනීමෙන් පසු සෑම සහභාගිකයකුට ම වෙන ම ලිපි ගොනුවක් පවත්වා ගැනීම අවශ්‍ය ය. එහි එම පුද්ගලයාගේ පෞද්ගලික විස්තර හා ප්‍රගතිය ගොනු කර තැබිය හැකි ය.
- ඔවුන් වැඩසටහනට තෝරාගෙන ඇති බව නිල වශයෙන් දැනුම් දෙන්න. මෙම ක්‍රියාවලිය තුළ ඔබ ඔවුන්ට පුහුණුවීම් සැලැස්ම, දර්ශන පවත්වන ස්ථාන, දිනය, කාර්ය සම්පාදන වැඩපිළිවෙලවල් සහ නිලධාරීන්ගේ දුරකථන අංක දැනුම් දිය යුතුය.

## 5. යෝග්‍ය පුහුණුකරුවකු තෝරා ගැනීම

විශිෂ්ට පුහුණුකරුවකු තෝරා ගැනීම හා ව්‍යාපෘතිය ආරම්භයේ සිට ම ඔහු / ඇය යොදා ගැනීම අතිශය වැදගත් ය. සහභාගිකයන් සංසද රංග ඉදිරිපත් කිරීම සඳහා පුහුණු කිරීම පුහුණුකරුගේ ප්‍රධාන වගකීමයි. එයට සහභාගිකයන්ට ශක්තිමත් පිටපත් සංවර්ධනය කර ගැනීමට උපකාර කිරීම පෙර පුහුණුවීම් සුපරීක්ෂාව සහ කණ්ඩායම් සඳහා රංගන පුහුණු කිරීම ඇතුළත් වේ. පුහුණුකරුට සහභාගිකයන් පිළිබඳ ගැඹුරු දැනුමක් තිබිය යුතු ය. ඔහුට / ඇයට අවශ්‍යතා තක්සේරුවේ සොයා ගැනීම් පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතු ය. නාට්‍යයෙන් නිරූපිත ප්‍රශ්නයට මුහුණ දෙන ඉලක්ක ප්‍රජාව සහ නාට්‍යයෙන් නිරූපිත ප්‍රශ්න පිළිබඳව ද හොඳ දැනුමක් අවශ්‍ය ය.

### පුහුණුකරුවකු තෝරා ගැනීමේදී සැලකිය යුතු කරුණු කවරේද?

- පැහැදිලි විෂයපථ ලේඛනයක් එයට අපේක්ෂිත ප්‍රමිතීන් සාක්ෂාත් කර ගැනීම සඳහා පැහැදිලි මාර්ගෝපදේශ, කාල පරාසයන් සහ ලබා දිය යුතු සේවා විස්තර සැපයිය යුතු ය.
- ඔහු / ඇය තක්සේරු කිරීමට පෙර ලිඛිත පරීක්ෂණයකට යොමු කිරීම
- ඇතැම් පුහුණුකරුවන්ට සංසද රංග කලාව පිළිබඳ විශිෂ්ට දැනුමක් තිබුණ ද තෝරා ගත් තේමාව ගැන අවබෝධය දුර්වල විය හැකි ය.
- ඔබ විසින් තෝරා ගන්නා ලද තේමාව කෙරෙහි පුහුණුකරු සංවේදී බව තහවුරු කර ගන්න. පුහුණුකරු කලින් පුහුණුවීම් කර තිබෙන ආයතනවලට කතා කර ඔහුගේ / ඇයගේ ප්‍රවේශය තේරුම් ගන්න.




19 පින්තූරය: ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - සිව්වැනි අදියර / මන්නාරම දිස්ත්‍රික්කය / ඡායාරූපය: ඇලෙක්සැන්ඩර් කැමිලස්

# 12
# කාර්ය සම්පාදන අවශ්‍යතා

සාර්ථක සංසද රංගන වැඩසටහනක් සැලසුම් කිරීම සඳහා එය ක්‍රියාත්මක කරන්නන්ට කාර්ය සම්පාදන අවශ්‍යතා පිළිබඳ ගැඹුරු දැනුමක් අවශ්‍ය ය. එයට පුහුණුව හා දර්ශන සඳහා ස්ථාන, නවාතැන්, ආහාර සඳහා සැලසුම්, ප්‍රවාහනය සහ ගෙවීම් ආදිය ඇතුළත් වේ.

## 01. පුහුණු ස්ථානයක පහත දැක්වෙන මූලික ලක්ෂණ අඩංගු විය යුතු ය.

**මූලික අවශ්‍යතා:** ආහාර, සනීපාරක්ෂක පහසුකම්, පුහුණුව සඳහා අවකාශය, උපකරණ (ෆ්ලිප් චාට්, කඩදාසි, පෑන්, අත්පොත්, මල්ටිමීඩියා ආදී)

**ළඟා වීමේ පහසුව:** තෝරා ගත් පුහුණු ස්ථානය පහසුවෙන් ළඟා විය හැකි තැනක් වීමෙන් ගමනාගමනයට ගත වන කාලය හා මහන්සිය ඉතිරි වේ. එය සහභාගිකයන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ ද හිත සුව පිණිස ඉවහල් වනු ඇත. මෙම ක්‍රියාවලිය සති දෙකක් පමණ කල් ගන්නා නිසා ස්ථානය පහසුවෙන් ළඟා විය හැකි දුරකින් පිහිටා තිබිය යුතු ය.

**වටපිටාව:** වැඩසටහනේ විනෝදාත්මක හා ක්‍රියාශීලී ස්වභාවය උත්තේජනය කිරීමට හා පවත්වා ගැනීමට පුහුණු ස්ථානයේ ස්වාභාවික පරිසරය වැදගත් වේ. එය කණ්ඩායම් හැඟීම ඇති කිරීමට අත්‍යවශ්‍ය ය.

## 2. රඟ දැක්වීමේ ස්ථානය:

සංසද රංග දර්ශනය සඳහා ස්ථානයක් තෝරා ගන්නා විට පහත කරුණු සැලකිල්ලට ගත යුතු ය.

- රංගය නැරඹීම සඳහා බාධාවකින් තොරව පොදු ජනයාට පැමිණිය හැකි වීම
- සහභාගි වන ප්‍රේක්ෂකයන් ඕනෑම වේලාවක රඳවා ගැනීම සඳහා ප්‍රමාණවත් ඉඩක් තිබීම
- විවිධ ගමනාගමන මාදිලිවලින් පහසුවෙන් ළඟා විය හැකි වීම

කටහඬ මැනවින් ප්‍රක්ෂේපණය වීමට තුඩු දෙන හොඳ ධ්වනිචාරයක් (Acoustic) හෙවත් හඬ පරිසරයක් පැවතීම. ධ්වනිචාරය නුසුදුසු නම් කල් තබා යෝග්‍ය ශබ්ද විකාශන පද්ධතියක් කුලියට ගැනීම සුදුසුය

*සංසද රංගය විවෘත ස්ථානයක හෝ ක්‍රීඩා පිටියක රඟ දැක්විය යුතු නැත. එය පංති කාමරයක වුව රඟ දැක්විය හැකි ය. කෙසේ වෙතත්, විශාල ප්‍රේක්ෂක පිරිසක් ඉලක්ක කරන්නේ නම්, ඉහත සඳහන් කාරණා සැලකිල්ලට ගත යුතු ය.*




20 පින්තූරයඃ ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - සිව්වැනි අදියර / වවුනියාව දිස්ත්‍රික්කය / ඡායාරූපයඃ ඇලෙක්සැන්ඩර් කැමිලස්

# 13
# කලා කළමනාකරණය

කලා කළමනාකරණය යනු සංසද රංග කණ්ඩායමේ සමස්ත මෙහෙයුම පිළිබඳ සැලකිලිමත් වන ක්ෂේත්‍රයයි. මෙයට ව්‍යාපෘති මෙහෙවර සපුරා ගැනීමේ දෛනික මෙහෙයුම් ඇතුළත් වේ. පහත දැක්වෙන්නේ කලා කලමනාකරණයේ වැදගත් ලක්ෂණ කීපයකි.

**සෞන්දර්යය:**

ව්‍යාපෘතියේ කලාත්මක අංග සැලසුම් කිරීම හා කළමනාකරණය - සංගීත භාණ්ඩ, රංග භාණ්ඩ, රංග වස්ත්‍ර, වේෂ නිරූපණය, පසුතල ආදිය...

**මූල්‍ය:**

මූලික ආදායම් හා වියදම් වැනි අයවැය කටයුතු සැලසුම් කිරීම, දිනපතා සහ සතිපතා ගෙවීම් සහ කණ්ඩායම වෙනුවෙන් පසු ගිණුම් කළමනාකරණය කිරීම.

**මහජන සම්බන්ධතා:**

මෙයට ව්‍යාපෘතිය සහ රංගගත කිරීම පිළිබඳ ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය ඇතුළත් වේ. ප්‍රජා චාරිකා, ප්‍රසිද්ධ නිවේදන, පත්‍රිකා, බැනර්, සමාජ මාධ්‍ය, පුවත්පත් ලිපි ආදිය භාවිතා කළ හැකි ය.

**අරමුදල් එක් රැස් කිරීම හා වාර්තා කිරීම:**

ව්‍යාපෘතියේ සමස්ත පැවැත්මෙහි ප්‍රධාන තීරකයක් වන්නේ අරමුදල් ය. එබැවින්, ආධාර ලබා දෙන්නන් හා අනුග්‍රාහකයන් වෙත පිවිසීම වැදගත් ය. හොඳ සන්නිවේදනයක් සහ විශ්වාසයක් ගොඩනගා ගැනීම මේ සඳහා යතුරයි. එසේම, ව්‍යාපෘතියේ පාරදෘශ්‍යභාවය වාර්තා කිරීම සහ ආධාරකරුවන්ට අවසන් දිනවලට පෙර අවශ්‍ය තොරතුරු දැනුවත් කිරීම මගින් ව්‍යාපෘතිය දිගට පවත්වාගෙන යාම සඳහා වැදගත් වන සාධනීය ප්‍රතිඵල ලබා ගත හැකි ය.

**රංග කණ්ඩායම් සාමාජිකත්වය:**

මෙයට සංසද රංගයේ නළුනිළියන් අයත් වේ. සංසද රංග නාට්‍යය නිෂ්පාදනය කර ඉදිරිපත් කිරීමේ වගකීම ඇත්තේ ඔවුන්ට ය.

## හොඳ ම ස්ථානය සොයා ගැනීමෙන් පසු කළ යුතු දේ



සංසද රංග නාට්‍යය ගැන ප්‍රචාර හා ප්‍රවර්ධනයට මූලිකත්වය දීම වැදගත් ය. පළාත් පාලන ආයතනයට, ප්‍රදේශයේ පොලිසියට, ග්‍රාමසේවා නිලධාරිවරයාට දැනුම් දීම හා පොදු ස්ථානයක රඟ දැක්වීමට කණ්ඩායමට අවසර ලබා ගෙන තිබීමෙන් මහජනතාව සමග වුව ප්‍රශ්නයක් ඇති වුණොත් රඟ දැක්වීම අඛණ්ඩව පවත්වාගෙන යාමට උපකාරී වෙයි.



රංගය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා පෝස්ටර්, කටවුට්, පත්‍රිකා, කෙටි පණිවුඩ, ට්විටර්, සමාජ මාධ්‍ය, පුවත්පත් ලිපි ආදී අදාළ මාධ්‍ය භාවිතා කිරීම වැදගත් ය.



නාට්‍යය පිළිබඳ මහජනයා දැනුවත් කිරීම සඳහා මහජන ඇමතුම් පද්ධතියක් යොදා ගැනීම ඉතා කාර්යක්ෂම ය.



ඇතැම් සංසද කණ්ඩායම් සාමාජිකයන්ට විදුහල්පතිවරුන්, ක්‍රීඩා සමාජ ප්‍රධානීන්, සුබ පතන්නන්. තරුණ ජාලවල නායකයන්, සිවිල් සමාජ සංවිධාන ආදිය වෙත ළඟා විය හැකි අතර මිතුරන් මාර්ගයෙන් ද නාට්‍යය ගැන දැනුම් දිය හැකි ය.

## රඟ දැක්වීම සැලසුම් කිරීම සඳහා රංග කණ්ඩායමේ සාමාජිකයන් සූදානම් කිරීම

නාට්‍ය කණ්ඩායම ලෙස තෝරා ගත් පිරිස සංසද රංග කලා ක්‍රමය පිළිබඳ හුරුපුරුදුබවකින් යුක්ත විය යුතු ය. භූමිකාවක් රඟපෑම, රංග අභ්‍යාස, ක්‍රීඩා සහ සංසද රංග කලාවේ ව්‍යුහය පිළිබඳ දැනුම භාවිතයෙන් චරිතයක් නිරූපණය කිරීම පිණිස අවශ්‍ය වේදිකා කුසලතා සංවර්ධනය කර ගැනීම මෙම ක්‍රමයට ඇතුළත් ය. සහභාගිකයන් තමන්ට වඩාත් සමීප විෂයන් හෝ සමාජ ප්‍රශ්න ඉගෙන ගනිමින් ඒවා සිදුවන මූලික හේතුවලට පිළියම් යෙදීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රායෝගික ක්‍රියාමාර්ග පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගනී. සංගත බව පවත්වා ගනු වස්, පවතින ප්‍රජා ගැටළු සහ ව්‍යාපෘති අරමුණු අතර සම්බන්ධය අවබෝධ කර ගැනීමට කණ්ඩායම යොමු කළ යුතු ය.

**නිෂ්පාදනය සඳහා කණ්ඩායම සූදානම් කරද්දී කළ හැකි ක්‍රියාකාරකම් කීපයක් දෙස බලමු.**



### ක්‍රියාකාරකම 1
### විනෝද පුටු

(මෙය ආරම්භක කණ්ඩායම් ගොඩනැගීමේ ක්‍රියාකාරකමක් ලෙස යොදා ගත හැකි ය.)

**ක්‍රියාවලිය:**
කණ්ඩායම රවුමට වාඩි වී සිටිති. එක් අයෙකු ස්වේච්ඡාවෙන් රවුම මැද සිටගනියි. එම පුද්ගලයා ''සුනාමියක් පැමිණ සියලු දෙනා යට කරනවා,'' කියයි. එයට එම පුද්ගලයා විසින් අනෙකුත් සහභාගිකයන් විසින් පොදුවේ බෙදා හදා ගනු ලබන පෞද්ගලික තොරතුරක් ද එකතු කරනු ලැබේ. උදා: ''ගම්පහ උපන් හැමෝම.''

එම ප්‍රකාශය බෙදා ගන්නා සියලු දෙනා නැගිට වෙනත් පුටුවක් සොයා ගත යුතු ය. ඒ අතර මැද සිටි පුද්ගලයා පුටුවක් අල්ලා ගැනීමට උත්සාහ කරයි.

සහභාගිකයන්ට යෝජිත තේමාවන් පවතින සැබෑ කරුණු (රෙදිපිළි, ආභරණ, කැමති-අකමැති දේ, පවුල, ප්‍රජාව, සිහින, බිය වීම් ආදී) හා තත්වයන් අනුව තෝරා ගත හැකි ය.



### ක්‍රියාකාරකම 2
### ටැංගෝ තුන

(මෙය කණ්ඩායම් ගොඩනැගීමේ ක්‍රියාකාරකමක් ලෙස සහ ක්ෂණික නිර්මාණ කුසලතා ගවේෂණය කිරීමට යොදා ගත හැකි ය.)

**ක්‍රියාවලිය:**
සහභාගිකයන් කුඩා කණ්ඩායම්වලට බෙදනු ලැබේ. ඔවුන් සියලු දෙනා විසින් බෙදා හදා ගනු ලබන පොදු කරුණු තුනක් සොයා ගැනීමට පැවරේ. (පොප් සංගීතය කැමති අය, චිකන් ෆ්‍රයිඩ් රයිස් සඳහා කැමති අය, කොත්තු සඳහා කැමති අය ආදී වශයෙන්)

ඔවුන් මෙම ක්‍රියා තුන සෙසු කණ්ඩායම් ඉදිරියේ රඟ පා පෙන්විය යුතු අතර, සෙසු කණ්ඩායම් එය අනුමාන කළ යුතු ය.




### ක්‍රියාකාරකම 3
### පිළිවැයීම

(මෙම ක්‍රියාකාරකම සහභාගිකයන්ගේ ක්ෂණික නිර්මාණ කිරීමේ කුසලතා වර්ධනය කිරීමට යොදා ගත හැකි ය.)

**ක්‍රියාවලිය:**
සහභාගිකයන් යුගල වශයෙන් බෙදෙති. පහසුකාරකවරයා සෑම සහභාගිකයකුට ම කෙටි කලක් ඇස් වසාගෙන තමන්ට සුවිශේෂ වූ ඇත්තට ම පවතින තැනක් අනුමාන කරන්නට කියයි. ඔහු / ඇය එම ස්ථානය සවිස්තර ව සිතින් මවා ගත යුතු ය. එහි වර්ණ, සුවඳ, හැඩ ආදිය මතක තබා ගත යුතු ය.

ඉන් පසු ඇස් ඇර, සහභාගිකයා සිය හවුල්කරු වැඩමුළු අවකාශය හරහා තමන් කැමතිම එම ස්ථානය කරා චාරිකාවක් රැගෙන යන්නේ විස්තර සහිතව එම ස්ථානය ගැන හඳුන්වා දෙමිනි.

සවන් දෙන සහභාගිකයා අවකාශයේ භාවමය අන්තර්ගතය මෙන් ම හවුල්කරුවා එය විස්තර කරන ආකාරය ද යළි රඟපා පෙන්වයි.




**21 පින්තූරය: ශ්‍රී ලංකා සංසද නාට්‍ය වැඩසටහන - සිව්වැනි අදියර / වවුනියාව දිස්ත්‍රික්කය / ඡායාරූපය: මොහොමදු අස්වර්**

*සංසද රංගන ව්‍යාපෘති තක්සේරු කිරීම සඳහා ඇත්තේ එක් පිළිගත් ක්‍රමයක් පමණක් නො වේ. සමස්ත ස්වභාවය, අරමුණ සහ ව්‍යාපෘතියේ දිග අනුව යමෙකුට සංසද රංගන වැඩසටහන තක්සේරු කිරීම සඳහා සම්පූර්ණයෙන් ම අලුත් ප්‍රවේශයක් අවශ්‍ය විය හැකියි.*

# 14

# අධීක්ෂණය සහ ඇගයීම
## (Monitoring and Evaluation)

අධීක්ෂණය සහ ඇගයීම ඕනෑම සංසද රංගන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ කේන්ද්‍රීය මූලිකාංග යන්ගෙන් එකකි. ඇතැමෙකු විශ්වාස කරන පරිදි මෙය ව්‍යාපෘතියේ අවසන් කොටසයි. එය ව්‍යාපෘතිය අවසානයේ සාර්ථකත්වය තීරණය කිරීමට උපකාරී වේ. කෙසේ වෙතත්, අධීක්ෂණය සහ ඇගයීම සමස්ත ක්‍රියාවලියේ ම අභ්‍යන්තර කොටසකි.

### 1. අධීක්ෂණය යනු කුමක්ද?

අධීක්ෂණය යනු ව්‍යාපෘතියේ තොරතුරු ක්‍රමානුකූලව එක්රැස් කිරීම, විශ්ලේෂණය සහ භාවිතා කිරීමයි. එයින් ඉගෙන ගන්නා පාඩම් අනාගත භාවිතාවන් සහ ක්‍රියාකාරකම් සඳහා ප්‍රයෝජනවත් වේ. භාවිතා කරනු ලබන සම්පත් පිළිබඳ  අභ්‍යන්තර හා බාහිර වගවීම සහ අත්විඳින ලද ප්‍රතිඵල එමගින් විමසා බලනු ලැබේ. එයින් අනාගත නිෂ්පාදන පිළිබඳ ගණනය කරන ලද තීරණ ගත හැකි ය. සහභාගිකයන් හෝ කණ්ඩායමේ සාමාජිකයන් වැඩිදුර වර්ධනය සඳහා බලසතු කළ හැකි ය.

### 2. ඇගයීම යනු කුමක්ද?

ඇගයීම යනු සම්පූර්ණ කරන ලද සංසද රංග ව්‍යාපෘතියක් හැකි තරම් විධිමත් හා විෂයමූලික ලෙස තක්සේරු කිරීමයි. ඇගයීම විසින් දත්ත සහ තොරතුරු විවරණය කරයි. එම දත්ත හා තොරතුරු අනාගත සංසද රංග නිෂ්පාදන සම්පාදනය කිරීමේදී එය වැඩිදියුණු කර ගැනීම සඳහා මූලෝපායන් පිළිබඳ තොරතුරු සපයයි. පරමාදර්ශී ලෙස සැලකුවහොත්, ඇගයීම විසින් පහත සඳහන් මූලික කරුණු අවසානයේදී දිරි ගැන්විය යුතු ය.

- **අදාළබව**
- **සඵලතාව**
- **කාර්යක්ෂමතාව**
- **ප්‍රතිඵලය**
- **තිරසරභාවය**

### 3. ව්‍යාපෘතියක් අගයන්නේ කෙසේද?

ඕනෑ ම ව්‍යාපෘතියක් තිරසාරව පවත්වා ගත හැකි තාර්කික ක්‍රමය වන්නේ නිරන්තරයෙන් ම එහි සමස්ත සඵලතාව වර්ධනය කිරීම සඳහා ප්‍රවේශයන් සොයා ගැනීමයි. එබැවින්, සංසද රංග නිෂ්පාදන අධීක්ෂණය හා ඇගයීම මුලපිරීම සඳහා පහත සඳහන් පියවර නිර්දේශ කරනු ලැබේ.

**පදනම් සමීක්ෂණය:** මෙමගින් රංගයට පෙර ප්‍රේක්ෂකයන්ගේ මානසික තත්වය පිළිබඳ සාකල්‍ය දැක්මක් ලබා ගනු ලැබේ. පරිස්සමෙන් ප්‍රශ්නාවලියකට පිළිතුරු ලබා ගැනීමෙන් හෝ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක් මගින් තොරතුරු එක්රැස් කර ගත හැකි ය.

**පශ්චාත් රංග ඇගයීම:** මෙමගින් රංග දර්ශනයෙන් පසුව ප්‍රතිඵල / බලපෑම අධ්‍යයනය කරනු ලැබේ. එබැවින් අව්‍යාජ ප්‍රතිපෝෂණයක් ලබා ගත යුතු ය. මුලින් ම, රංගයෙන් පසු සම්මුඛ සාකච්ඡා හෝ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා ලේඛනගත කළ හැකි ය. එයට පසුව තවත් ඇගයීමක් සිදු කෙරේ. එය සැලසුම් කරනු ලබන්නේ රංගයෙන් මාස දෙක තුනකට පසුවයි. එහි අරමුණ දිගු කාලීන බලපෑම අධ්‍යයනය කිරීමයි.

**ඇගයීමේ අරමුණු උදෙසා පහත සඳහන් මෙවලම් භාවිතා කළ හැකි ය.**

- ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා
- ප්‍රමුඛ තොරතුරු සපයන්නන්ගේ සම්මුඛ සාකච්ඡා
- ප්‍රශ්නාවලි (කඩදාසි හෝ අන්තර්ජාල)
- සම්මුඛ සාකච්ඡා හරහා අභ්‍යන්තර ඇගයීම
- නිරීක්ෂණ
- සහභාගිත්ව වීඩියෝ

## List of References


Boal, A. (1995) *The Rainbow of Desire.* London: Routledge.
Boal, A. (1998) Translated by Adrian Jackson. *Legislative Theatre: Using Theatre to Make Politics.* UK: Routledge.
Boal, A. (2001) Translated by Adrian Jackson and Candida Blaker. *Hamlet and the Baker's Son: My Life in Theatre and Politics.* UK: Routledge.
Boal, A. (2006b) Translated by Adrian Jackson. *The Aesthetics of the Oppressed.* UK: Routledge.
Boal, A. (2008) *The Theatre of the Oppressed.* London: Pluto Press.
Fanon, F. (1967) Black Skin White Masks. New York: Grove Press.
Freire, P. (1972) Pedagogy of the Oppressed. Penguin.
Kershaw, B. (1992) *The Politics of Performance.* London and New York: Routledge.
Liyanage, S. (2016) Meditations on Acting: Theory Practice and Performance, d E v publishing. Mount Lavinia.
Midha, G. (2010) Theatre of the Oppressed a Manual for Educators, University of Massachusetts, Amherst.
Osburn, K. M. (2010) "Forum Theatre Empowering Students to Speak, Act, and Know"
Paterson, D. (2018) Pedagogy and theatre of Oppressed www.ptoweb.org (Accessed)
Robinson A. (2016) www.ceasefiremagazine.co.uk/augus to-boal-brecht-boal-method/(Accessed)
Taite, J. Introducing Forum Theatre as tool to explore issues of equality and discrimination, National Association for Youth Drama (NAYD).
http://tdd.org.ua/en/declaration-principles-theatre-oppressed (Accessed: February 2018)
http://www.uq.edu.au/ccsc/augusto-boal-1931-2009

සංසද රංගය පිළිබඳ මෙම අත්පොත, බ්‍රසීල ජාතික රංග අධ්‍යක්ෂ ඔගස්ටෝ බොආල්ගේ සංසද රංග කලාව ඇසුරින් බිහි වූවකි. බොආල්, රංගන ක්‍රියාවලිය තුළ ප්‍රේක්ෂකයා ප්‍රේක්ෂක-නළුවකු බවට පත් කිරීමට සමත් වූ රංග කලාවේදියකු මෙන්ම න්‍යායධරයකු වූ අතර,  කොන්ස්ටන්ටින් ස්ටනිලවුස්කි සහ විශේෂයෙන්ම ජර්මානු රංග අධ්‍යක්ෂවරයකු වූ බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් වෙතින් ඔහු ආභාසය ලැබීය. එමෙන්ම, බොආල්ගේ රංග ප්‍රවේශයන්, ප්‍රසිද්ධ බ්‍රසීලියානු අධ්‍යාපනඥයකු වූ පාවුලෝ ෆ්රෙයරිගේ විප්ලවකාරී අධ්‍යාපන න්‍යායන්ගේ ද ආභාසය ලබා තිබේ.

මෙම ඉගෙනුම් අත්පොත වැඩිදියුණු කරන ලද්දේ ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍ය සංසදය විසින්, ජාතික ඒකාබද්ධතා, සංවාද සහ රාජ්‍ය භාෂා අමාත්‍යංශය සමඟ එක්ව මෙහෙයවන ලද වැඩමුළු මාලාවක් ඇසුරිනි. උතුරු, මධ්‍යම, දකුණු, නැගෙනහිර සහ බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ද සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය ද, යාපනය විශ්වවිද්‍යාලය ද ඒ සමග අත්වැල් බැඳ ගත්හ. මෙම වැඩසටහනට අරමුදල් සම්පාදනය කරනු ලැබුවේ කොළඹ එක්සත් ජනපද තානාපති කාර්යාලය විසිනි.

පශ්චාත් යුධ ශ්‍රී ලංකාව තුළ පෙන්වන ලද සංසද නාට්‍ය මාලාවක් පිළිබඳව මෙන්ම ශක්තිමත් සාමය ගොඩ නඟන්නන් බවට තරුණ පරපුර පත් කිරීම තුළින් එකී නාට්‍ය සමාජ ඒකාබධතාව, අවිහිංසාව සහ බහුවිධ වටිනාකම් ප්‍රවර්ධනය සඳහා උපයෝගී කර ගත හැක්කේ කෙසේ ද යන්න මෙම අත්පොත තුළින් විදහා දක්වනු ලැබේ.

සංසද නාට්‍ය ඉගෙනුම් අත් පොත ස්වකීය ප්‍රජාව තුළ සහ ඉන් පිටත යහපත් වෙනසක් අපේක්ෂාවෙන් වැඩ කරන ගුරුවරුන් ප්‍රජා ක්‍රියාකාරීන් අධ්‍යාපනඥයන් සහ සිසුන්ට ඉමහත් ලෙස ප්‍රයෝජනවත් වනු ඇත.

**ආචාර්ය සෞම්‍ය ලියනගේ**
පීඨාධිපති, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.


STRATEGIC PARTNERS

Ministry of National Co-existence Dialogue and Official Languages

Minister of Education, Cultural Affairs, Sports and Youth Affairs, Northern Province and Provincial Department of Education, Northern Province

University of Jaffna

University of Visual and Performing Arts

SUPPORTED BY

U. S. Embassy in Sri Lanka

High Commission of Canada in Sri lanka

Neelan Tiruchelvam Trust

IMPLEMENTED BY

Sri Lanka Development Journalist Forum

9 789557 765105